HDTS

## සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමූපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය

(බෝට් හවුස්)

# 61 වන

# සංවත්සර මහසභා රැස්වීම

**2026**

**03 | 28**

**පෙ.ව. 9.00 ට**

මහනුවර, පොල්ගොල්ල,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ
මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගාරය
ඇතුළු එම පරිශ්‍රයේදී පැවැත්වේ.

රැස්වීම් ශාලාවට ඇතුළුවීම සඳහා ඔබගේ
**සාමාජික පාස්පොත හා වලංගු හැඳුනුම්පත**
අනිවාර්යෙන් රැගෙන ආයුතු බව කාරුණිකව සලකන්න

ලිපිනය : 37/36, පන්සල පාර, කොළඹ 10.
දුරකථන : 011-2685016 / 011-2676088 / 011-2676099 / 011-2662870 ෆැක්ස් : 011-2678163
විද්‍යුත් ලිපිනය : sechdts@gmail.com වෙබ් පිටුව : www.hdts.lk

සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය
37/36, පන්සල පාර, කොළඹ 10.

# 61 වන සංවත්සර මහසභා රැස්වීම
# 2026.03.28

**න්‍යාය පත්‍රය**
**ආරම්භක වේලාව - පෙ:ව: 9.00**

---

01. චාරිත්‍රානුකූලව මංගල ප්‍රදීපය දැල්වීම.

02. වියෝවූ සාමාජිකයින් සිහි කිරීම.

03. සමුපකාර ගීතය වාදනය කිරීම.

04. සභාව පිළිගැනීම.

05. රැස්වීම කැඳවීමේ නිවේදනය කියවීම.

06. නව සාමාජිකයින් බඳවා ගැනීම අනුමත කිරීම.

07. ප්‍රධාන නිලධාරින් ඇතුළුව නව කාරක සභාවක් (අධ්‍යක්ෂක මණ්ඩලයක්) තෝරා පත් කර ගැනීම සඳහා නිලවරණය පැවැත්වීම.

08. i. 60 වන මහසභා රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කිරීම.

    ii. 61 වන පාලන වාර්තාව ඉදිරිපත් කිරීම.

09. 2023 වර්ෂයේ විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

10. අයවැය ඇස්තමේන්තුව හා සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීම - 2027 සහ 2028

11. යෝජනා ඉදිරිපත් කිරීම.

    i. කාරකසභා (අධ්‍යක්ෂක මණ්ඩල) යෝජනා (අතුරු ව්‍යවස්ථා වගන්ති අංක 20 ඉ හා 14 සංශෝධනයන් ඇතුළුව)

    ii. පුද්ගල යෝජනා

12. ආරාධිත අමුත්තන්ගේ සුභ පැතුම්.

13. ස්තුති කතාව.

14. දිවා ආහාරය.

15. සමාප්තිය.

## සමුපකාර ගීතය........

මහජන දියුණුව සැලසෙන්නේ
පදනම සහයෝගය වෙමිනේ
සමගි බලේ, සමගි බලේ,
සමගි බලේ, යොදවමිනේ
සිරිලක නිදහස රැක දෙන්නේ

ජය වේවා - සිරි දේවා //
සමුපකාරය පැතිරේවා

තම තමනට දෙන ආධාරේ
විලස ගැනේ සම උපකාරේ
දිළිඳු දනා - දිළිඳු දනා
දිළිඳු දනා - පෙළ අතරේ
සේවය වෙයි සිරිලක් අඹරේ

ජය වේවා - සිරි දේවා....

සියරට ගොඩ මඩ ගොවිතැනෙහි
වෙළහෙළඳාමෙහි අත්කමෙහි
දියුණුවටා, දියුණුවටා
දියුණුවටා, මතු දිනෙහී
පිහිටය සමුපකාරයෙනි

ජය වේවා - සිරි දේවා....

ජාතික ධනයද සුදුසු ලෙසේ
පොදු ජනයා හට බෙදන ලෙසේ
සමවාසී, සමවාසී
සමවාසී ලැබෙන ලෙසේ
සමුපකාරෙන් ඉඩ සැලසේ

ජය වේවා - සිරි දේවා...//

**සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය**
**අංක 37/36,පන්සල පාර,කොළඹ 10.**

---

## නාමයෝජනා හා රැස්වීම කැඳවීමේ නිවේදනය

සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ 61 වන සංවත්සර මහ සභාව හා නිලවරණය 2026.03.28 වන දින පෙ.ව. 9.00 ට මහනුවර, පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගාරය ඇතුළු එම පරිශ්‍රයේදී පැවැත්වේ. ඔබගේ පුද්ගල යෝජනා වෙතොත් 2026.03.04 වන දින දහවල් 12.00 ට පෙර මා වෙත ලැබීමට කටයුතු කල යුතු වේ.

එමෙන්ම සමිතියේ 2026.03.29 දින සිට ඉදිරි තුන් වර්ෂයක (03) කාලය සඳහා කාරක සභාවට (අධ්‍යක්ෂ මණ්ඩලයට) සභාපති, උපසභාපති, භාණ්ඩාගාරික සහ කාරක සභික (අධ්‍යක්ෂ මණ්ඩල) සාමාජිකයින් විසිදෙදෙනෙකු (22) ඇතුළුව සාමාජිකයින් විසිපස් දෙනෙකු (25) තෝරාපත් කර ගැනීම සඳහා නාමයෝජනා භාරගැනීම සහ විරෝධතා භාරගැනීම පහත පරිදි සිදු කරන බව සමිතියේ සාමාජිකත්වය වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

**නාමයෝජනා භාරගන්නා දිනය**

2026.03.05 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා

**විරෝධතා භාරගැනීම**

2026.03.06 වන දින පෙ.ව. 9.00 සිට පෙ.ව.10.00 දක්වා

**නාමයෝජනා සහ විරෝධතා භාර ගන්නා ස්ථානය**

සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය. 37/36, පන්සල පාර, කොළඹ 10. (සිව්වන මහලේ රැස්වීම් ශාලාවේදී)

- නාමයෝජනා පත්‍ර කට්ටල අපේක්ෂක, යෝජනාකරු හෝ ස්ථිරකරු යන අයවලුන් විසින් හෝ ඉන් එක් අයෙකු විසින් පමණක් නියමිත දින, නාමයෝජනා භාරගැනීම අවසන් කිරීමේ වේලාවට පෙර සමිතියේ ලේකම් වෙත භාරදිය යුතුය.
- පිළිගත් අපේක්ෂකයන්ගේ නාම ලේඛනය සමිති කාර්යාලයේදී 2026.03.06 වන දින පෙ.ව. 11.00 සිට දහවල් 12.00 දක්වා ප්‍රදර්ශනය කෙරේ. (සිව්වන මහලේ රැස්වීම් ශාලාව ඉදිරිපිටදී)
- මේ සමඟ දක්වා ඇති ආදර්ශයට අනුව සකසා ගත් නාමයෝජනා පත්‍රයක් මඟින් (කට්ටල දෙකකින් යුතුව) තම නාමයෝජනාව ඉදිරිපත් කල යුතුය.
- මෙම ආදර්ශයට වෙනස් ආකාරයට ඉදිරිපත් කරනු ලබන හා අසම්පූර්ණ නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- යම් සාමාජිකයෙකුට අවශ්‍ය වන්නේ නම් සමිතියේ ලේකම් වෙතින් නාමයෝජනා පත්‍ර කට්ටලය ලබාගත හැකිය.
- ඡන්දාපේක්ෂක, නාමයෝජනාකරු හා ස්ථිරකරු ඡන්ද හිමි සාමාජිකයකු විය යුතුවේ.
- අපේක්ෂකයන් සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ 38(1) වගන්තියේ ඇතුලත් නුසුදුසුකම් වලින් නොපෙළෙන අයවලුන් විය යුතුය.
- නාම යෝජනාවක් සම්බන්ධව විරෝධතාවයන් ඉදිරිපත් කරන්නේ නම් එය ලිඛිතව ඉදිරිපත් කල යුතුය.

ඉහත සඳහන් තනතුරු සඳහා නියමිත ප්‍රමාණයට වඩා සුදුසුකම්ලත් නාමයෝජනා ඉදිරිපත් වුවහොත් අදාල තනතුරු සඳහා සුදුස්සන් තෝරා පත් කර ගැනීමේ නිලවරණය,

2026.03.28 වන දින පෙ.ව.9.30 සිට ප.ව.4.00 දක්වා කාලය තුල මහනුවර, පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගාරය ඇතුළු එම පරිශ්‍රයේදී පැවැත්වෙන බවද මෙයින් දැනුම් දෙමි.

නිලවරණය පැවැත්වීමට සිදු වුවහොත් ඡන්ද හිමි සාමාජිකයන්ට තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත සහ සාමාජිකත්වය තහවුරු කිරීම සඳහා සාමාජික පාස්පොත හෝ පිළිගත් තහවුරු ලේඛනයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ලේකම්
සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය
37/36, පන්සල පාර, කොළඹ 10
2026.02.19 දිනදීය.

(සෑම තනතුරක් සඳහාම වෙන වෙනම නාමයෝජනා පත්‍ර කටට්ල දෙක බැගින් ඉදිරිපත් කළ යුතුය)

*** සාමාජික ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු ගුවන් ගමන් බලපත්‍රය හෝ වලංගු රාජකාරී හැඳුනුම් පත පමණක් ඉදිරිපත් කල හැකි බව කාරුණිකව සලකන්න.**

## 60 වන මහසභා රැස්වීම 2025/06/21

සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ 60 වන මහසභා රැස්වීම 2025.06.21 වන දින පෙ.ව.9.00 ට කොළඹ 13, ආතර් ද සිල්වා මාවත, අංක 2211 හි සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගන පරිශ්‍රයේ දී සමිතියේ ගරු සභාපති ටී.පී. බන්දුල ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. ඒ අනුව මෙම 60 වන මහසභා රැස්වීම සඳහා විවිධ ප්‍රදේශයන්ගෙන් සාමාජික මහත්ම මහත්මීන් 1416 දෙනෙකු සහභාගී විය.

### 01 චාරිත්‍රානුකූලව මංගල ප්‍රදීපය දැල්වීම

සමිතියේ 60 වන මහසභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමින් චාරිත්‍රානුකූලව මංගල ප්‍රදීපය දැල්වීම සඳහා සමිතියේ ගරු සභාපති ටී.පී. බන්දුල ජයකොඩි මහතාටත්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් මෙහි පැමිණ සිටින සමිති සම්බන්ධිකරණ නිලධාරී ඩී.ඒ.එස්. සේනාධීර මහතාට, විගණක නිලධාරීන් වන ඒ.සී.බී. ජයංගා මහත්මියට හා එම්.ඩී.පී. තමාලි මහත්මියට ගෞරවයෙන් ආරාධනා කරන ලදී. එමෙන්ම මෙම අවස්ථාව හා එක්වීමට සමිතියේ ගරු උප සභාපති පී.ඒ. ප්‍රියන්ත කිත්සිරි මහතාටත්, ගරු භාණ්ඩාගාරික ටී.පී. කුමුදුනි ද සිල්වා මහත්මියටත් ආරාධනය කරන ලද අතර ජාතික සමුපකාර මණ්ඩලයේ හිටපු අධ්‍යාපන හා පුහුණු නිලධාරී ඒ.බී. බුලත්ගම මහතා අධ්‍යක්ෂක මණ්ඩලය නියෝජනය කරමින් මහතෙකු හෝ මහත්මියක්ට ද සමිතියේ හිටපු සභාපති ඊ. පාලිත මහතා, හිටපු උප සභාපතිවරුන් වන ආර්.පී. තුංගසේන මහතා හා ඩබ්ලිව්.ඒ. වීරසේකර මහතා, හිටපු භාණ්ඩාගාරික ඒ.ඒ. සෝමසිරි යන මහත්වරුන්ද හිටපු පරිපාලන නිලධාරී පී.ජී. චන්ද්‍රසේන මහතා, ඩී.එම්.එස්. ආයතනය නියෝජනය කරමින් සුසිත් අනුරංග මහතා ද එක්වන ලදී. එසේම ක්‍රියාකාරී සංවිධායක මහතෙකු හෝ මහත්මියක්ද, සමස්ත සාමාජිකත්වය නියෝජනය කරමින් සාමාජික මහතෙකු හෝ මහත්මියක්ද, කාර්ය මණ්ඩලය නියෝජනය කරමින් සමිතියේ සාමාන්‍යාධිකාරී මහතා හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) මහත්මිය ද මෙම අවස්ථාව සඳහා එක්වන ලදී.

ඉන් අනතුරුව ලේකම් මහතා විසින් 60 වන මහසභා රැස්වීමේ මූලාසනය සඳහා ගරු සභාපති ටී.ජී. බන්දුල ජයකොඩි මහතාටත් ගරු උප සභාපති පී.ඒ. ප්‍රියන්ත කිත්සිරි පෙරේරා මහතාටත් ගරු භාණ්ඩාගාරික ටී. ප්‍රියංකා කුමුදුනි මහත්මිය වෙතත් ගෞරවයෙන් ආරාධනා කළේය. එමෙන්ම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමිති සම්බන්ධිකරණ නිලධාරී ඩී.ඒ.එස්. සේනාධීර මහතාටත් 2022 වර්ෂයේ විගණක නිලධාරීන් වන ඒ.සී.බී. ජයංගා මහත්මියටත්, එම්.ඩී.පී. තමාලි මහත්මියටත්, සමිතියේ සාමාන්‍යාධිකාරී මහතාටත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) මහත්මියට ද වේදිකාවේ අසුන් ගැනීමට ලේකම් මහතා විසින් ආරාධනා කරන ලදී.

### 02 වියෝවූ සාමාජිකත්වය සිහිපත් කිරීම

වසර 87 ක කාලයකට හිමිකම් කියන මෙම සමිතියේ අභිවෘද්ධිය වෙනුවෙන් තම ශ්‍රමය ලේ දහඩිය කැපකල එම අභීත ක්‍රියාදරයින් කිසිදා අමතක කල නොහැකි බවත් එම අය සිහිපත් කරමින් කළගුණ දැක්වීම කළයුතු බවත් ප්‍රකාශ කල ලේකම් මහතා මෙම කාලය තුල අප අතරින් සමුගත් සියලුම සාමාජිකත්වය හා ඔවුන්ගේ මියගිය යැපෙන්නන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්ම මහත්මීන්, සමිතියේ නිලධාරී මහත්ම මහත්මීන් හා කාර්ය මණ්ඩල මහත්ම මහත්මීන් සිහිපත් කරමින් විනාඩියක නිශ්ශබ්දතාවයක් පැවැත්වීමට අවස්ථාව සලසන ලදී. ඒ අනුව සියලු දෙනා තම අසුනින් නැගී සිට විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වා මිය ගිය එම ක්‍රියාදරයින් වෙනුවෙන් තම ගෞරවනීය ආචාරය පිරිනමන ලදී.

### 03 සමුපකාර ගීතය වාදනය කිරීම

ගරු මහසභාවේ සියලුම මහත්ම මහත්මීන් නැගී සිටිමින් සමුපකාර ව්‍යාපාරයට තම උත්තමාචාරය පුද කළහ.

### 04 සභාව පිළිගැනීම

අද දින මෙම 60 වන මහසභා රැස්වීම සඳහා සහභාගී වීමට දිවයිනේ නන් දෙසින් පැමිණ සිටින සියලුම සාමාජික මහත්ම මහත්මීන්ද, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්ම මහත්මීන්ද, ප්‍රධාන නිලධාරී මහත්ම මහත්මීන්ද ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයද අනෙකුත් ආරාධිත මහත්ම මහත්මීන් හා කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ද ගරු සභාපති ටී.ජී. බන්දුල ජයකොඩි මහතා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

### 05 රැස්වීම කැඳවීමේ නිවේදනය කියවීම

ගරු සභාපති ටී.ජී. බන්දුල ජයකොඩි මහතාගේ ආරාධනයෙන් ලේකම් මහතා විසින් 60 වන මහසභා රැස්වීමේ නිවේදනය සභාගත කරන ලදී. මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කල ලේකම් මහතා 2025.05.23 දින දිනමිණ, ඩේලි නිවුස් හා තිනකරන් යන පුවත්පත්හි මෙම රැස්වීම කැඳවීමේ නිවේදනය ත්‍රිත්ව භාෂා මාධ්‍යයෙන් පල කල බවත් එම දැන්වීම 60 වන මහසභා වාර්තා පොතේ පිටු අංක 01 හි සඳහන් වන බවත් පෙන්වා දෙන ලදී. අතුරු ව්‍යවස්ථාවේ

වගන්ති ප්‍රකාරව නීත්‍යානුකූලව මෙම 60 වන මහසභාව කැඳවා ඇති බවද ලේකම් මහතා විසින් මෙහිදී ගරු මහසභාව වෙත ප්‍රකාශ කරන ලදී. ඒ අනුව 60 වන මහසභා රැස්වීමේ සියලු කාර්යයන් නීත්‍යානුකූලව සිදුකර ඇති බැවින් මෙම රැස්වීම කැඳවීම නීත්‍යානුකූල වන බව මහියංගනය මූලික රෝහලේ සේවයේ නියුතු ආර්.එම්.ටී.ටී. නවරත්න මහතාගේ හා පේදුරුතුඩුව මූලික රෝහලේ සේවයේ නියුතු ආර්. මුහුන්දන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව ගරු මහසභාවේ සියලු දෙනා අත්පොළොසන් දී සභාසම්මත කළහ.

ඉන් අනතුරුව 60 වන මහසභා රැස්වීම වෙනුවෙන් මූලික වාර්තා පොතේ ඇති පහත සඳහන් මුද්‍රණ දෝෂ නිවැරදි කිරීම ලේකම් මහතා විසින් සිදුකරන ලදී. ඒ අනුව මෙම නිවැරදි කිරීම් වලට යටත්ව මහසභාවේ ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු වන බවට වවුනියා මහ රෝහලේ සේවයේ නියුතු ජවාස් මහතා හා චෙට්ටිකුලම් දිසා රෝහලේ සේවයේ නියුතු ෆ්‍රැන්සිස් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කලහ.

## 60 වන මහසභා රැස්වීමේ වාර්තා පොතේ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීම - ශෝධ පත්‍රය

**පිටු අංක** : 57 - 58

2025 සහ 2026 වර්ෂ සඳහා වන අයවැය ඇස්තමේන්තුවේ ආයෝජන හා වත්කම් අත්පත් කර ගැනීමේ උප ශීර්ෂ යටතේ සඳහන් "47 ඉඩමෙහි නව සය මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යන්න 47 ඉඩමේ නව දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා" යනුවෙන් නිවැරදි විය යුතුය.

**පිටු අංක** : 62

වගන්ති අංක 4 හි "උපරිම රු. 25,000/- ක මුදලක් 6% ක් වූ වාර්ෂික සහනදායී පොලී ප්‍රතිශතයක් මත සරල වාරික ක්‍රමයට උපරිම වාරික 12 කින් ගෙවා අවසන් කල යුතු වේ" යන්න නිවැරදි විය යුතුය.

**පිටු අංක** : 62

යෝජනා අංක 16 හි වගන්ති අංක 08 හි රෝම ඉලක්කම් i,iii,iv,v,vi,vii ලෙස සඳහන් වීම පිළිවෙලින් "i,ii,iii,iv,v,vi,vii" ලෙස නිවැරදි විය යුතුය.

**පිටු අංක** : 64

යෝජනා අංක 28 හි වෙන් කිරීම් වලින් පසු ඉතිරි ලාභය "රුපියල් 824,786.12" යන්න "රුපියල් 824,786.11" ලෙස නිවැරදි විය යුතුය.

<u>60 වන මහසභා රැස්වීමේ දමිළ භාෂා වාර්තා පොතේ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීම</u>

**පිටු අංක** : 35

4 වන කොටු සලකුණෙහි සඳහන් "සාමාජික ණය අය නොවීම පිළිබඳව නෛතික ක්‍රියා මාර්ග නොගැනීම" යන්න "නෛතික ක්‍රියා මාර්ග ගැනීම" යනුවෙන් නිවැරදි විය යුතුය.

**පිටු අංක** : 35

6 වන කොටු සලකුණෙහි සඳහන් "සාමාජික ලෙජර් අංකය 62/127" යන්න "162/127" ලෙස නිවැරදි විය යුතුය.

**පිටු අංක** : 37

3 වන කොටු සලකුණෙහි සඳහන් "එම නිසා පළමුව ලෙජර් ලිපිකරුවන්ට මෙම කාර්යය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දීම සිදු නොකල යුතු වේ" යන්න "නිවැරදි අවබෝධයක් ලබා දීම සිදු කල යුතුය" ලෙස නිවැරදි විය යුතුය.

**පිටු අංක** : 48

ණය වර්ගය හා උපරිමය යටතේ සඳහන්ව ඇති "කාර්යාල ණය" යන්න "කාර්ය මණ්ඩල ණය" ලෙස නිවැරදි විය යුතුය.

**පිටු අංක** : 59

යෝජනා අංක 3.5 හි "අධ්‍යක්ෂක මණ්ඩල සභිකවරු දෙදෙනෙක්" යන්න "අධ්‍යක්ෂක මණ්ඩල සභිකවරු තිදෙනෙක්" ලෙස නිවැරදි විය යුතුය.

## 06 නව සාමාජිකයින් බඳවා ගැනීම අනුමත කිරීම

2023.08.14 දින සිට 2025.06.18 දින දක්වා වන කාලය තුල අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සාමාජික අංක 94930 සිට 102464 දක්වා සාමාජික මහත්ම මහත්මීන් 7534 දෙනෙකු නව සාමාජිකයින් ලෙස බඳවා ගැනීමේ ලේඛනය ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව මෙම සාමාජික මහත්ම මහත්මීන් සමිතිය වෙත බඳවා ගැනීම සුදුසු යැයි කළුබෝවිල ශික්ෂණ රෝහලේ සේවයේ නියුතු යූ.ඒ.සී.බී. ධනප්‍රේම මහතාගේ හා වාහරේ දිසා රෝහලේ සේවයේ නියුතු විමලේශ්වරී මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව අත්පොළොසන් දී ඒකමතිකව අනුමත කළහ.

## 07 (i) 59 වන විශේෂ මහසභාවේ රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කිරීම

කොළඹ 13 වේල්ස් කුමාර වීදියේ, අංක 56 හි සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගන පරිශ්‍රයේ දී 2023.08.26 දින පැවති සමිතියේ 59 වන විශේෂ මහසභා රැස්වීමේ වාර්තාව ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. එම වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වන බවට මදුරන්කෙනි දිසා රෝහලේ සේවයේ නියුතු එස්. ජෙයරූබන් මහතාගේ හා පේසාලේ දිසා රෝහලේ සේවයේ නියුතු ඇනීටා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් ඒකමතිකව අනුමත කළහ.

### (ii) 60 වන පාලන වාර්තාව ඉදිරිපත් කිරීම

සමිතියේ 60 වන පාලන වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා ලේකම් මහතා වෙත ගරු සභාපති මහතා විසින් ආරාධනය කරන ලදී. ඒ අනුව 60 වන මහසභා වාර්තා පොතේ පිටු අංක 17 සිට 24 දක්වා සඳහන් කර ඇති සමිතියේ 60 වන පාලන වාර්තාව ලේකම් මහතා විසින් සභාගත කළේය.

එහිදී මෙම පාලන වාර්තාව තුළින් 2023.01.29 දින සිට 2025.05.31 දින දක්වා පාලන කාලය තුල සමිතියේ දියුණුව හා සංවර්ධනාත්මක ගමන්මග පිළිබඳ කරුණු පැහැදිලි කර ඇති බවත් සාමාජිකත්වය සඳහා ක්‍රියාත්මක වන ණය නිකුත් කිරීම් සුභ සාධක වැඩසටහන්, නව තාක්ෂණය මගින් සාමාජික සේවාවන් සඳහා ගෙන ඇති පියවර පිළිබඳ, වෙනත් ව්‍යාපෘති හා විගණක කටයුතු පිළිබඳ මෙම පාලන වාර්තාව තුළින් තොරතුරු හා දත්ත ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කල ලේකම් මහතා මෙම පාලන කාලය තුල සමිතියෙත් සාමාජිකත්වයේත් උන්නතිය වෙනුවෙන් දායක වූ සියලු දෙනා වෙත අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්දයෙන් විමසීමක් හෝ පැහැදිලි කර ගැනීමක් ඉදිරිපත් නොවූයෙන් ශ්‍රී ලංකා ජාතික රෝහලේ සේවයේ නියුතු කේ.යූ.කේ. නෙළුම්දෙණිය මහතාගේ හා ශ්‍රී ලංකා ජාතික රෝහලේ සේවයේ නියුතු එච්. සුසන්ත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් පිළිගෙන අනුමත කරන ලදී.

## 08 2022 වර්ෂයේ විගණන වාර්තාව ඉදිරිපත් කිරීම

ගරු සභාපති මහතාගේ ආරාධනයෙන් ගරු භාණ්ඩාගාරික ටී. ප්‍රියංකා කුමුදුනි ද සිල්වා මහත්මිය විසින් සමිතියේ 60 වන මහසභා වාර්තා පොතේ පිටු අංක 25 සිට 53 දක්වා සඳහන් කර ඇති 2022 වර්ෂයේ විගණන වාර්තාව සභාගත කරන ලදී. ඉන් අනතුරුව මෙම වාර්තාව පිළිබඳ යම් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ විගණන නිළධාරී ලෙස කටයුතු කල සමූපකාර සංවර්ධන නිළධාරී ඒ.සී.බී. ජයංගා මිය වෙත ආරාධනය කරන ලදී.

එහිදී 2022.01.01 සිට 2022.12.31 දක්වා වන වර්ෂය පදනම් කරගනිමින් සකස් ඇති මෙම විගණන වාර්තාව තුළින් 2022 වර්ෂයට අදාලව සමිතියේ ලාභය 2022.12.31 දිනට මිලියන 126 ක් ද සමිතියේ මූල්‍ය තත්වය මිලියන 7301 ක් ද පෙන්නුම් කරන බව සඳහන් කරන ලදී. එමෙන්ම විගණනයේ විගණක මතය විගණන පරීක්ෂණ වලට අනුව සීමාසහිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමූපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය විසින් නියමිත ගිණුම් පොත්පත් පවත්වාගෙන යාමේදී තත්වා ගණනය කළ විගණන මතය සඳහා පදනම යටතේ දක්වා ඇති කරුණු හැරුණු කොට හා කළමණාකරන වාර්තාවේ පිටු අංක 14 සිට 37 තුලින් දන්වා ඇති කරුණු වලට යටත්ව අප වෙත ඉදිරිපත් වූ තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් පොත්පත් අතර එකඟතාවයක් ඇති බව ද 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනතින් නියම කර ඇති තොරතුරු ප්‍රතිපාදනය වී ඇති බවද 2022.12.31 දිනට සමිති තත්වය පිළිබඳව හා එදිනෙන් අවසන් මෙහෙයුම් වසර සඳහා මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය පිළිබඳ අපගේ මතය අනුව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව වැඩි දුරටත් සඳහන් කරන ලදී. 2022 වර්ෂයේ විගණන වාර්තාව වවුනියා මහ රෝහලේ සේවයේ නියුතු කුලනායගී මියගේ හා එරාවූර් ප්‍රාදේශීය රෝහලේ සේවයේ නියුතු යූ. යමුනා දේවී මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් අනුමත කරන ලදී.

## 09 අයවැය ඇස්තමේන්තුව හා සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීම - 2025 හා 2026

2025 හා 2026 වසර සඳහා වන අයවැය ඇස්තමේන්තුව හා සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා ගරු සභාපති මහතා විසින් ගරු භාණ්ඩාගාරිකතුමිය වෙත ආරාධනය කරන ලදී. ඒ අනුව 60 වන මහසභා වාර්තා පොතෙහි පිටු අංක 57 හා 58 හි සඳහන් 2025 හා 2026 වසරේ අයවැය ඇස්තමේන්තුව හා සංවර්ධන සැලැසුම ගරු භාණ්ඩාගාරිකතුමිය විසින් මහසභාවට ඉදිරිපත් කරන අතර එම වර්ෂයන්හි අපේක්ෂිත සමිතියේ ආදායම් හා වියදම් පිළිබඳවත් සංවර්ධන සැලසුම් පිළිබඳවත් සලකා බලා ඉදිරිපත් කර ඇති මෙම ඇස්තමේන්තුව පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අවස්ථාව පවතින බව ද එතුමිය විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ගරු මහසභාව විසින් මේ පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව 2025 හා 2026 වර්ෂයන්හි අයවැය ඇස්තමේන්තුව හා සංවර්ධන සැලසුම් වවුනියා මහ රෝහලේ සේවයේ නියුතු එස්. වාමිනි මියගේ හා චෙට්ටිකුලම් ප්‍රාදේශිය රෝහලේ සේවයේ නියුතු කේ. කේදීෂ්වරන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව අනුමත කරන ලදී.

## 10 යෝජනා ඉදිරිපත් කිරීම
## (i) අධ්‍යක්ෂක මණ්ඩල යෝජනා

2025.06.02 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද පහත සඳහන් යෝජනා ගරු මහසභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**යෝජනා අංක 01**

සමිතියේ මේ වන විට ක්‍රියාත්මක රු. 750,000/- ක් වූ සාමාජික උපරිම ණය සීමාව රු. ලක්ෂ 20 දක්වා පුළුල් කිරීමට මෙම මහසභාව යෝජනා කරන්නීය.

සමිතියේ මේ වන විට ක්‍රියාත්මක රු. 750,000/- ක් වූ උපරිම ණය සීමාව රු. ලක්ෂ 20 දක්වා පුළුල් කිරීමට මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඉහත සඳහන් යෝජනා අංක 01 ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව මාතර මහ රෝහලේ සේවයේ නියුතු සී.ඒ. සම්පත් මහතා සහ මාතර මහ රෝහලේ සේවයේ නියුතු ශාන්ති ගමගේ මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව අත්පොලොසන් දී ඒකමතිකව අනුමත කලහ.

**යෝජනා අංක 02**

අතුරු ව්‍යවස්ථා 20 ණය යටතේ දේපල ඇපයක් හා පුද්ගල ඇප දෙකක් මත නිකුත් කරනු ලබන රු. 750,000/- ක් වූ ණය උපරිම සීමාව රු. ලක්ෂ 15 දක්වා වැඩි කිරීමටත් ඒ අනුව ණය කාරක නියෝග මාලාවේ 5.1 වගන්තියේ සඳහන් දේපල ණය සීමාව රු. ලක්ෂ 15 දක්වා සංශෝධනය කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

අතුරු ව්‍යවස්ථා 20 ණය යටතේ දේපල ඇපයක් හා පුද්ගල ඇප දෙකක් මත නිකුත් කරනු ලබන රු. 750,000/- ක් වූ ණය උපරිම සීමාව රු. ලක්ෂ 15 දක්වා වැඩි කිරීමටත් ඒ අනුව ණය කාරක නියෝග මාලාවේ 5.1 වගන්තියේ සඳහන් දේපල ණය සීමාව රු. ලක්ෂ 15 දක්වා සංශෝධනය කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඉහත සඳහන් යෝජනා අංක 02 ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව පේරාදෙණිය මහ රෝහලේ සේවයේ නියුතු ඩී.එම්.එස්.කේ. දිසානායක මහතා විසින් යෝජනා කල අතර කරාපිටිය ජාතික රෝහලේ සේවයේ නියුතු ඩබ්ලිව්.එම්. පොඩි මැණිකේ මහත්මිය විසින් ස්ථිර කරන ලද අතර ගරු මහසභාව අත්පොලොසන් දී ඒකමතිකව අනුමත කලහ.

**යෝජනා අංක 03**

පහත සඳහන් කර ඇති සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ "අත්තිකාරම් ණය කාරක නියෝග මාලාව" ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

**01. නාමය**

මෙම කාරක නියෝග මාලාව මින්මතු "අත්තිකාරම් ණය කාරක නියෝග මාලාව" ලෙස හඳුන්වනු ලැබේ.

**02. පරමාර්ථය**

සාමාජිකයා විසින් විශ්‍රාම යන අවස්ථාවේදී ලබා ගැනීමට අපේක්ෂිත අරමුදල් භාවිතයෙන් ඊට පෙර ඔහු /ඇය විසින් අපේක්ෂා කරන ආර්ථික ප්‍රතිලාභයක් උදෙසා තම ස්වකීය අන්‍යෝන්‍යාධාර අරමුදල භාවිතා කරමින් (ඇප බැඳුම් රහිතව) අත්තිකාරමක් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම.

**03. සාමාජිකත්වය**

සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ අන්‍යෝන්‍යාධාර යෝජනා ක්‍රමයට දායක වී ඇති සියලු සාමාජිකත්වයට මෙහි හිමිකම් පෑමට හැක.

**04. පරිපාලනය**

මෙම ණය මුදල සඳහා කාරක නියෝග සම්පූර්ණ කරන සියලුම සාමාජිකත්වය සඳහා හිමිකම් පෑමට හැකියාව ඇති නමුත් අරමුදලේ භාවිතය පිළිබඳ තීරණ ගැනීමට අරමුදල් හා ණය කමිටුව විසින් මෙහි පරිපාලනය සිදු කල යුතු වේ.

**05. අරමුදල් හා ණය කමිටුව** පහත සඳහන් සංයුතියෙන් සමන්විත විය යුතු වේ. සමිතියේ ලේකම්වරයා මෙම කමිටුවේ කැඳවුම්කරු වේ.

1. සභාපති
2. උප සභාපති
3. භාණ්ඩාගාරික
4. ලේකම්
5. අධ්‍යක්ෂක මණ්ඩල සභිකවරුන් තිදෙනෙක්
6. සාමාන්‍යාධිකාරි
7. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)

**06. සුදුසුකම්**
අන්‍යෝන්‍යාධාර ක්‍රමයට වසර 05 ක් දායක වීම හෝ එහි ශේෂය රු. 10,000/- ක් ඉක්මවන අවස්ථාව යන දෙකින් පළමු අවස්ථාව ලබා ඇති සාමාජිකයින්

**07. ඇපකරු සුදුසුකම්**
පුද්ගල ඇප මේ සඳහා අවශ්‍ය නොවන අතර අරමුදලේ ශේෂය ඇපයක් ලෙස පවතී.

**08. ණය ලබා ගැනීම සඳහා කොන්දේසි**

i. උපරිම ණය ප්‍රමාණය පවතින අන්‍යෝන්‍යාධාර ශේෂයෙන් 80% ක් හෝ රු. 35,000/- ක් වන අගයෙන් අඩු අගය මාසික වාරික 12 කින් ආපසු ගෙවා නිම කල යුතු වේ.
ii. අවසන් මාස 06 අඛණ්ඩව සාමාජික මුදල් අයවී තිබීම.
iii. වෙනත් ණය මුදලක් ලබා ගෙන තිබේ නම් ඒ සඳහා මාසික වාරික 03 ක් මුදල් අයවී තිබීම
iv. අයදුම්පතක් ඉදිරිපත් කර මෙම ණය මුදල ලබා ගත යුතුය.
v. මෙම ණය මුදල ලබා ගැනීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නැවත එම ණය මුදල සඳහා ඉල්ලුම් කල නොහැක.
vi. මෙම ණය මුදල සඳහා අවකරණයක් අවශ්‍ය නොවන අතර එම ණය මුදල අය නොවන අවස්ථාවක අවකරණය කර ඇති මුදලින් මෙම ණය මුදල සඳහා අයකර ගැනීමට අවසන් ප්‍රමුඛතාවය ලබා දේ.
vii. ණය මුදල සඳහා අඛණ්ඩව මුදල් අයකර එවීමට සාමාජිකයා බැඳී සිටී. එසේ ණය වාරික නොගෙවන අවස්ථාවක අඛණ්ඩව මාස 03 ක් මුදල් අයනොවන විට අන්‍යෝන්‍යාධාර අරමුදලේ ශේෂයෙන් මෙම ණය හා පොලී වාරික අයකරනු ලැබේ. එසේම එම අහිමි පොලී සඳහා අධිභාරය ගණනය වේ.

**09. ණය සඳහා පොලී අනුපාතය**
සරල වාරික ක්‍රමයට 12% ක් වූ පොලී අනුපාතය මත අයකරනු ලැබේ.

**10. අරමුදලේ නඩත්තුව**

i. යම් සාමාජිකයකු විසින් ඉහත කී පරිදි ලබා ගත් ණය මුදල නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක මෙම අරමුදලෙන් එම ණය හා පොලිය සමඟ අධිභාරය පියවා ගැනීමට කටයුතු කරන අතර එම සාමාජිකයාගේ පවතින ශේෂයට පමණක් අන්‍යෝන්‍යාධාර ක්‍රමය යටතේ ගෙවන ප්‍රතිලාභ වලංගු වේ.
ii. අන්‍යෝන්‍යාධාර අරමුදලේ ශේෂයෙන් 2/3 ක් ස්ථාවර තැන්පතු ගිණුමකට හා 1/3 ක් මුල්‍ය වෙළඳපොල ගිණුමකට බැර කිරීම
iii. එහි පොලී ආදායම අන්‍යෝන්‍යාධාර ප්‍රදාන ගිණුමට මාරු කිරීම

**11. කාරක නියෝග වල අර්ථ දැක්වීම හා කාරක නියෝග සංශෝධනය**
මෙම කාරක නියෝග මාලාවේ අර්ථ නිරූපණය හා මෙහි සඳහන් නොවන කරුණු පිළිබඳ තීන්දු ගැනීමේ බලය කාරක සභාව (අධ්‍යක්ෂක මණ්ඩලය) සතුවේ.

මෙම කාරක නියෝග මාලාවේ වගන්ති සංශෝධනය කිරීමේදී අලුතින් වගන්ති ඇතුලත් කිරීම හෝ පවතින වගන්ති වෙනස් කිරීම හෝ සංශෝධනයන් කිරීමේ බලය මහසභාවේ අනුමැතියට යටත්ව සමිතියේ කාරක සභාව (අධ්‍යක්ෂක මණ්ඩලය) සතු වන්නේය.

**12. යෙදුම් වල අර්ථ නිරූපණය**
මෙම කාරක නියෝග මාලාවේ සඳහන් "අත්තිකාරම්"ලෙස සඳහන් වන්නේ අරමුදලේ ශේෂයෙන් ලබා ගන්නා අත්තිකාරම් ණය වටිනාකම වේ.

මෙම කාරක නියෝග මාලාවේ සඳහන් "සමිතිය" යනුවෙන් අදහස් කරනුයේ සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය වේ. මෙම කාරක නියෝග මාලාවේ සඳහන් "අනුකමිටුව" යනුවෙන් අදහස් කරනුයේ සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ අරමුදල් හා ණය කමිටුව සඳහා පත්කර ගන්නා පාලක මණ්ඩලය වේ.

ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව අත්තිකාරම් ණය කාරක නියෝග මාලාවට අනුව අන්‍යෝන්‍යාධාර ක්‍රමයෙන් තැන්පතු ශේෂය පදනම් කර ගනිමින් ණය මුදලක් ලබා ගැනීම සඳහා සාමාජිකත්වය වෙත අවස්ථාව ලබාදීම සුදුසු වන බව කරාපිටිය ජාතික රෝහලේ සේවයේ නියුතු පී.කේ.ඩී. ශ්‍රියාලතා මහත්මියගේ හා කඳාන දිසා රෝහලේ සේවයේ නියුතු එච්.පී. මහේෂ් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 04**
ඇස් කණ්නාඩි ණය කාරක නියෝග මාලාවේ වගන්ති අංක 08 පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු යැයි මෙම මහ සභාවට යෝජනා කරන්නීය.

**පවත්නා වගන්තිය :**
සාමාජිකත්වයට ඇස් කණ්නාඩි ලබා ගැනීම සඳහා රු.7500/- ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලබා ගත හැකිය. එම ණය මුදල 12% ක වාර්ෂික පොලිය සමඟ මාසික වාරික 10 කින් ආපසු ගෙවා නිදහස් විය යුතුය.

**යෝජිත සංශෝධිත වගන්තිය :**
සාමාජිකත්වයට ඇස් කණ්නාඩි ලබා ගැනීම සඳහා රු. 15,000/- ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලබා ගත හැකිය. එම ණය පොලිය සමඟ මාසික වාරික 10 කින් ආපසු ගෙවා නිදහස් විය යුතුය.

ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව ඇස් කණ්නාඩි ණය කාරක නියෝග මාලාවේ වගන්ති අංක 08 ඉහත සඳහන් ආකාරයට සංශෝධනය කරමින් සාමාජිකත්වය සඳහා ඇස් කණ්නාඩි ලබා ගැනීම සඳහා රු. 15,000 ක උපරිමයකට යටත්ව පොලිය සමඟ උපරිම මාසික වාරික 10 කින් ගෙවා නිම කිරීම සඳහා සුදුසු වන බවට පේරාදෙණිය මහ රෝහලේ සේවයේ නියුතු කේ.ඩී.ආර්.ඩී. අබේසිංහ මහතා යෝජනා කල අතර මාතර මහ රෝහලේ සේවයේ නියුතු එම්.පී. ආරියසිරි මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු මහසභාව විසින් අත්පොලොසන් දී ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 05**
නව තාක්ෂණය සමුපකාර ව්‍යාපාරය සඳහා ද එක්කර ගනිමින් සාමාජික ගිණුම් කටයුතු ඇතුළු අනිකුත් පහසුකම් පුළුල් කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහා පරිගණකගත කිරීමේ කටයුතු 59 වන විශේෂ මහසභා අනුමැතිය පරිදි ආරම්භ කර ඇත. ඒ අනුව ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල තාක්ෂණික ඇගයීම් නිර්දේශ අනුව මෘදුකාංග පද්ධතිය සැකසීමේ කාර්යන් රු. 20,837,758.68 හා බදු සහිත වැය උපරිමයකට යටත්ව DMS Software Engineering pvt ltd ආයතන මඟින් සිදු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඉහත සඳහන් යෝජනා අංක 05 ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව නව තාක්ෂණය සමුපකාර ව්‍යාපාරය සඳහා ද එක්කර ගනිමින් සාමාජික ගිණුම් කටයුතු ඇතුළු අනෙකුත් පහසුකම් පුළුල් කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහා පරිගණක ගත කිරීමේ කටයුතු 59 වන විශේෂ මහසභාවේ අනුමැතිය පරිදි ආරම්භ කරන ලද කාර්යාලීය කටයුතු පරිගණක ගත කිරීමේ ක්‍රියාවලිය ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා තාක්ෂණික ඇගයීම් නිර්දේශයන්ට අනුව රු. 20,837,758.68 හා බදු සහිත වැය උපරිමයකට යටත්ව DMS Software Engineering pvt ltd ආයතනය මඟින් සිදු කිරීම සුදුසු බව මෙම මහසභාව යෝජනා කරන්නීය.

ගරු ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව කාර්යාල කටයුතු පහසු කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය කරුණක් වන බැවින් එම යෝජනාව එරාවූර් ප්‍රාදේශිය රෝහලේ සේවයේ නියුතු ජමුනාදේවි මහත්මියගේ හා මුලතිව් දිස්ත්‍රික් මහ රෝහලෙහි සේවයේ නියුතු සිවරූබී මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 06**
සාමාජික ගිණුම් කටයුතු ඇතුළු අනිකුත් පහසුකම් පුළුල් කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහා පරිගණක ගත කිරීමේ කටයුතු සිදු කිරීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල සිදු කර ඇත. ඒ අනුව පරිගණක ජාලගත කිරීමේ කාර්යයන් රු. 6,799,288.28 හා බදු සහිත වැය උපරිමයකට යටත්ව Sumathi Information Technologies pvt ltd ආයතනය මඟින් සිදු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඉහත සඳහන් යෝජනා අංක 06 ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව සාමාජික ගිණුම් කටයුතු ඇතුළු අනිකුත් පහසුකම් පුළුල් කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහා පරිගණක ගත කිරීමේ කටයුතු සිදු කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල සිදු කර ඇති බවත් ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත මෙම ක්‍රමවේදය අනුගමනය කරමින් කටයුතු කිරීමට සුදුසුයැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ගරු ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව මහියංගනය මූලික රෝහලේ සේවයේ නියුතු ආර්.එම්.ටී.ටී. නවරත්න මහතාගේ හා මහියංගනය මූලික රෝහලේ සේවයේ නියුතු ජී.ජී. ස්වර්ණලතා මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් අනුමත කරන ලදී.

**යෝජනා අංක 07**
සාමාජික සේවා කාර්යන් පරිගණක ගත කිරීමත් සමගම සාමාජික සේවා සැපයීම් පහසුකම් පුළුල් කරමින් හා පහසු කරමින් මහනුවර, බදුල්ල, රත්නපුර, ගාල්ල හා වවුනියාව යන දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් ශාඛා කාර්යාල 05 ක් පළමු අදියර ලෙස ඉදිරි මාස 02 ක කාලය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව අදාළ ශාඛා කාර්යාල ආරම්භ කිරීම සුදුසු වන බවටත් ඒ සඳහා වන වැය දැරීම සුදුසු වන බවට මෙම මහසභාව යෝජනා කරන්නීය.

60 වන මහසභා වාර්තා පොතෙහි පිටු අංක 60 හි ඉහත සඳහන් යෝජනා අංක 07 ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

සාමාජික සේවා කාර්යන් පරිගණක ගත කිරීමත් සමගම සාමාජික සේවා සැපයීම් පහසුකම් පුළුල් කරමින් හා පහසු කරමින් මහනුවර, බදුල්ල, රත්නපුර, ගාල්ල හා වවුනියාව යන දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් ශාඛා කාර්යාල 05 ක් පළමු අදියර ලෙස ඉදිරි මාස 02 ක කාලය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව අදාළ ශාඛා කාර්යාල ආරම්භ කිරීම සුදුසු වන බවට මෙම මහසභාව යෝජනා කරන්නීය.

ගරු ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව තුළින් සාමාජික කාර්යන් ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමකින් තොරව සේවා කාර්යන් ආසන්නතම ශාඛාව තුළින් සිදු කර ගැනීමට හැකිවීම පහසු කරුණක් වන බැවින් එම යෝජනාව වවුනියාව මහ රෝහලේ සේවයේ නියුතු එන්. පාර්තීපන් මහතාගේ හා වවුනියාව මහ රෝහලේ සේවයේ නියුතු ටී.එම්.ඊ. මිරාල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාවේ ඒකමතිකත්වයෙන් අනුමත කළහ.

**යෝජනා අංක 08**

පරිගණක මෘදුකාංග පද්ධතිය සක්‍රීය භාවිතය සඳහා යොදා ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍ර 34 ක් හා සාමාජික පාස්පොත් මුද්‍රණ යන්ත්‍ර 06 තාක්ෂණික ඇගයීම් නිර්දේශයන්ට අනුව රු. 6,748,400/- හා බදු සහිත වැය උපරිමයකට යටත්ව මිලදී ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

යෝජනා අංක 08 යටතේ ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව පරිගණක මෘදුකාංග පද්ධතිය සක්‍රීය භාවිතය සඳහා යොදා ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය පරිගණක යන්ත්‍ර 34 ක් හා සාමාජික පාස්පොත් මුද්‍රණ යන්ත්‍ර 06 තාක්ෂණික ඇගයීම් නිර්දේශයන්ට අනුව රු. 6,748,400/- හා බදු සහිත වැය උපරිමයකට යටත්ව මිලදී ගැනීමට සුදුසු වන බව මූලික රෝහල බලංගොඩ සේවයේ නියුතු සංජීව කරුණාරත්න මහතාගේ හා ඇඹිලිපිටිය මූලික රෝහලේ සේවයේ නියුතු සීතා නන්දනී වීරතුංග මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් අනුමත කළහ.

**යෝජනා අංක 09**

කාර්යාලීය පරිශ්‍රය සඳහා මේ වන විට සූර්යකෝෂ පද්ධති පහසුකම් උපයෝගී කර ගනිමින් විදුලි බලය ලබා ගැනීමත්, කාර්යාලීය සාමාජික සේවා සැපයීමේ කාර්යන් පරිගණක ගත කිරීමත් සමගම භාවිතා වන පරිගණක යන්ත්‍ර ඇතුළු නව තාක්ෂණික උපාංගයන්හි කල්පැවැත්ම උදෙසාත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් සිව්මහල් කාර්යාලීය පරිශ්‍රය වායුසමනය කිරීමට කටයුතු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

60 වන මහසභා වාර්තා පොතෙහි පිටු අංක 61 හි ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව කාර්යාලීය පරිශ්‍රය සඳහා මේ වන විට සූර්යකෝෂ පද්ධති පහසුකම් උපයෝගී කර ගනිමින් විදුලි බලය ලබා ගැනීමත්, කාර්යාලීය සාමාජික සේවා සැපයීමේ කාර්යන් පරිගණක ගත කිරීමත් සමගම භාවිතා වන පරිගණක යන්ත්‍ර ඇතුළු නව තාක්ෂණික උපාංගයන්හි කල්පැවැත්ම උදෙසාත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් කටයුතු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ගරු ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ශ්‍රී ලංකා ජාතික රෝහලේ සේවයේ නියුතු එච්. සුසන්ත මහතාගේ හා ශ්‍රී ලංකා ජාතික රෝහලේ සේවයේ නියුතු සමන්ති රත්නායක මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 10**

සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් හා සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ හා ණය ගණුදෙනු පිළිබඳ සමිතිය සතු කොළඹ 10 පන්සල පාරේ 37/6 දරණ සමිති කාර්යාලය ඉදිරිපිට පිහිටි ගොඩනැගිල්ල සහිත පර්චස් 13 ක් වූ ඉඩම් කොටස රු. මිලියන 210 ක් වූ උපරිම වැය දැරීමට යටත්ව මිලදී ගැනීමට 59 වන විශේෂ මහසභාව අනුමත කලද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස.සං.දෙ./සමිති/01/02-07 අංක හා 2024.05.20 දිනැති ලිපිය මඟින් උක්ත දේපලයේ තක්සේරු වටිනාකම වූ රු. මිලියන 143.3 ක වැය උපරිමයකට යටත්ව පමණක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව දේපලයේ විකුණුම් මිල හා මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇති මිල වෙනස්කම් මත මෙම දේපලය මිලදී ගැනීමට නොහැකි විය.

එසේ තිබියදී සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් හා සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීම පිළිබඳ වූ සමිතියේ අරමුණ සඵලකර ගනිමින් සමිති කාර්යාලයට වම්පසින් පන්සල පාර දක්වා දිවෙන කොළඹ 10, පන්සල පාරේ අංක 47 දරණ වර්ග අඩි 4848 ක් වූ දෙමහල් ගොඩනැගිල්ලක් සහිත පර්චස් 15.81 ක ප්‍රමාණයෙන් යුතු දේපලය සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමියගේ ස.සං.දෙ./සමිති/01/02-07 අංක හා 2024.08.05 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති පූර්ව අනුමැතිය පරිදි රු. මිලියන 189.72 ක වැය දරා සමිතියේ සාමාජිකත්වය වෙත හිමි කර

ගැනීමට අපට හැකි විය. ඒ අනුව වර්තමාන හා අනාගත සාමාජිකත්වය සඳහා ඵලදායී ආයෝජනයක් සිදු කරමින් උක්ත දේපලය මිලදී ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

යෝජනා අංක 10 යටතේ ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් හා සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීම පිළිබඳ වූ අරමුණින් සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ හා ණය ගණුදෙනු පිළිබඳ සමිතිය සතු කොළඹ 10, පන්සල පාරේ 37/6 දරණ සමිති කාර්යාලය ඉදිරිපිට පිහිටි ගොඩනැගිල්ල සහිත පර්චස් 13 ක් වූ ඉඩම් කොටස රු. මිලියන 210 ක් වූ උපරිම වැය දැරීමට යටත්ව මිලදී ගැනීමට 59 වන විශේෂ මහසභාව අනුමත කලද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස.සං.දෙ./සමිති/01/02-07 අංක හා 2024.05.20 දිනැති ලිපිය මගින් උක්ත දේපලයේ තක්සේරු වටිනාකම වූ රු. මිලියන 143.3 ක වැය උපරිමයකට යටත්ව පමණක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව දේපලයේ විකුණුම් මිල හා මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇති මිල වෙනස්කම් මත මෙම දේපලය මිලදී ගැනීමට නොහැකි විය.

එසේ තිබියදී සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් හා සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීම පිළිබඳ වූ සමිතියේ අරමුණ සඵලකර ගනිමින් සමිති කාර්යාලයට වම්පසින් පන්සල පාර දක්වා දිවෙන කොළඹ 10, පන්සල පාරේ අංක 47 දරණ වර්ග අඩි 4848 ක් වූ දෙමහල් ගොඩනැගිල්ලක් සහිත පර්චස් 15.81 ක ප්‍රමාණයෙන් යුතු දේපලය සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමියගේ ස.සං.දෙ./සමිති/01/02-07 අංක හා 2024.08.05 දිනැති ලිපිය මගින් ලබා දී ඇති පූර්ව අනුමැතිය පරිදි රු. මිලියන 189.72 ක වැය දරා සමිතියේ සාමාජිකත්වය වෙත හිමි කර ගැනීමට අපට හැකි විය. ඒ අනුව වර්තමාන හා අනාගත සාමාජිකත්වය සඳහා ඵලදායී ආයෝජනයක් සිදු කරමින් උක්ත දේපලය මිලදී ගැනීම සුදුසු බව මෙම මහසභාව යෝජනා කරන්නීය.

ගරු ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව නාවලපිටිය මූලික රෝහලේ සේවයේ නියුතු ඩී.එම්.ඩී. දසනායක මහතාගේ හා නාවලපිටිය මූලික රෝහලේ සේවයේ නියුතු එම්.එන්. ක්‍රිෂාන්ති රත්නකුමාරි මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව අත්පොලොසන් දී ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 11**

සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් හා සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීම සඳහාත් වෙනත් ව්‍යාපාර ඒකකයන් සඳහා ඵලදායී ආයෝජනයන් සිදු කිරීම සඳහා පවතින ඉඩකඩ ඵලදායී ලෙස යොදා ගත හැකි ආකාරයට සමිතිය සතු කොළඹ 10, පන්සල පාරේ, අංක 47 දරණ ස්ථානයේ මහල් දහයකින් යුතු පරිශ්‍රයක් සැලසුම් කිරීමටත් ඒ සඳහා උපදේශකත්වය හා සැලසුම් නිර්මාණය කිරීම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් සිදු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

යෝජනා අංක 11 යටතේ වන ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් හා සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීම සඳහාත් වෙනත් ව්‍යාපාර ඒකකයන් සඳහා ඵලදායී ආයෝජනයන් සිදු කිරීම සඳහා පවතින ඉඩකඩ ඵලදායී ලෙස යොදා ගත හැකි ආකාරයට සමිතිය සතු කොළඹ 10, පන්සල පාරේ අංක 47 දරණ ස්ථානයේ මහල් දහයකින් යුතු පරිශ්‍රයක් සැලසුම් කිරීමටත් ඒ සඳහා උපදේශකත්වය හා සැලසුම් නිර්මාණය කිරීම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් සිදු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

මෙම ස්ථානයේ වැනලින් සේවාවක්, ඔසුසලක්, කුඩා ප්‍රමාණයේ දේශන ශාලාවක්, නේවාසික සැපයීම් ඒකකයන් ආදී ව්‍යාපාර ඒකකයන් මේ තුළින් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන අතර වවුනියාව මහ රෝහලේ සේවයේ නියුතු කේ. වේලම්මා මියගේ හා යාපනය ශික්ෂණ රෝහලේ සේවයේ නියුතු කේ. හරිතරන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 12**

කොළඹ 10, පන්සල පාරේ අංක 37/36 දරණ කාර්යාලීය ගොඩනැගිල්ල වසර 15 ක කාලයක් තුල කිසිඳු අලුත්වැඩියාවක් සිදු කර නොමැති අතර කාර්යාලීය කටයුතු පරිගණක ගත කිරීම හා නව්‍යකරණයට ගැලපෙන පරිදි අභ්‍යන්තර ගෘහනිර්මාණය සැකසීම සුදුසු යැයි නිරීක්ෂණය වේ. ඒ අනුව වර්තමාන හා අනාගත සාමාජිකත්වය සඳහා ජාතික හා ජාත්‍යන්තර පහසුකම් යොමුකර ගත හැකි වන ආකාරයට වරලත් ගෘහ නිර්මාණ ශිල්පී සැලසුමට අනුව සිව්මහල් කාර්යාලීය පරිශ්‍රයේ අභ්‍යන්තර ගෘහ නිර්මාණ කාර්යයන් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් සිදු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

60 වන මහසභා වාර්තා පොතේ පිටු අංක 61 හි සඳහන් ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. එහිදී ප්‍රකාශ කර සිටියේ කොළඹ 10, පන්සල පාරේ අංක 37/36 දරණ කාර්යාලීය ගොඩනැගිල්ල වසර 15 ක කාලයක් තුල කිසිඳු අලුත්වැඩියාවක් සිදු කර නොමැති බවත් කාර්යාලීය කටයුතු පරිගණක ගත කිරීමේ කටයුතු සිදුවන බවත් ආයතනයේ ගෘහ නිර්මාණ කාර්යයන් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් වර්තමාන නව්‍යකරණයට ගැලපෙන ආකාරයෙන් වරලත් ගෘහ නිර්මාණ ශිල්පී සැලසුමකට අනුව කළයුතු බවත්ය. ඒ අනුව මෙම යෝජනාව එසේ සිදු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය. එසේම මහමෝදර ශික්ෂණ

රෝහලේ සේවයේ නියුතු ඩබ්ලිව්.සී. දිල්රුක්ෂි මියගේ හා මහමෝදර ශික්ෂණ රෝහලේ සේවයේ නියුතු ඩී.ජී. වජිරා ප්‍රියදර්ශනී මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 13**

ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයට අදාල කාරක නියෝග මාලාවේ වගන්ති අංක 02:06 පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

**පවත්නා වගන්තිය : වගන්ති අංක 02:06**

මා පිය දෙදෙනාම / භාරකරුවන් දෙදෙනාම අරමුදලේ සාමාජිකයන් වන්නේනම් එක් ශිෂ්‍යත්වයක් පමණක් හිමිවූ අවස්ථාවක දී සාමාජිකත්වයෙන් ජේෂ්ඨත්වය සලකා ශිෂ්‍යත්වය පිරිනැමිය යුතුය.

**යෝජිත සංශෝධනය : වගන්ති අංක 02:06**

මා පිය දෙදෙනාම / භාරකරුවන් දෙදෙනාම අරමුදලේ සාමාජිකයන් වන්නේනම් ශිෂ්‍යත්වාධාර ප්‍රදානයන් (මුල්‍යමය ප්‍රදානය) දෙකක් ලබා ගැනීමට හිමිකම් ඇත.

ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. එහිදී ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයට දායක වන මව පියා දෙදෙනාම අරමුදලේ සාමාජිකත්වය දරන්නේනම් ශිෂ්‍යත්වලාභී දරුවා වෙනුවෙන් මුල්‍යමය ත්‍යාග 02ක් ලබා ගැනීමට සුදුසු බවත් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ කාරක නියෝග මාලාවේ වගන්ති අංක 2.6 ඉහත සඳහන් පරිදි සංශෝධනය කිරීම සුදුසු වන බවත් බලපිටිය මූලික රෝහලේ සේවයේ නියුතු ඩබ්ලිව්. විදුර ධනංජය මහතාගේ සහ රත්නපුර මහ රෝහලෙහි සේවයේ නියුතු කේ.ඩී.ඩබ්ලිව්. තිලක් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 14**

60 වන මහසභා වාර්තා පොතෙහි පිටු අංක 61 හා 62 හි සඳහන් යෝජනා අංක 14 ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය පිළිබඳ වූ කාරක නියෝග මාලාවේ වගන්ති අංක 01 පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම සුදුසු යැයි මෙම මහ සභාව යෝජනා කරන්නීය.

**පවත්නා වගන්තිය :**

01. අරමුදල් සම්පාදනය

01.01 2008.09.28 දින සිට සාමාජිකත්වය ලබා ගන්නා සෑම සාමාජිකයෙකුම, සමිතියේ ශිෂ්‍යත්ව අරමුදල සඳහා ආරම්භක දායක මුදල වශයෙන් රු. 500/- (රුපියල් පන්සීයයක්) ගෙවිය යුතුය. මෙම ආරම්භක දායක මුදල රු. 250/- ක් බැගින් වන සේ මාසික වාරික 02 කදී ගෙවා නිම කල යුතුය.

ශිෂ්‍යත්ව අරමුදල සඳහා සෑම සාමාජිකයකුම මාසිකව රු. 10/- ක් බැගින් වන දායක මුදලක් ගෙවිය යුතුය. (මෙම දායක මුදල අය කිරීම 2009 මාර්තු මස සිට ක්‍රියාත්මක වේ.)

**යෝජිත සංශෝධනය :**

01. අරමුදල් සම්පාදනය

01.01 2008.09.28 දින සිට සාමාජිකත්වය ලබා ගන්නා සෑම සාමාජිකයෙකුම, සමිතියේ ශිෂ්‍යත්ව අරමුදල සඳහා ආරම්භක දායක මුදල වශයෙන් රු. 500/- (රුපියල් පන්සීයයක්) ගෙවිය යුතුය. මෙම ආරම්භක දායක මුදල රු.250/- ක් බැගින් වන සේ මාසික වාරික 02 කදී ගෙවා නිම කල යුතුය.

ශිෂ්‍යත්ව අරමුදල සඳහා සෑම සාමාජිකයකුම මාසිකව රු.25/- ක් බැගින් වන දායක මුදලක් ගෙවිය යුතුය. (මෙම දායක මුදල අය කිරීම සාමාජික අංක 100083 සිට ක්‍රියාත්මක වේ.)

ඒ අනුව ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ කාරක නියෝග මාලාවේ වගන්ති අංක 01.01 හි සඳහන් අරමුදල සඳහා සෑම සාමාජිකයෙකු විසින්ම මාසිකව ලබා දෙනු ලබන දායක මුදල රු. 25/- ක් දක්වා වැඩි කිරීම සුදුසු වන බවට කොඩිගාමම් ප්‍රාදේශිය රෝහලෙහි සේවයේ නියුතු එස්. වසන්තා කුමාරි මියගේ හා කරවෙඩ්ඩි ප්‍රදේශීය රෝහලෙහි සේවයේ නියුතු එම්. ඉලවරසි මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

යෝජනා අංක 15

අංක 15 යටතේ වන පහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

**යෝජනා අංක 15**

සාමාජිකත්වයේ ප්‍රථම දරු ප්‍රසූතිය සඳහා සූදානම් වීමක දී හෝ ප්‍රථම සජීවී දරු උපතින් පසු අවශ්‍ය වන අත්‍යාවශ්‍ය පහසුකම් සපයා ගැනීමට අත්වැලක් වෙමින් "සුවදිවි මාතෘ" නම් ණය මුදලක් පහත කොන්දේසි මත ලබා දීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

1. සාමාජික කාලය වසරක් සම්පූර්ණ වී තිබීම.
2. ගර්භණී කාලය මාස 8ක් සම්පූර්ණ වූ පසු හෝ සජීවී එක් දරු උපතකට පමණක් මාස 03 ක් ඇතුලත මෙම ණය මුදල ඉල්ලුම් කල හැක.
3. ප්‍රථම දරු ප්‍රසූතිය හෝ උපත සඳහා පමණක් මෙම ණය මුදල ක්‍රියාත්මක කිරීම.
4. උපරිම රු. 25,000 ක මුදලක් 6%ක් වූ වාර්ෂික සහනදායී පොලී ප්‍රතිශතයක් මත සරල වාරික ක්‍රමයට ගෙවා අවසන් කල යුතුවේ.
5. ගර්භණීභාවය හෝ ප්‍රථම දරු උපත පිළිබඳ තහවුරු කිරීම සඳහා නම් කරනු ලබන ලේඛන ඉදිරිපත් කළයුතු වේ.
6. සාමාජික මහත්වරුන් විසින් මෙම ණය මුදල ඉල්ලුම් කිරීමේදී ඉහත සඳහන් තහවුරු ලේඛන වලට අතිරේකව විවාහ සහතිකය ඉදිරිපත් කළ යුතුය.
7. මව හා පියා දෙදෙනොම සාමාජිකත්වය දරන්නේනම් එක් සාමාජිකත්වයක් සඳහා පමණක් මෙම ණය මුදල ඉල්ලුම් කළ හැක. එවන් අවස්ථාකවකදී සාමාජිකත්වයේ ජ්‍යෝෂ්ඨත්වය සලකා ඉල්ලුම් කිරීමේ අවස්ථාව හිමිවේ.

ඒ අනුව සාමාජිකත්වයේ ප්‍රථම දරු ප්‍රසූතිය සඳහා සූදානම් වීමක දී හෝ ප්‍රථම සජීවී දරු උපතින් පසු අවශ්‍ය වන අත්‍යාවශ්‍ය පහසුකම් සපයා ගැනීමට අත්වැලක් වෙමින් "සුවදිවි මාතෘ" නම් ණය මුදලක් ඉහත කොන්දේසි මත ලබා දීම සුදුසු බව මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඒ අනුව කුරුණෑගල ශික්ෂණ රෝහලෙහි සේවයේ නියුතු ප්‍රියන්ති කුමාරි මියගේ හා කෑගල්ල මහ රෝහලෙහි සේවයේ නියුතු වත්සලා විජේරත්න මියගේ යෝජනා ස්ථිරත්වයෙන් මහසභාව ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 16**

පහත සඳහන් කර ඇති සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ "සිසු දිරිය පාසල් පොත් ණය ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

01. **නාමය** : මෙම කාරක නියෝග මාලාව මින්මතු "සිසුදිරිය පාසල් පොත් ණය කාරක නියෝග මාලාව " ලෙස හඳුන්වනු ලැබේ.

02. **පරමාර්ථය** : සාමාජිකයාගේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාසල් පොත් හා උපකරණ සහනදායී මිල ගණන් යටතේ ලබා ගැනීමට අවස්ථාව ලබාදීම.

03. **සාමාජිකත්වය** : සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ සාමාජිකත්වයට පමණක් මෙහි හිමිකම් පෑමට හැක.

04. **පරිපාලනය** : මෙම ණය මුදල සඳහා කාරක නියෝග සම්පූර්ණ කරන සියලුම සාමාජිකත්වය සඳහා හිමිකම් පෑමට හැකියාව ඇති නමුත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණ ගැනීම ව්‍යාපෘති හා මූල්‍ය අනුකමිටුව විසින් සිදු කල යුතු වේ.

05. **ව්‍යාපෘති හා මූල්‍ය** අනුකමිටුව පහත සඳහන් සංයුතියෙන් සමන්විත විය යුතු වේ. සමිතියේ ලේකම්වරයා මෙම කමිටුවේ කැඳවුම්කරු වේ.

1. සභාපති
2. උප සභාපති
3. භාණ්ඩාගාරික
4. ලේකම්
5. අධ්‍යක්ෂක මණ්ඩල සභිකවරුන් දෙදෙනෙකු
6. සාමාන්‍යාධිකාරි
7. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)
8. සේවා ප්‍රවර්ධන (ව්‍යාපෘති)

06. **සුදුසුකම්** : අවම සාමාජික කාලය මාස 03 ක් හෝ ව්‍යාපෘති හා මූල්‍ය අනුකමිටුව විසින් තීරණය කරනු ලබන සුදුසුකම්.

07. **ඇපකරු සුදුසුකම්** : පුද්ගල ඇප මේ සඳහා අවශ්‍ය නොවේ.

08. **ණය ලබා ගැනීම සඳහා කොන්දේසි** :

i. උපරිම ණය ප්‍රමාණය වෙළඳපොල තත්වයන් මත ව්‍යාපෘති හා මූල්‍ය අනුකමිටුව විසින් තීරණය කරනු ලබයි.

iii. අවසන් මාස 03 අඛණ්ඩව සාමාජික මුදල් අයවී තිබීම.

iv. අයදුම්පතක් ඉදිරිපත් කර මෙම ණය මුදල ලබා ගත යුතුය.

v. මෙම ණය මුදල ලබා ගැනීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නැවත එම ණය මුදල සඳහා ඉල්ලුම් කල නොහැක.

vi. මෙම ණය මුදල සඳහා අවකරණයක් අවශ්‍ය නොවන අතර එසේ නමුත් ආයතනික මුදල් අයකිරීමේ එකඟතාවය මත අවකරණයක් මඟින් ණය නිකුත් කිරීම සඳහා ව්‍යාපෘති හා මූල්‍ය අනුකමිටුවට තීරණය කල හැක.

vii. එම මුදල අය නොවන අවස්ථාවක අවකරණය කර ඇති මුදලින් මෙම ණය මුදල සඳහා අයකර ගැනීමට ප්‍රථම ප්‍රමුඛතාවය ලබා දේ.

viii. අඛණ්ඩව මුදල් අයකර එවීමට හෝ ගෙවීමට සාමාජිකයා බැඳී සිටි. එසේ ණය වාරික නොගෙවන අවස්ථාවක මාස 03 ක් අඛණ්ඩව මුදල් අයනොවන විට පවතින තැන්පතු මුදලින් මෙම ණය හා පොලී වාරික අයකර ගැනීමට හැකියාව ඇත.

**09. ණය සඳහා පොලී අනුපාතය :** 12% වාර්ෂික පොලී අනුපාතය මත සරල වාරික ක්‍රමයට උපරිම වාරික 10 කින් ගෙවා නිම කල යුතු වේ.

**10. ව්‍යාපෘති හා මූල්‍ය අනුකමිටුවේ කාර්යභාරය.**

1. සැපයුම්කරුවන් හා ගුණාත්මක භාණ්ඩ පිළිබඳ තීරණ ගැනීම.
2. සාමාජික ණය සඳහා වට්ටම් ප්‍රමාණය තීරණය කිරීම.
3. සමිතියේ මූල්‍ය ශක්‍යතාවය පිළිබඳ සැලකිලිමත් විම.
4. දිවයින පුරා බෙදාහැරීමේ ක්‍රමවේදයන් හා කාල රාමු පිළිබඳ තීරණ ගැනීම.

**11. කාරක නියෝග වල අර්ථ දැක්වීම හා කාරක නියෝග සංශෝධනය :**
මෙම කාරක නියෝග මාලාවේ අර්ථ නිරූපනය හා මෙහි සඳහන් නොවන කරුණු පිළිබඳ තීන්දු ගැනීමේ බලය කාරක සභාව (අධ්‍යක්ෂක මණ්ඩලය) සතුවේ.

මෙම කාරක නියෝග මාලාවේ වගන්ති සංශෝධනය කිරීමේදී අලුතින් වගන්ති ඇතුලත් කිරීම හෝ පවතින වගන්ති වෙනස් කිරීම හෝ සංශෝධනයන් කිරීමේ බලය මහසභාවේ අනුමැතියට යටත්ව සමිතියේ කාරක සභාව (අධ්‍යක්ෂක මණ්ඩලය) සතු වන්නේය.

**12. යෙදුම් වල අර්ථ නිරූපනය**
මෙම කාරක නියෝග මාලාවේ සඳහන් "සමිතිය" යනුවෙන් අදහස් කරනුයේ සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය වේ.

මෙම කාරක නියෝග මාලාවේ සඳහන් "අනුකමිටුව" යනුවෙන් අදහස් කරනුයේ සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතියේ ව්‍යාපෘති හා මූල්‍ය අනුකමිටුව සඳහා පත්කර ගන්නා පාලක මණ්ඩලය වේ.

60 වන මහසභා වාර්තා පොතෙහි 62 හා 63 පිටු අංකයන්හි සඳහන් ඉහත සඳහන් යෝජනාව ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව සාමාජික දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාසල් පොත් හා උපකරණ මෙම "සිසු දිරිය පාසල් පොත් ණය ව්‍යාපෘතිය" මඟින් සහනදායී මිල ගණන් යටතේ ලබා දීම උදෙසා තව දුරටත් එම ව්‍යාපෘතිය විධිමත් කිරීම සඳහාත් වන කාරක නියෝග මාලාව සුදුසු වන බවට ඇඹිලිපිටිය මූලික රෝහලෙහි සේවයේ නියුතු සීතා නන්දනී වීරතුංග මියගේ හා බලංගොඩ රෝහලෙහි සේවයේ නියුතු ආර්.ටී. දමයන්ති මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව අනුමත කළහ.

## යෝජනා අංක 17

යෝජනා අංක 17 හි සඳහන් පහත සඳහන් යෝජනාව ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 07 පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

**පවත්නා වගන්තිය :**
ඇතුලත් වීමේ ගාස්තු වශයෙන් (රු. 500/-) රුපියල් පන්සීයයක් ගෙවිය යුතුය.

**යෝජිත සංශෝධනය :**
ඇතුලත් වීමේ ගාස්තු වශයෙන් රුපියල් දහසක් (රු. 1000/-) ගෙවිය යුතුය. එකවර එම මුදල ගෙවිය නොහැකි වන අවස්ථාවකදී, අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය පරිදි සාමාජිකත්වය පිරිනැමීමෙන් පසු අයවන පළමු මාසික අයකිරීමේ සිට එම ගාස්තුව අයකර ගත හැක. අදාල ඇතුලත් වීමේ ගාස්තුව ප්‍රතිපූර්ණය වූ පසු අයවන වාරික මුදල් සාමාජික ගිණුමට තැන්පත් වන බැවින් එතැන් සිට සාමාජික කාලය ගණනය වේ.

ඒ අනුව අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 07 හි සඳහන් සාමාජික ඇතුලත් වීමේ ගාස්තුව රු. 500/- දක්වා සංශෝධනය වී මේ වන විට වසර 13 ක පමණ කාලයක් ඉක්මවා ඇති බවත් වර්තමානයේ සමිතිය සපයනු ලබන සාමාජික සේවා හා ප්‍රතිලාභ පිළිබඳ සලකා බැලීමේදී සාමාජික ඇතුලත් වීමේ ගාස්තුව රු. 1,000/- දක්වා ඉහත සඳහන් පරිදි සංශෝධනය වීම සුදුසු බව මුලතිව් දිස්ත්‍රික් මහ රෝහලේ සේවයේ නියුතු ටී. කුලදේවී මහත්මියගේ හා මාන්කුලම් මූලික රෝහලෙහි සේවයේ නියුතු ආර්. සිවනන්දනී මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් අනුමත කළහ.

**යෝජනා අංක 18**

සමුපකාරික සුරක්ෂා රක්ෂණ ව්‍යාපෘතියක් ලෙස දීපව්‍යාප්තව "සුවසෙත" රෝගී සත්කාර සේවය සැපයීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය. ඒ තුලින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් හා ගුණාත්මක සේවාවක් සැපයිය හැකි සමිතිය හා එක්ව දිගුකාලයක් කටයුතු කරන ලද නිරෝගී විශ්‍රාමික සාමාජිකත්වය සඳහාත් සත්කාර සේවයේ නිරත වීමට අපේක්ෂා කරන වර්තමාන සාමාජිකත්වය සඳහාත් අතිරේක ආදායම් මාර්ග අවස්ථාවන් ජනිත කිරීමට ද අපේක්ෂා කෙරේ.

අංක 18 යටතේ ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව සමුපකාරික සුරක්ෂා රක්ෂණ ව්‍යාපෘතියක් ලෙස දීපව්‍යාප්ත "සුවසෙත" රෝගී සත්කාර ව්‍යාපෘතිය ආරම්භ කිරීමටත් මෙහිදී විශ්‍රාමික සාමාජිකත්වය හා වර්තමාන සාමාජිකත්වය සඳහාත් අතිරේක ආදායම් මාර්ග බිහි කිරීමට ද අපේක්ෂා කිරීම සුදුසු බවට පේරාදෙණිය මහ රෝහලෙහි සේවයේ නියුතු එම්.එම්. පත්මාවතී මහත්මියගේ හා පේරාදෙණිය මහ රෝහලෙහි සේවයේ නියුතු ඩී.එම්. සමන්සිරි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව අත්පොලොසන් දී ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 19**

කොළඹ 10, පන්සල පාරේ අංක 37/36 දරණ සිව්මහල් කාර්යාල පරිශ්‍රයට ප්‍රවේශ වී මේ වන විට වසර 15 ක පමණ කාලයක් ඉක්මගොස් ඇති බැවින් එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කල යුතු ආකාරයන් පිළිබඳ නිර්දේශ සහිත තත්ත්ව වාර්තාවක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

60 වන මහසභා වාර්තා පොතෙහි පිටු අංක 63 හි සඳහන් ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව කොළඹ 10, පන්සල පාරේ අංක 37/36 දරණ සිව්මහල් කාර්යාල පරිශ්‍රයට ප්‍රවේශ වී මේ වන විට වසර 15 ක පමණ කාලයක් ඉක්මවා ගොස් ඇති බැවින් නිර්දේශ සහිතව තත්ත්ව වාර්තාවක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශයන් මත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු යැයි මාරවිල මූලික රෝහලෙහි සේවයේ නියුතු එස්.ඒ. ගීතා ප්‍රියන්ති මහත්මියගේ හා මාරවිල මූලික රෝහලෙහි සේවයේ නියුතු එච්.ඒ.එස්. කාන්තිලතා මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 20**

සමිතිය සතු කතරගම සුවසෙවන නිවාඩු නිකේතනය ආරම්භ කර මේ වන විට වසර 22 ක පමණ කාලයක් ඉක්මගොස් ඇති බැවින් එම දෙමහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කලයුතු ආකාරය පිළිබඳ නිර්දේශ සහිත තත්ත්ව වාර්තාවක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

යෝජනා අංක 20 හි සඳහන් ඉහත සඳහන් යෝජනාව ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව කතරගම සුවසෙවන නිවාඩු නිකේතනය ආරම්භ කර වසර 22 ක පමණ කාලයක් ඉක්මවා ගොස් ඇති බැවින් එය ප්‍රතිසංස්කරණයට අදාල නිර්දේශ සහිත තත්ත්ව වාර්තාවක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන නිර්දේශයන් මත ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කරමින් එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට මාතර මහ රෝහලෙහි සේවයේ නියුතු එම්.පී. ආරියසිරි මහතාගේ හා මාතර මහ රෝහලෙහි සේවයේ නියුතු ශාන්ති ගමගේ මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 21**

නේවාසික කාමර 23 කින් සමන්විත කතරගම සුවසෙවන නිවාඩු නිකේතනයේ මේ වන විට වායුසමනය සහිත කාමර 03 ක් පමණක් ඇති බැවින් හා වර්තමානය වන විට වායුසමනය සහිත කාමර සඳහා වන නේවාසික ඉල්ලුමෙහි කැපීපෙනෙන වර්ධනයක් තිබීමත්, නිකේතනය සඳහා මේ වන විටත් සූර්යපැනල මඟින් විදුලි උත්පාදනය කර ලබා ගැනීමත් යන කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් නිකේතනයේ පවතින වායුසමනය රහිත කාමර 20 ක් ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරමින් වායුසමනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

60 වන මහසභා වාර්තා පොතෙහි පිටු අංක 63 හා 64 හි සඳහන් ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා සභාගත කරන ලදී.

ඒ අනුව සමුපකාර ව්‍යාපාරය තුළ සුවසෙවන නිවාඩු නිකේතනය මේ වන විට ගුණත්වයෙන් යුතු සහනදායී මිල ගණන් යටතේ සේවා සපයනු ලබන ආයතනයක් බවත් එහි නේවාසික කාමර 23න් වායුසමනය සහිත කාමර 03 ක් පමණක් ඇති හෙයින් වර්තමාන ඉල්ලුම වායු සමනය කළ කාමර සඳහා කැපීපෙනෙන වර්ධනයක් තිබීමත්,

හේතුවෙන් මේ වන විටත් ක්‍රියාත්මක සූර්යපැනල මගින් විදුලිය උත්පාදනය කර ගැනීමත් මත වායුසමනය රහිත කාමර 20 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් වායුසමනය කිරීමට සුදුසු වන බව කලවන්චිකුඩි මූලික රෝහලෙහි සේවයේ නියුතු වී. පරමේශ්වරී මියගේ හා කලවන්චිකුඩි මූලික රෝහලෙහි සේවයේ නියුතු වී. විජයකුමාරි මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

යෝජනා අංක 22
60 වන මහසභා රැස්වීමේ වාර්තා පොතේ පිටු අංක 64 හි පහත සඳහන් යෝජනා අංක 22 ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

**යෝජනා අංක 22**
කතරගම, සුවසෙවන නිවාඩු නිකේතන භූමියෙහි පවතින ඉඩකඩ ඵලදායී ලෙස භාවිතා කරමින් හා දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් ආකර්ෂණය වන පරිදි නේවාසික ප්‍රවර්ධනය ඉලක්ක කර ගනිමින් පිහිනුම් තටාකයක් හා පහසුකම් සහිත නේවාසික ඒකක 03 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ඉදිකිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා  කරන්නීය.

කතරගම, සුවසෙවන නිවාඩු නිකේතන භූමියෙහි පවතින ඉඩකඩ ඵලදායී ලෙස භාවිතා කරමින් හා දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් ආකර්ෂණය වන පරිදි නේවාසික ප්‍රවර්ධනය ඉලක්ක කර ගනිමින් පිහිනුම් තටාකයක් හා පහසුකම් සහිත නේවාසික ඒකක 03 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ඉදිකිරීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා  කරන්නීය.

ගරු ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සුවසෙවන නිවාඩු නිකේතනයේ පවතින ඉඩකඩ ඵලදායී ලෙස භාවිතා කරමින් පිහිනුම් තටාකයක් හා පහසුකම් සහිත නේවාසික ඒකක 03 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ඉදිකිරීම සුදුසු වන බව මහියංගනය මූලික රෝහලෙහි සේවයේ නියුතු එම්.පී.ඒ. දිමුතු රත්නායක මහතාගේ හා මහියංගනය මූලික රෝහලෙහිම සේවයේ නියුතු ඩී.එම්.ඩබ්ලිව්. මැණිකේ මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව අනුමත කළහ.

**යෝජනා අංක 23**
පුරප්පාඩු වූ කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා මාතර මහ රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 33586 දරණ ඩබ්.එම්.ඩී. රත්නායක මහතා 2023.10.20 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඉහත සඳහන් යෝජනා අංක 23 ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව "පුරප්පාඩු වූ කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා මාතර මහ රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 33586 දරණ ඩබ්.එම්.ඩී. රත්නායක මහතා 2023.10.20 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය."

මෙම යෝජනාව මාතර මහ රෝහලෙහි සේවයේ නියුතු ජේ.සී. මල්ලවආරච්චි මහතාගේ හා මාතර මහ රෝහලෙහි සේවයේ නියුතු ඩබ්ලිව්.ඒ. ලලිත් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව එය අනුමත කරන ලදී.

**යෝජනා  අංක 24**
පුරප්පාඩු කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා ඇල්පිටිය මූලික රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 28665 දරණ බී. අනුරසිරි ද සිල්වා මහතා 2025.06.02 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඉහත සඳහන් යෝජනා අංක 24 ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව "පුරප්පාඩු වූ කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා ඇල්පිටිය මූලික රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 28665 දරණ බී. අනුරසිරි ද සිල්වා මහතා 2025.06.02 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය."

මෙම යෝජනාව වවුනියාව මහ රෝහලේ සේවයේ නියුතු සී.එම්.පී.කේ. කරුණාරත්න මහතාගේ හා වවුනියාව මහ රෝහලේ ඩබ්ලිව්.ඒ. ශ්‍රියානි වීරසිංහ මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව එය අනුමත කරන ලදී.

**යෝජනා  අංක 25**
පුරප්පාඩු කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා ගල්ගමුව මූලික රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 48234 දරණ ඒ.එච්.එම්. සම්පත් සංජීව බණ්ඩාර මහතා 2025.06.02 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

ඉහත සඳහන් යෝජනා අංක 25 ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව "පුරප්පාඩු වූ කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා ගල්ගමුව මූලික රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 48234 දරණ ඒ.එච්.එම්. සම්පත් සංජීව බණ්ඩාර මහතා 2025.06.02 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය."

මෙම යෝජනාව හොරණ මූලික රෝහලෙහි සේවයේ නියුතු ආර්.ඒ. චමීර සඳරුවන් මහතාගේ හා කහවත්ත මූලික රෝහලෙහි සේවයේ නියුතු එස්.එම්. මුදිත සමරකෝන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව එය අනුමත කරන ලදී.

**යෝජනා අංක 26**

පුරප්පාඩු කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 69045 දරණ එන්.ජී.යූ.එස්. ප්‍රියංකර සිල්වා මහතා 2025.06.02 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

යෝජනා අංක 26 යටතේ ඉහත සඳහන් යෝජනාව ගරු ලේකම් මහතා විසින් සභාගත කරන ලදී. ඒ අනුව "පුරප්පාඩු කාරකසභික (අධ්‍යක්ෂක මණ්ඩල) ධූරය සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලේ සේවයේ නියුතු සාමාජික අංක 69045 දරණ එන්.ජී.යූ.එස්. ප්‍රියංකර සිල්වා මහතා 2025.06.02 දින සිට පත් කර ගැනීම සුදුසු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය."

මෙම යෝජනාව අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි සේවයේ නියුතු ජී.ඒ. විජේතුංග මහතාගේ හා අනුරාධපුර ශික්ෂණ රෝහලෙහි සේවයේ නියුතු ආර්.එම්. අනුර කුමාර රත්නායක මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව ඒකමතිකව එය අනුමත කරන ලදී.

**යෝජනා අංක 27**

මෙම සමිතියේ 2025 සහ 2026 වර්ෂ වෙනුවෙන් පිට ණය සීමාව රුපියල් මිලියන 1290 විය යුතු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

"මෙම සමිතියේ 2025 සහ 2026 වර්ෂ වෙනුවෙන් පිට ණය සීමාව රුපියල් මිලියන 1290 විය යුතු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය."

ගරු ලේකම් මහතා විසින් යෝජනා අංක 27 යටතේ වන ඉහත සඳහන් යෝජනාව සභාගත කරන ලදී. මෙම යෝජනාව 2025 සහ 2026 අයවැය ඇස්තමේන්තුවට අදාලව නෛතිමය අවශ්‍යතාවය මත යෝජනාව ඉහත සඳහන් ආකාරයට ගරු මහසභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවද පෙන්වා දෙන ලදී. ලේකම් මහතා විසින් සභාගත කරන ලද යෝජනා අංක 27 යටතේ වන ඉහත සඳහන් යෝජනාව වාලච්චේන මූලික රෝහලේ සේවයේ නියුතු එම්. සසීන්ද්‍රා මියගේ හා වාලච්චේන මූලික රෝහලේ සේවයේ නියුතු එම්. කානේශ්වරී මියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහසභාව විසින් අත්පොලොසන් දී ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 28**

මෙම සමිතියේ 2022 වාර්ෂික විගණන වාර්තාවට අනුව ව්‍යවස්ථාපිත වෙන් කිරීම් වලින් පසුව ඉතිරි වන ලාභය වශයෙන් පෙන්නුම් කර තිබෙන රු. 82,478,612.39 ක මුදල් ප්‍රමාණය පහත සඳහන් ආකාරයට බෙදා වෙන් කල යුතු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

| | | | |
|---|---|---|---|
| 1. | සාමාජික කොටස් ලාභාංශ සඳහා | රු. | 37,115,375.58 |
| 2. | සුභසාධක අරමුදල් සඳහා | රු. | 8,247,861.24 |
| 3. | සේවක ප්‍රසාද දීමනා ගෙවීම් සඳහා | රු. | 16,495,722.48 |
| 4 | ශිෂ්‍යත්ව ප්‍රදාන අරමුදල සඳහා | රු. | 8,247,861.24 |
| 5. | ගොඩනැගිලි අරමුදල සඳහා | රු. | 7,423,075.12 |
| 6. | සේවක ණය අරමුදල සඳහා | රු. | 4,123,930.62 |
| 7. | ඉතිරි ලාභය (වෙන් කිරීම් වලින් පසු) | රු. | 824,786.12 |
| | | **රු.** | **82,478,612.39** |

මෙම සමිතියේ 2022 වාර්ෂික විගණන වාර්තාවට අනුව ව්‍යවස්ථාපිත වෙන් කිරීම් වලින් පසුව ඉතිරි වන ලාභය වශයෙන් පෙන්නුම් කර තිබෙන රු. 82,478,612.39 ක මුදල් ප්‍රමාණය පහත සඳහන් ආකාරයට බෙදා වෙන් කල යුතු යැයි මෙම මහසභාව යෝජනා කරන්නීය.

| | | | |
|---|---|---|---|
| 1. | සාමාජික කොටස් ලාභාංශ සඳහා | රු. | 37,115,375.58 |
| 2. | සුභසාධක අරමුදල් සඳහා | රු. | 8,247,861.24 |
| 3. | සේවක ප්‍රසාද දීමනා ගෙවීම් සඳහා | රු. | 16,495,722.48 |
| 4 | ශිෂ්‍යත්ව ප්‍රදාන අරමුදල සඳහා | රු. | 8,247,861.24 |
| 5. | ගොඩනැගිලි අරමුදල සඳහා | රු. | 7,423,075.12 |
| 6. | සේවක ණය අරමුදල සඳහා | රු. | 4,123,930.62 |
| 7. | ඉතිරි ලාභය (වෙන් කිරීම් වලින් පසු) | රු. | 824,786.12 |
| | | **රු.** | **82,478,612.39** |

2022 වර්ෂයේ විගණන වාර්තාවට අනුව ඉතිරි ලාභය විසර්ජනය කිරීමට අදාල ඉහත සඳහන් යෝජනා අංක 28 ලේකම් මහතා විසින් සභාගත කරන ලදී.

ඒ අනුව මහනුවර ජාතික රෝහලෙහි සේවයේ නියුතු වී.වී.කේ. ජයසූරිය මහතාගේ සහ බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහලෙහි සේවයේ නියුතු ප්‍රදීප් මධුසංක මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ලේකම් මහතා විසින් සභාගත කරන ලද යෝජනා අංක 28 ට අනුව 2022 වර්ෂයේ ඉතිරි ලාභය බෙදා වෙන් කිරීම සුදුසු යැයි යෝජනා ස්ථිර කරන ලදී. ඉහත යෝජනා සම්බන්ධයෙන් ප්‍රතියෝජනා හෝ සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව ගරු මහසභාව විසින් අත්පොලොසන් දී පිළිගෙන අනුමත කළහ.

## 10 (ii) පුද්ගල යෝජනා

න්‍යාය පත්‍රානුකූලව 10(i) යටතේ වූ අධ්‍යක්ෂක මණ්ඩල යෝජනා ඉදිරිපත් කිරීම අවසන් වූයෙන් 10(ii) යටතේ පුද්ගල යෝජනා 2025.05.23 දින රැස්වීමේ නිවේදනය මගින් ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන්නද යෝජනා ඉදිරිපත් වී නැති බව ලේකම් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## 11 ආරාධිත අමුත්තන්ගේ සුභ පැතුම්

න්‍යාය පත්‍රානුකූලව මෙම අවස්ථාවේදී ගරු සභාපති මහතා විසින් ආරාධිත සුභපැතුම් එක් කිරීම සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණ නිලධාරී ඩී.ඒ.එස්. සේනාධීර මහතාට ආරාධනය කරන ලදී.

ඒ අනුව අදහස් දැක්වූ එතුමා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමිය ඇතුළු අනිකුත් නිලධාරී වෙනුවෙන් ආයතනය වෙත සුභාශිංශන පිරිනමන ලදී. එමෙන්ම කාර්යාලය පරිගණක ගත කිරීමත් සමග නව තාක්ෂණය උපරිම ලෙස භාවිතා කරමින් ඉතා ඉක්මන් සේවාවක් යටතේ සාමාජිකත්වය සඳහා පහසුකම් සලසා දීමට කටයුතු කර ඇති බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම කතරගම සුවසෙවන නිවාඩු නිකේතනය නිරීක්ෂණය කිරීමට ගිය බවත් එය ජාත්‍යන්තර මට්ටමට සංවර්ධනය විය යුතු බවටත් සාමාජිකත්වයට අවශ්‍ය සියලු පහසුකම් සහිතව එය තවදුරටත් දියුණු තත්වයකට රැගෙන යා යුතු බවත්, මහසභා යෝජනා මගින් ඉදිරිපත් වූ ශාඛා කාර්යාල පිහිටුවීම වඩාත් ඵලදායී යෝජනාවක් වන බවත් පෙන්වා දෙන ලදී. දැනට අවුරුදු කීපයකට පෙර ගත යුතු තීරණයන් 60 වන මහසභා යෝජනා තුළින් වර්තමානයේ සමිතිය විසින් ගෙන ඇති බව වැඩිදුරටත් පෙන්වා දුන් අතර කාර්ය මණ්ඩලය ඉතාමත් කැපවීමෙන් සාමාජික කටයුතු ඉටු කරන බවත් එතුමා විසින් මෙහිදී ප්‍රකාශ කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් සමුපකාර මණ්ඩලයේ හිටපු අධ්‍යාපන හා පුහුණු නිලධාරී ඒ.බී. බුලත්ගම මහතාට සුභපැතුම් එක් කිරීමට ආරාධනය කරන ලදී.

ඒ අනුව අදහස් ප්‍රකාශ කළ එතුමා සමිතියට වසර 87 ක් පිරෙන බවත් පසුගිය දශක දෙක තුනක කාලය තුළ සමිතිය වේගවත් සංවර්ධනයක් කරා ගමන් කර ඇති බැවින් සාර්ථකම සමිතියක් ලෙස සැලකිය හැකි බවත් එමෙන්ම සාමාජිකයින්ගේ අනාගත යහපත උදෙසා 60 වන මහසභාවේ ඉදිරිපත් කර ඇති යෝජනා අගය කරන බවත් සාමාජිකයින් සඳහා 60% ක ලාභයක් වෙන්කර ඇති බවත් සමිතිය ආරක්ෂා කර ගැනීමේ වගකීම සාමාජිකයින් සතු වන බවත් එතුමා වැඩිදුරටත් සඳහන් කල අතර තවදුරටත් සමුපකාර හැඟීමකින් මෙම සමිතියේ කටයුතු ඉදිරියට රැගෙන ගොස් ඉතාමත් සාර්ථක සමිතියක් ලෙස ගොඩනැගීමට අධ්‍යක්ෂක මණ්ඩලය ඇතුළු සියලු දෙනාට ශක්තිය ධෛර්ය ලැබීමට ආශිර්වාද කරන ලෙසත් එතුමා වැඩිදුරටත් සඳහන් කරන ලදී.

## 12 ස්තුති කථාව

සමිතියේ ගරු සභාපති ටී.ජී. බන්දුල ජයකොඩි මහතාගේ ආරාධනයෙන් ලේකම් මහතා විසින් සමිතියේ 60 වන මහසභා රැස්වීමේ කටයුතු අවසන් කිරීම සඳහා සහයෝගය ලබා දුන් සැමට සමිතිය වෙනුවෙන් ස්තුතිය පිරිනමන ලදී. එමෙන්ම අද දින මෙහි පැමිණි උතුරු නැගෙනහිර ඇතුළු දිවයිනේ විවිධ රෝහල් හා සෞඛ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සමිතියේ සාමාජිකත්වය වෙත ද ස්තුතිය පල කරන ලද අතර 60 වන මහසභා රැස්වීම සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර්තුමිය ඇතුළු එම දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්ම මහත්මීන්ටත් සමිතිය වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය පිරිනමන ලදී.

එමෙන්ම සාමාජිකත්වයට මෙම මහසභා රැස්වීම සඳහා සහභාගී වීමට අවශ්‍ය නිවාඩු පහසුකම් අනුමත කර දෙමින් සහයෝගය දැක්වූ දිවයිනේ සියළුම රෝහල් හා සෞඛ්‍ය ආයතනයන්හි ප්‍රධාන නිලධාරී මහත්ම මහත්මීන්ට ද ලේකම් මහතා විසින් මෙහිදී විශේෂ ස්තුතිය පිරිනමන ලදී.

සෞඛ්‍ය සේවයේ විශ්‍රාම ගියද සමිතියේ සියලු කටයුතු සඳහා නිරන්තරයෙන් සහයෝගය ලබා දෙන්නා වූ හිටපු සභාපතිවරු, හිටපු උපසභාපතිවරුන් හා හිටපු ගරු භාණ්ඩාගාරික මහත්වරුන් ඇතුළු හිටපු අධ්‍යක්ෂක මණ්ඩල සභික මහත්ම මහත්මීන්ටත්, ක්‍රියාකාරී සංවිධායක මහත්ම මහත්මීන්ට හා වර්තමාන සංවිධායක මහත්ම මහත්මීන්ට ද මේ අවස්ථාවේදී ස්තුතිය පිරිනමන ලදී.

එමෙන්ම කාර්යාල කටයුතු පරිගණක ගත කිරීම සඳහා දායක වූ ආයතන හා ඒ සඳහා නන් අයුරින් දායකත්වය ලබා දුන් නිලධාරී මහත්ම මහත්මීන්ට ද එම කාර්ය මණ්ඩලයට ද සමිතිය වෙනුවෙන් ස්තුතිය පිරිනමන ලදී.

එමෙන්ම 60 වන මහසභා රැස්වීමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහාය දුන් සියලුම කාර්ය මණ්ඩලයටත් මෙම මහසභාව වෙනුවෙන් මුද්‍රණය කර සාමාජිකත්වය වෙත බෙදා දෙන ලද මහසභා පොත් සිංහල හා දමිළ භාෂාවෙන් මුද්‍රණය කර දීම සඳහා කැප වී කටයුතු කල අපගේම ආයතනයක් වන සසෙත් මුද්‍රණාලයේ සියලුම කාර්ය මණ්ඩලයටත් සමිතිය වෙනුවෙන් ස්තූතිය පිරිනමන ලදී.

අද දින මහසභා රැස්වීමේ කටයුතු දමිළ භාෂාවෙන් පරිවර්ථනය කර දුන් එස්. සත්‍යරාජ් මහතාටත් ස්තූතිය පල කල අතර ඒ තුළින් දමිළ භාෂා සාමාජිකත්වයට පහසුවක් වූ බව ද ලේකම් මහතා විසින් පෙන්වා දෙන ලදී.

එමෙන්ම මෙම මහසභා රැස්වීම සඳහා ශාලා පහසුකම් ලබා දුන් සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගන කළමණාකාරීත්වයටත් රැස්වීමට අවශ්‍ය උපකරණ, ශබ්ද විකාශන හා පරිපාලන යන්ත්‍ර, ආහාරපාන ඇතුළු සියලු පහසුකම් ලබා දුන් එම ආයතන වලටද ස්තූතිය පිරිනමන ලදී.

අද සමිතියේ 60 වන මහසභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා නන් අයුරින් සහය ලබා දුන් සැමට ද හෘදයාංගම ස්තූතිය පලකල ලේකම් මහතා ප්‍රකාශ කර සිටියේ සියලු දෙනා එකට එක්වී ක්‍රියාකර මෙම සමිතියේ අභිවෘද්ධිය පිණිස වැඩ කල යුතු බව වැඩිදුරටත් පෙන්වා දීමෙන් පසු න්‍යාය පත්‍රානුකූලව ගරු මහසභාවේ සියලු කටයුතු අවසන් කිරීම සඳහා ගරු සභාපති මහතා වෙත අවස්ථාව ලබා දෙන ලදී.

ඒ අනුව 60 වන මහසභා රැස්වීම සාර්ථක කර ගැනීම සඳහා අද දින පැමිණි සියලු සාමාජිකත්වයට නැවතත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපති ටී.ජී. බන්දුල ජයකොඩි මහතා විසින් රැස්වීමේ කටයුතු අවසන් කරන බව නිලවශයෙන් දැනුම් දෙන ලදී.

ඩබ්ලිව්.ඒ.ඩී. විමලරත්න
ගරු ලේකම්

ටී.ජී. බන්දුල ජයකොඩි
ගරු සභාපති

සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය

**61 වන සංවත්සර මහසභා රැස්වීම - 2026.03.28**
**මහනුවර, පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ**
**මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගාරය ඇතුළු එම පරිශ්‍රයේදී**

# පාලන වාර්තාව

## 01. ක්‍රියාත්මක කාලය

2023.01.28 වන දින මහනුවර, මධ්‍යම පළාත් හින්දු සංස්කෘතික මධ්‍යස්ථාන ශාලාවේදී පැවති සමිතියේ 58 වන සංවත්සර මහසභා රැස්වීමෙන් අනතුරුව ආරම්භ වන නිල කාලය තුල අපගේ කාර්යභාරය සම්බන්ධයෙන් හා ක්‍රියාත්මක කටයුතු පිළිබඳ 2025.12.31 දක්වා වන තොරතුරු මෙම පාලන වාර්තාවට අන්තර්ගත වේ.

## 02. අධ්‍යක්ෂක මණ්ඩලය

පාලන කාලය තුල මේ වන විට ක්‍රියාත්මක සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය පහත සදහන් මහත්ම මහත්මීන්ගෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ටී.ජී. බන්දුල ජයකොඩි මහතා | - ගරු සභාපති | - ජාතික රෝහල මහනුවර (2026.02.22 දින දක්වා) |
| එච්.එම්. රෝහිත කුමාර හේරත් මහතා | - ගරු සභාපති | - දිසා රෝහල මාවතගම (2026.02.23 දින සිට) |
| පී.ඒ.පී.කේ. පෙරේරා මහතා | - ගරු උපසභාපති | - දිසා රෝහල කඳාන |
| ටී.පී.කේ. සිල්වා මිය | - ගරු භාණ්ඩාගාරික | - ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල ගාල්ල |

**කාරක සභික (අධ්‍යක්‍ෂ මණ්ඩල සභික)**

| | |
|---|---|
| වයි. සරත් සිසිර කුමාර මයා | - ශික්ෂණ රෝහල රත්නපුර |
| එන්.කේ. උෂාන්ත ධර්මසේන මයා | - මූලික රෝහල හොරණ |
| ආර්. වසන්තරාජන් මයා | - ශික්ෂණ රෝහල යාපනය |
| පී. ප්‍රභාකරන් මයා | - ශික්ෂණ රෝහල මඩකලපුව |
| ටී.එම්. ඉසියාස් මීරාල් මයා | - දිස්ත්‍රික් මහ රෝහල වවුනියාව |
| කේ.පී.ඩී.ඩී. විරාජ් ධර්මරත්න මයා | - මූලික රෝහල මහියංගනය |
| ඩී.ඩී.ඒ.එච්. දිසානායක මයා | - ලේ බැංකුව, මහ රෝහල රාගම |
| ඩී.එල්. කමනි දිසානායක මිය | - දකුණු කොළඹ ශික්ෂණ රෝහල කළුබෝවිල |
| ජේ. සුනීතා මිය | - ශික්ෂණ රෝහල කුලියාපිටිය |
| එච්.එම්. තිලක් ගුණරත්න මයා | - ශික්ෂණ රෝහල කුරුණෑගල |
| ඩී.එම්. සංජීව මයා | - ශික්ෂණ රෝහල පේරාදෙණිය |
| ඩබ්ලිව්.ඒ. සුජාතා වික්‍රමසිංහ මිය | - මහ රෝහල පොලොන්නරුව |
| ඩී.එම්. පාලිත සරත් බණ්ඩාර මයා | - ජාතික රෝහල මහනුවර |
| ආර්.එම්. ජයරත්න මයා | - දිස්ත්‍රික් මහ රෝහල නාවලපිටිය |
| එස්.ඒ.එස්.එස්.පී. අජන්තා මයා | - ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය අංගොඩ |
| ඩබ්ලිව්.එම්.ඩී. රත්නායක මයා | - මහ රෝහල මාතර |
| බී. අනුරසිරි ද සිල්වා මයා | - මූලික රෝහල ඇල්පිටිය |
| ඒ.එච්.එම්. සම්පත් සංජීව බණ්ඩාර මයා | - මූලික රෝහල ගල්ගමුව |
| එන්.ඒ.යු.එස්. ප්‍රියංකර සිල්වා මයා | - ශික්ෂණ රෝහල අනුරාධපුර |

මෙම පාලන කාලය තුල අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 55 ක් පවත්වා ඇති අතර එම රැස්වීම් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයේ සාමාන්‍ය 21 කි.

2023.01.28 දින පැවති සමිතියේ 58 වන සංවත්සර මහසභා රැස්වීමෙන් පසු මේ දක්වා ගත වූ පාලන කාලය තුල 2026.02.22 දින සෞඛ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය සමිතියේ ගරු සභාපති ටී.ජී. බන්දුල ජයකොඩි මහතා විසින් සමිතියේ ඉදිරි සංවර්ධනය සඳහා කරන ලද කාර්යභාරය පිළිබඳ අපගේ ගෞරවනීය ස්තූතිය මෙහිලා සනිටුහන් කරමු. එසේම සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩල සභික ධූරයන් හි කටයුතු කරමින් සමු ගන්නා ලද සියළුම අධ්‍යක්ෂක මණ්ඩල සභික මහත්ම මහත්මීන් විසින් ද සමිතියේ කාර්යන් සඳහා ලබාදුන් සහයෝගය හා දක්වන ලද කැපවීම පිලිබඳවද අපගේ ප්‍රශංසනීය වූ ස්තූතිය පිරිනමමු.

## 03. පාලන කාලය ආරම්භ කිරීම

2023.01.28 දින පැවති සමිතියේ 58 වන සංවත්සර මහසභාව හා නිලවරණයෙන් පසු වර්තමාන පාලන කාලය ආරම්භ විය. මෙම පාලන කාලය පිළිබඳ ආවර්ජනය කිරීමේදී සමිතියේ 2019.09.01 සිට 2023.01.27 දක්වා පැවති පූර්ව පාලන කාලය පිළිබඳ සාමාජික ඔබගේ අවධානය යොමු කිරීමට සිදුවන බව සිහිපත් කරමු.

පැවති පූර්ව පාලන කාලය තුල එම නායකත්වයන් විසින් ගෙන ඇති අදූරදර්ශී කළමනාකරණ තීරණයන් හා පාලන දුර්වලතා හේතුවෙන් මෙම පාලන කාලය ආරම්භක අවස්ථාවේදී ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන යෝජනා හෝ

ව්‍යාපෘති පිළිබඳ කිසිදු සැලසුමක් හෝ නිල යෝජනාවලියක් 58 වන සංවත්සර මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට ඔවුන් අපොහොසත් වීම හා පැවති අවිධිමත් භාවය පිළිබඳව 2023.08.26 දින පැවති 59 විශේෂ මහසභාව වෙත ඉදිරිපත් කරන ලද පාලන වාර්තාව තුලින් සාමාජික ඔබ වෙත අප පෙන්වා දෙන ලද බව ද සිහිපත් කරමු.

පූර්ව පාලන කාලය තුල එවැනි කඩාවැටීමක් හා අවිධිමත්භාවයක් පැවතියද සාමාජික ඔබ සැම අප කෙරෙහි විශ්වාසය තබමින් 2023.01.28 දින සිට භාරකරන ලද මෙම පාලන කාලය තුල සාමාජිකත්වයේ දියුණුව හා සංවර්ධන සඳහා සැලසුම් කරන ලද ව්‍යාපෘති හා කළමනාකරණ තීරණයන් පිලිබඳව අප විසින් 2023.08.26 හා 2025.06.21 දිනයන්හි පැවති සමිතියේ 59 හා 60 වන මහ සභා රැස්වීම් මගින් සාමාජික ඔබ වෙත ඉදිරිපත් කිරීමටත්, එම ව්‍යාපෘතින් විධිමත්ව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරන ලදී.

එවන් තත්වයක් තුල ආරම්භ කෙරෙනු මෙම පාලන කාලය ආරම්භයේදී,

- පළමු පියවර ලෙස සමිතියේ පැවති කළමනාකරණ හා පරිපාලන දුර්වලතා කඩිනමින් හඳුනා ගැනීම හා නිවැරදි කිරීමත්,
- අවිධිමත්ව පැවති මුල්‍ය විනය විධිමත් මුල්‍ය පාලනයක් ලෙස නඩත්තු කිරීමත්,
- ණය හා සුභසාධන ක්‍රියාවලියේ අවභාවිතය කාරක නියෝග මාලා විධිවිධානුකූලව ක්‍රියාත්මක කිරීම සිදු කරමින් නැවත සමිතියේ යම් මුල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට මෙහෙයුම් දියත් කරන ලදී.

ඉන් අනතුරුව දෙවන පියවර ලෙස සාමාජික සේවා සැපයීම සිදු වන කාර්යාලයේ පැවති අවිධිමත් පරිපාලන ක්‍රමවේදයන් හා අංශයන් ප්‍රතිසංශෝධනයන් කරමින් කාර්යාලීය කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව පෙර සඳහන් කල ආකාරයට පළමු වර්ෂය ඉහත සඳහන් විධිමත් ක්‍රමවේදයන් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මෙම නව පාලන කාලය ආරම්භයේ සිට වසරක පමණ කාලයක් දැඩි වෙහෙසක් හා කැපකිරීමක් කිරීමට අපට සිදු වූ බවද සාමාජික ඔබ සැමට සිහිපත් කරමු.

දෙවන හා තෙවන පාලන වර්ෂය සමිතියේ සංවර්ධනාත්මක කාර්යයන් උදෙසා යම් යම් පියවරයන් ගැනීම සඳහා වන තීන්දු තීරණයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම පාලනයේ වගකීම භාරගන්නා අවස්ථාව වන විට පැවති දුර්භාග්‍ය වූ තත්වයෙන් සමිතියත්, සාමාජිකත්වයත් නැවත නගා සිටුවීම සඳහා වූ අපගේ නායකත්වය තුල ගන්නා ලද ක්‍රියාමාර්ග හා සැලසුම් පිලිබඳවත් ඒ තුලින් අපේක්ෂිත ප්‍රතිඵලයන් පිළිබඳවත් 2025.06.21 දින පැවති 60 වන මහසභා රැස්වීමේ පාලන වාර්තාව තුලින් හා ඉදිරිපත් කරන ලද නිල යෝජනා මගින් අප සාමාජික ඔබ සැම දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

**ගත වූ මෙම වසර තුනක් වූ පාලන කාලය තුල මනා කළමනාකාරිත්වය තුල ගන්නා ලද තීරණ හා එම සංවර්ධනාත්මක ගමන් මඟෙහි ප්‍රගතිය පිළිබඳ වූ ආවර්ජනය මෙසේ සාරාංශ ගත කොට සාමාජික ඔබ වෙත ඉදිරිපත් කරමු.**

## 01. අප ආයතනයේ ශක්තිමත් අඩිතාලම

දිවයිනපුරා විසිරී සිටින සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සියළුම ශ්‍රේණීන් සේවය කරන මහත්ම මහත්මීන්ගේ සාමාජිකත්වය, අප ආයතනයේ ශක්තිමත් අඩිතාලම වන බව ගෞරවයෙන් සිහිපත් කරමු.

- 1990 වර්ෂය වන විට සාමාජිකයන් 12,931 කින් සමන්විත වූ අතර එය
- 2000 වර්ෂය වන විට සාමාජිකත්වය 23,750 දක්වාත්,
- 2010 වර්ෂය වන විට සාමාජිකත්වය 36,820 දක්වාත්,
- 2020 වර්ෂය වන විට සාමාජිකයන් 62,681 දක්වාත් වර්ධනය විය.
- 2025 දක්වා වූ පසුගිය 05 වසර තුළ 75000 ඉක්මවූ සාමාජිකත්වයක් අපගේ සමිතිය වටා ඒකරාශී විය. මෙම පාලන කාලය තුල පමණක් සමිතිය සමග එක්වූ නව සාමාජික ප්‍රමාණය 11210 කි. මෙම වර්ධනය, අපගේ ක්‍රියාකාරිත්වය සහ සාමාජික සුභසාධන වැඩසටහන් පිළිබඳ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ විශ්වාසය සහ ආදරය මනාව ප්‍රදර්ශනය කරයි.

## 02. මෙම පාලන කාලය තුල සාමාජික හා ආයතනික පොදු සංවර්ධනය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශ වාර්තාවක් පහතින් සඳහන් කරමු.

- කාරක නියෝගයන්ට අනුගත වෙමින් සියලු සාමාජිකත්වය සඳහා සමිතියේ ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම තුලින් කිසිදු පොරොත්තු ලේඛනගත වීමකින් තොරව සුදුසුකම් ලත් අයදුම්පත් සඳහා ණය මුදල් කඩිනමින් ලබා ගැනීමේ පහසුකම් හා අනිකුත් සුභ සාධන සේවා පහසුකම් ලබා ගැනීමේ හැකියාව විධිමත් කිරීම.

- අතුරු ව්‍යවස්ථා ණය යටතේ සාමාජික කාලය වසර 02 ක් සඳහා ඉඩමක් මිලදී ගැනීමට / නිවාස ඉදිකිරීම් හා සංවර්ධනය සඳහා දේපල ණය යටතේ ක්‍රියාත්මක රු. 750,000/- ක් වූ උපරිම ණය සීමාව රුපියල් ලක්ෂ 15 ක් දක්වා පුළුල් කිරීම.

- සාමාජිකත්වය විශ්‍රාම යන අවස්ථාවේදී ලබා ගැනීමට අපේක්ෂිත අන්‍යෝන්‍යාධාර අරමුදල භාවිතා කරමින් ඊට පෙර ඔවුනට අවශ්‍ය කරන ආර්ථික ප්‍රතිලාභ උදෙසා ඇප බැඳුම් රහිතව තම අන්‍යෝන්‍යාධාර අරමුදලේ ශේෂයෙන් 80% ක සීමාව හෝ උපරිම රු. 35,000/- දක්වා අත්තිකාරම් ණය මුදලක් ක්ෂණිකව ලබා ගැනීමේ අවස්ථාව හා පහසුකම් හඳුන්වා දීම.

- සාමාජිකත්වයේ ප්‍රථම දරු ප්‍රසූතිය සඳහා සූදානම් වීමකදී හෝ ප්‍රථම සජීවී දරු උපතින් පසු අවශ්‍ය වන අත්‍යාවශ්‍ය පහසුකම් සපයා ගැනීමට අත්වැලක් වීමේ අරමුණින් සුවදිවි මාතෘ ණය යෝජනා ක්‍රමය නම් නව ණය ක්‍රමයක් ආරම්භ කිරීම. මේ තුලින් 6% ක් වූ සහනදායි පොලි ප්‍රතිශතයක් යටතේ රු. 25,000/- ක උපරිම ණය පහසුකමක් සාමාජික මවට හා පියාට ලබා ගැනීමේ පහසුකම් සලසාදීම.

- රු. 5000/- ක් ව පැවති ඇස්කණ්නාඩි ණය උපරිම ණය සීමාව රු. 15,000/- දක්වා පුළුල් කිරීම තුලින් සාමාජිකත්වය සඳහා සහන සැලසීමට කටයුතු කිරීම.

- වෙළඳපොළට වඩා සුවිශේෂී වට්ටම් පහසුකම් යටතේ සාමාජිකත්වය සඳහා රු. 50,000/- ක උපරිමයකට යටත්ව සාමාජිකත්වයේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා පාසල් පොත්, උපකරණ, සපත්තු, බෑග් ඇතුළු අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා තම පළාතේදීම හෝ තම සේවා ස්ථානයේදීම ණය මුදලක් ලෙස වාරික ගෙවීම් ක්‍රමය යටතේ සිසුදිරිය පාසල් පොත් ණය ව්‍යාපෘතිය මගින් ලබා ගැනීමේ අවස්ථාව සැලසීමට කටයුතු කර ඇත. මෙම පාලන කාලය තුල ප්‍රතිලාභ භුක්තිවිඳින ලද සාමාජික ප්‍රමාණය 63,500 කට අධික වන අතර සාමාජිකත්වය වෙත ලබා දෙන ලද මුළු වට්ටම් පහසුකම් වටිනාකම් රු. මිලියන 70 ක් පමණ වේ.

- සියලු කාරක නියෝග මාලා අනුව ණය හා තැන්පත් ගෙවීමට සමිතියේ මූල්‍ය ස්ථාවරය උපරිම අයුරින් රඳවා තබා ගැනීමට සමිතිය සමත් වී ඇත. එසේම සාමාජික මෙහෙයුම් කටයුතු මෙන්ම ස්ථාවර ආයෝජන සඳහා පෙළඹීමට හා එවැනි ව්‍යාපෘති සඳහා යොමු වීමට සමිතිය මේ වන විට කටයුතු කර ඇති අතර එවැනි ක්ෂේත්‍රයන් පිළිබඳ අවධානය යොමු කරමින් ජාත්‍යන්තර සමුපකාර ව්‍යාපාරය තුල පවතින තත්ත්වයට කාර්යාල හා කාර්යාල ක්‍රම ස්ථාපිත කිරීමටත්, ආයෝජන අවශ්‍යතා සඳහා මූලික පියවර ගැනීමටත් අප විසින් කටයුතු කර ඇත.

- කිසිඳු බාහිර ණයගැතිභාවයකින් තොරව කොළඹට තදාසන්න සමිති කාර්යාලයට යාබද පර්චස් 15.81 ක් වූ ස්ථාවර දේපල වත්කමක් සමිතියේ වර්තමාන හා අනාගත සාමාජිකත්වය සඳහා අත්පත් කර දීමටද මෙම පාලන කාලය තුල අපට හැකි වී ඇත.

- එසේම කිසිඳු බාහිර ණයගැතිභාවයකින් තොරව 75000 කට අධික සාමාජික ගිණුම් හා සේවා කාර්යයන් නිවැරදි හා කාර්යක්ෂම කිරීම සඳහා නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් පරිගණකගත මෘදුකාංග පද්ධතියක් තුල කටයුතු සිදු කිරීම හා ඒ තුලින් වාණිජ බැංකු පද්ධතිය තුල පවතින සේවා ගුණාත්මකභාවය සමුපකාරික ආයතනයක් ලෙස අප ආයතනය තුලින් ද ඉහල නැංවීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කර එහි පහසුකම් මේ වනවිටත් සාමාජිකත්වය වෙත ලබා දීමට කටයුතු කර ඇත.

- 2002 වර්ෂයේ සාමාජික දූදරුවන්ගේ අධ්‍යාපනික දක්ෂතා ඇගයීමේ අරමුණින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්වාධාර යෝජනා ක්‍රමය යටතේ දිරියදරු ප්‍රණාම ශිෂ්‍යත්ව වැඩසටහන ආරම්භ කරන ලදී. ඒ තුලින් අඛණ්ඩව ගෞරවාන්විත ලෙස දූදරුවන්ගේ අධ්‍යාපනික දක්ෂතා ඇගයීමට අපට හැකියාව ලැබිණි.

  පූර්ව පාලන කාල නායකත්වයේ අසාර්ථකත්වය තුල 2019, 2020, 2021 හා 2022 දක්වා වූ ශිෂ්‍යත්වලාභි දක්ෂතා ඇගයීමට විධිමත් වැඩපිළිවෙලක් නොමැති විය. එම ව්‍යාපෘතිය මාස දෙකක් වැනි කෙටි කාලයක් තුල ඌව, මධ්‍යම,සබරගමුව, දකුණ, වයඹ, උතුරු මැද, උතුර, නැගෙනහිර හා බස්නාහිර පළාත් වෙත ගොස් ඇගයීම් උපහාර වැඩසටහන් සිදුකිරීම මෙන්ම ඒ සඳහාද සහභාගිවීමට අපහසු දූදරුවන් වෙත නිවෙස් වෙතට ශිෂ්‍යත්ව ප්‍රදානයන් යොමු කිරීමට කටයුතු කිරීම. ඒ අනුව අධ්‍යන වර්ෂ 04 කට අදාලව සාමාජිකත්වයේ ශිෂ්‍යත්වලාභි දූපුතුන් 4983 දෙනෙකුගේ හා දිරියදරු සිත්තම් ජයග්‍රාහී දූ පුතුන් 160 දෙනෙකුගේ අධ්‍යාපන හා කලා දක්ෂතාවයන් ඇගයීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට අපට හැකිවිය.

  මෙම පාලන කාලයට අදාලව 2023 දිරිය දරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදානයන් එම දූ පුතුන් වෙතට යොමු කිරීමටත් 2024 හා 2025 අධ්‍යන වර්ෂයන්ට අදාළ ශිෂ්‍යත්වලාභී දූපුතුන්ගේ අධ්‍යාපනික හා කලා දක්ෂතා ඇගයීමේ දිරියදරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදානයන් පළාත් මට්ටමින් වූ ගෞරවාන්විත උත්සව සභාවන් තුලදී ඇගයීමට ලක් කිරීමටත්, අප විසින් කටයුතු කරන ලදී. ඒ සඳහා වූ සාමාජික දෙමාපිය ප්‍රසාදය පිළිබඳ අප නිහතමානිව සතුටට පත් වෙමු.

- ඒ අනුව වසර 03 ක් වූ මෙම පාලන කාලය තුල 2019 සිට 2022 දක්වා දූදරුවන් 4983 දෙනෙකු, 2023 වර්ෂයට අදාල දූපුතුන් 1629 දෙනෙකු, 2024 වර්ෂයට අදාලව දූපුතුන් 1630 හා 2025 වර්ෂයට අදාලව දූපුතුන් 1673 දෙනෙකු ඇතුලත්ව අප විසින් ඇගයීමට ලක් කරන ලද සමස්ථ සාමාජික ජයග්‍රාහික දූපුතුන් සංඛ්‍යාව 9915 කි. එමෙන්ම මෙම පාලන කාලය තුල පමණක් ප්‍රදානිත ආධාර මුදල රු. මිලියන 106 කට අධික වේ.

  එසේම මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ මව/පියා දෙදෙනාම සාමාජිකත්වය දරන්නේ නම් එම දෙදෙනා වෙනුවෙන්ම වෙන් වෙන්ව ශිෂ්‍යත්වලාභී දරුවා සඳහා ප්‍රදානයන් පිරිනැමීමට අවශ්‍ය විධිවිධානයන්ද 2025 වර්ෂයේ සිට ක්‍රියත්මක කිරීමට මෙම පාලන කාලය තුල කටයුතු කර ඇති බව සතුටින් සඳහන් කරමු.

- සියළු පළාත් දැඩි ආපදා තත්වයක් ඇති කරන ලද දිට්වා සුළිකුණාටු තත්වය මත අපගේ ආපදාවට පත් වූ 4200 කට අධික සාමාජිකත්වය සඳහා යලි ගොඩනැගීමට යම් අත්වැලක් සපයමින් රු. 10,000/- බැගින් වූ නැවත අය නොකරනු ලබන ආධාර මුදල් ප්‍රදානයන්, හා එම අයගේ අවශ්‍යතාවය අනුව පොලි රහිත

රු. 50,000/- ක ණය මුදලක් ලබා ගැනීමේ පහසුකම් ද තවදුරටත් අවශ්‍ය වන්නේ නම් 6% ක් වූ සහනදායී පොලී ප්‍රතිශතයක් යටතේ රු. 50,000/- ක ණය මුදලක් ලබා ගැනීමේ පහසුකම් සැලසීම. මෙම ව්‍යාපෘතිය සඳහා සාමාජිකත්වය වෙත වෙන් කරන ලද මුදල රු.මිලියන 460 කට අධික වේ

- 2022.12.31 දිනට රාජ්‍ය සේවයේ විශාල පිරිසක් එක්වර විශ්‍රාම යාම මත 500 කට අධික අපගේ සාමාජිකත්වයක්ද සෞඛ්‍ය සේවයෙන් එකවර විශ්‍රාමයාම සිදු විය . එම විශ්‍රාමික සාමාජිකත්වය සඳහා අවසන් ගෙවීම් කඩිනමින් ලබා දීම සඳහා පූර්ව පාලන කාලය තුල ආයතනික විධිමත් ක්‍රමවේදයක් නොතිබිණි. ඒ අනුව විශ්‍රාමාධාර යෝජනා ක්‍රමයේ පහසුකම් ලබා ගැනීම සහිතව තම අවසන් ගෙවීම් ලබා ගැනීම සඳහා 500 කට අධික පොරොත්තු ලේඛනයක රැඳී සිටීමට එම සාමාජිකත්වයට සිදු විය. අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වූ එම විශ්‍රාමික සාමාජිකත්වය සඳහා අපගේ පාලන කාලය ආරම්භ වීමත් සමඟම කඩිනම් මැදිහත්වීම හා ආයතනික ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම තුල පොරොත්තු ලේඛන ක්‍රමය අවසන් කිරීමට හැකි විය.

- සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීමේ අරමුණින් නෛතික විධිවිධාන පරිදි සමුපකාර අරමුදල සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු දායකත්වයන් 2019 විගණන වාර්තාවට අනුව ගෙවීම් කිරීම පූර්ව පාලන නායකත්වයන් විසින් පැහැරහැර තිබුනද, ඒ සම්බන්ධයෙන් සමිතියේ හා සාමාජිකත්වයේ පවතින වගකීම් නිදහස් කරමින් සමුපකාර අරමුදල සඳහා 2019 සිට 2022 වර්ෂය දක්වා වූ අවසන් විගණන වාර්තාව දක්වා ගෙවිය යුතු රු. මිලියන 29 කට අධික දායකත්වයන් ගෙවීම් සැලසුමකට අනුව ගෙවා අවසන් කිරීමට මෙම පාලන කාලය තුල සමිතිය විසින් කටයුතු කර ඇත.

- පූර්ව පාලන කාලය තුල ණය අය නොවීම් සම්බන්ධයෙන් ගත යුතු කාර්යාලීය ක්‍රමවේදයන් අක්‍රිය කර තිබූ බැවින් සමිතියට සිදුව ඇති මූල්‍ය අලාභයන් පිලිබඳවත් සාමාජික මුදල් සම්බන්ධයෙන් වගකීම් විරහිතව කටයුතු කිරීම පිලිබඳවත් අවධානය යොමු කරමින් ණය අයවීම් විමර්ශන ඒකකයක් කාර්යාලය තුල ස්ථාපිත කිරීමට මෙම පාලන කාලය තුල කටයුතු කර ඇත. ඒ තුලින් නියමිත පියවරයන් අනුගමනය කරමින් අය නොවූ සාමාජික ණය මුදල් රු. ලක්ෂ 500 කට අධික මුදලක් නැවත අයකර ගැනීමට පියවර ගෙන ඇත.

- ආර්ථිකය තුල සිදු වන විචලනයන් තුල ආයතනය සඳහා සැලකිය යුතු බලපෑමක් අඛණ්ඩව සිදු කරනු ලබන විදුලි වියදම අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම හඳුනා ගනිමින් ප්‍රධාන කාර්යාලය සඳහා සූර්යපැනල විදුලි බල සැපයීම එක්කර ගැනීමටත්, ඒ තුලින් වැඩි වන විදුලි බිල අවම කර ගැනීම සඳහා සාර්ථක හා ඵලදායි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

- දුරකථන සේවාව මගින් සමිතියේ කාර්යයන් ඉටු කර ගැනීම තව දුරටත් පහසුකරමින් (Zip Transer) ස්වයංක්‍රීය දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීම. ඒ තුලින් සාමාජිකත්වය සඳහා දුරකථන ක්‍රියාකරුගේ සහය නොමැතිව සෘජුව අදාළ අංශ වෙත යොමු වීමට පහසුකම් සැලසීම.

- දිවයිනේ පළාත් සාමාජිකත්වය සඳහාත්, අධ්‍යක්ෂක මණ්ඩලය, කාර්ය මණ්ඩලය සඳහාත්, මෙම පාලන කාලය තුල අවස්ථා කිහිපයකදී සාමාජික සේවා හා ආයතනික ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කිරීමේ කණ්ඩායම් වැඩමුළු පවත්වමින් දැනුම හා අවබෝධය ලබා දෙමින් සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ නිරන්තරයෙන් අනිකුත් සාමාජිකත්වය දැනුවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

- වර්තමාන හා අනාගත සාමාජිකත්වයේ සාමාජික වගකීම්, යුතුකම් හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන නෛතිකභාවය ශක්තිමත් කිරීම සඳහා වන කාර්යයන් ආරම්භ කිරීම.

- එසේම විවිධ පාසල් සංවර්ධනය, විවිධ රෝහල් සඳහා සුභසාධන දායකත්වයන්, ක්‍රීඩා දක්ෂතාවයන් දිරිගැන්වීම, පළාත් හා රෝහල් මට්ටමින් සංවිධානය කරන ලද විවිධ සුභසාධන අංශ කාර්යයන්, ආගමික අවස්ථාවන් සඳහාද දායකත්වය ලබා දෙමින් මෙම පාලන කාලය තුල සමිතියක් ලෙස අපගේ ප්‍රජා සංවර්ධන දායකත්වයන් ලබා දීමට ද කටයුතු කර ඇත.

## 03. සාමාජික ණය උපරිම සීමාව

වසර 08 ක පමණ කාලයක් පැවති රු. 750,000/- ක් වූ සාමාජික ණය උපරිම සීමාව වසර 03 ක් වූ මෙම වර්තමාන පාලන කාලය තුල එකවර දෙගුණයක් ලෙස පුළුල් කරමින් 2025 වසරේ සිට රු. ලක්ෂ 15 දක්වා ඉහළ නැංවීම සමිතියේ ශක්තිමත් පාලන දක්ෂතාවයත්, දිගුකාලීන දැක්මත් පෙන්වන සුවිශේෂී ජයග්‍රහණයක් වේ.

මෙම වර්ධනය තුළින් සාමාජිකයන්ගේ පුද්ගලික ආර්ථික කටයුතු ශක්තිමත් කරමින්, ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා මහඟු දායකත්වයක් ලබාදීමට සමිතියට හැකිවී ඇත. එමගින් සමිතිය සාමාජිකත්වයේ විශ්වාසය හා සහයෝගය මත ගොඩනැගුණු ශක්තිමත් ආර්ථික ආයතනයක් ලෙස අද දිනත් ගෞරවයෙන් ඉදිරියට පියවර තබමින් සිටී.

1938 දී ආරම්භ වූ සමිතිය, වසර 88 ක දිගු කාලය තුළ සමාජ, ආර්ථික සහ ව්‍යාපාරික පරිසරයේ විවිධ උච්ඡාවචනයන්ට මුහුණ දුන්නද, ආරම්භයේ සිට පැවති වාර්ෂික 12% ක් වූ සහනදායී ණය පොලී අනුපාතිකය අඛණ්ඩව පවත්වාගෙන යමින් සාමාජිකත්වයට ලබාදෙන ණය උපරිම සීමා වර්ධනය කිරීමට හැකිවීම ද සමිතියේ විශේෂත්වයක් ලෙස සිහිපත් කල හැක.

- ආරම්භය : 1938
- කාලය : වසර 88
- වාර්ෂික ණය පොලී අනුපාතිකය : 12% (අඛණ්ඩව)
- සාමාජිකත්වයට ලබාදෙන ණය උපරිම සීමාව : රු. ලක්ෂ 15 දක්වා අඛණ්ඩ වර්ධනයක්

## 04. සාමාජික ඔබ වෙනුවෙන් මේ වන විට ක්‍රියාත්මක සේවා පහසුකම් - ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම හා සුභ සාධන යෝජනා ක්‍රම

01. අතුරු ව්‍යවස්ථා ණය යෝජනා ක්‍රමය
    - පුද්ගල ඇප මත රු. ලක්ෂ 5 ක්
    - පුද්ගල හා දේපල ඇප මත රු. ලක්ෂ 15 ක්

02. ක්ෂණික ණය යෝජනා ක්‍රමය
    - මාස 06 ක සාමාජික කාලය සඳහා රු. 75,000/- ක්
    - මාස 12 ට වැඩි සාමාජික කාලය සඳහා රු. ලක්ෂයක්

    මෙම ක්ෂණික ණය මුදල රු. ලක්ෂ 2 දක්වා වූ උපරිම සීමාවක් දක්වා පුළුල් කිරීමේ නිල යෝජනාවක්ද මෙම 61 වන සංවත්සර මහ සභාව වෙත යොමු කර ඇත.

03. භාණ්ඩ ණය යෝජනා ක්‍රමය
    - විදුලි උපකරණ / ජංගම දුරකථන /කෘෂි උපකරණ ඇතුළු ගෘහ උපකරණ සඳහා රු. ලක්ෂ 03 ක්
    - ස්වර්ණාභරණ සඳහා රු. ලක්ෂ 03 ක්

04. අන්‍යෝන්‍යාධාර ණය මුදල
    - තම අන්‍යෝන්‍යාධාර අරමුදලේ ශේෂයෙන් 80 % ක් දක්වා ඇප බැඳුම් රහිතව උපරිම රු. 35000/- ක් දක්වා ක්ෂණික ණය පහසුකම්

05. සුවදිවි මාතෘ ණය යෝජනා ක්‍රමය
    - පළමු සජීවී දරු උපතක් සඳහා 6% ක සහනදායී පොලී ප්‍රතිශතයක් යටතේ රු. 25,000/- ක ණය මුදලක්

06. ඇස් කණ්නාඩි ණය යෝජනා ක්‍රමය
    - වසරක සාමාජික කාලයක් සපුරා ඇත්නම් රු. 15,000/- ක ණය මුදලක්

07. ක්‍රියාත්මක සුභ සාධන යෝජනා ක්‍රම
    - අන්‍යෝන්‍යාධාර යෝජනා ක්‍රමය
    - විශ්‍රාමාධාර යෝජනා ක්‍රමය
    - ශිෂ්‍යත්වාධාර යෝජනා ක්‍රමය
    - අවමංගල්‍යාධාර යෝජනා ක්‍රමය
    - සුවසෙනෙහස ළමා ඉතුරුම් ගිණුම් ක්‍රමය
    - සිසුදිරිය පාසල් පොත් හා උපකරණ ණය යෝජනා ක්‍රමය
    - සුවසෙවන නිවාඩු නිකේතන පහසුකම්
    - සසෙත් මුද්‍රණාල සේවා පහසුකම්
    - සමුපකාර රක්ෂණ නියෝජිත සේවා පහසුකම්

➢ **අතුරු ව්‍යවස්ථා ණය යෝජනා ක්‍රමය**
- පුද්ගල ඇප මත සාමාජික කාලය අනුව මෙම ණය මුදල ලබා ගැනීමේ හැකියාව පවතින අතර මේ වන විට සාමාජික කාලය වසර 06 සඳහා පුද්ගල ඇප මත ක්‍රියාත්මක උපරිම ණය සීමාව රු. ලක්ෂ 5 ක් වේ.

- සාමාජික කාලය වසර 02 ක් සඳහා ඉඩමක් මිලදී ගැනීම/නිවාස අලුත්වැඩියා/නිවාස තැනීම වෙනුවෙන් පුද්ගල ඇප හා දේපල ඇප මත ක්‍රියාත්මක උපරිම ණය සීමාව රුපියල් ලක්ෂ 15 ක් දක්වා පුළුල් කිරීමට මෙම පාලන කාලය තුල දී කටයුතු කිරීමට හැකි වී ඇත.

➢ **ක්ෂණික ණය යෝජනා ක්‍රමය**
- සාමාජිකත්වයේ හදිසි මුදල් අවශ්‍යතා සඳහා ඉතා කෙටි වේලාවක් තුල මෙම ණය පහසුකම ලබා ගත හැක. 1998 වර්ෂයේදී රු. 5000/- ක ණය උපරිමයකින් ආරම්භ කරන ලද ක්ෂණික ණය යෝජනා ක්‍රමය පියවරින් පියවර වර්ධනය කරමින් අද වන විට උපරිම රු.100,000/- දක්වා පුළුල් කර ඇත. මෙය සාමාජිකත්වය අතර ඉතා ආකර්ෂණීය ණය යෝජනා ක්‍රමයකි.

- මාස 06 ක සාමාජික කාලය සඳහා රු. 75,000/-
- මාස 12 ට වැඩි සාමාජික කාලය සඳහා රු. 100,000/-

  මෙම ක්ෂණික ණය යෝජනා ක්‍රමය යටතේ උපරිම ණය සීමාව රු. ලක්ෂ 2 දක්වා පුළුල් කිරීමට අපේක්ෂිත බැවින් ඒ සඳහා වන නිල යෝජනාව මෙම 61 වන සංවත්සර මහසභාව වෙත ඉදිරිපත් කර ඇත.

➢ **භාණ්ඩ ණය යෝජනා ක්‍රමය**
2002 වර්ෂයේදී සාමාජිකත්වය සඳහා හඳුන්වා දුන් මෙම භාණ්ඩ ණය යෝජනා ක්‍රමයේ ආරම්භක ණය උපරිමය රු. 50,000/- කි. ඉන් අනතුරුව ගත වූ කාලය තුල ණය උපරිම සීමාව රු. 100,000/-, රු. 150,000/- හා රු. 200,000/- ලෙස පුළුල් වෙමින් පැමිණ අද වන විට භාණ්ඩ ණය ලබා ගැනීමේ උපරිම ණය සීමාව රු. 300,000/- දක්වා වර්ධනය වී ඇත. ඒ තුලින් සාමාජිකත්වය සඳහා නිවසට අවශ්‍ය විදුලි උපකරණ, ජංගම දුරකථන, කෘෂි උපකරණ ඇතුළු ගෘහ උපකරණ මෙන්ම ස්වර්ණාභරණ ලබා ගැනීමේ හැකියාව පවතී.

**සාමාජිකත්වය වෙනුවෙන් පසුගිය කාලය තුල විවිධ ණය යෝජනා ක්‍රම යටතේ ප්‍රදානිත ණය පිළිබඳ තොරතුරු**

(රුපියල් මිලියන වලින්)

| කාලය | අතුරු ණය | භාණ්ඩ ණය | ක්ෂණික ණය |
|---|---|---|---|
| 2006 සිට 2010 දක්වා | 3299 | 484 | 1112 |
| 2011 සිට 2015 දක්වා | 4948 | 555 | 2373 |
| 2016 සිට 2020 දක්වා | 10752 | 1440 | 4215 |
| 2021 සිට 2025 දක්වා | 21798 | 3346 | 5359 |

➢ **අන්‍යෝන්‍යාධාර ණය යෝජනා ක්‍රමය**
මෙම පාලන කාලය තුල හඳුන්වා දෙන ලද අන්‍යෝන්‍යාධාර ණය යෝජනා ක්‍රමය යටතේ සාමාජිකත්වය විසින් විශ්‍රාම යන අවස්ථාවේදී ලබා ගැනීමට අපේක්ෂිත අරමුදල් භාවිතයෙන් ඊට පෙර ඔවුන් අපේක්ෂා කරන ආර්ථික ප්‍රතිලාභ උදෙසා තම ස්වකීය අන්‍යෝන්‍යාධාර අරමුදල භාවිතා කරමින් ඇප බැඳුම් රහිතව තම අරමුදලේ ශේෂයෙන් 80% ක සීමාව තුල උපරිම රු. 35,000/- දක්වා අත්තිකාරම් ණය මුදලක් ක්ෂණිකව ලබා ගැනීමේ පහසුකම් සාමාජිකත්වය වෙත සලසා ඇත.

➢ **සුවදිවි මාතෘ ණය යෝජනා ක්‍රමය**
නව යෝජනා ක්‍රමයක් ලෙස මෙම පාලන කාලය තුල ආරම්භ කරන ලද මෙම ණය ක්‍රමය තුලින් සාමාජිකත්වයේ ප්‍රථම දරු ප්‍රසූතිය සඳහා සුදානම් වීමකදී හෝ ප්‍රථම සජීවී දරු උපතින් පසු අවශ්‍ය වන අත්‍යාවශ්‍ය පහසුකම් සපයා ගැනීමට අත්වැලක් වීමේ අරමුණින් මෙම සුවදිවි මාතෘ ණය යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මේ තුලින් 6% ක් වූ සහනදායී පොලී ප්‍රතිශතයක් යටතේ රු. 25,000/- ක උපරිම ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව පවතී.

## 05. සාමාජික තැන්පතු වර්ධනය

සාමාජික මහත්ම මහත්මීන්ගේ මුදල් ඉතුරු කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ ඔවුන් සකසුරුවමට හුරු කිරීමේ අරමුණින්, සාමාජිකත්වය සඳහා තැන්පතු වර්ග 03ක් හඳුන්වා දී ඇත.

- ස්ථාවර තැන්පතු
- ඉතුරුම් තැන්පතු
- විශේෂ ඉතුරුම් තැන්පතු

මෙම වර්ග හඳුන්වා දීමෙන් පසු, සාමාජිකත්වය ඉතුරුම් තැන්පතු සඳහා වැඩි උනන්දුවක් දැක්වූ අතර, පසුගිය වසර වල තැන්පතු වර්ධනය වීම කැපීපෙනෙන ලෙස වර්ධනය වී ඇත

| වර්ෂය | මුළු තැන්පතු (රු. මිලියන) |
|---|---|
| 2010 | 433 |
| 2014 | 687 |
| 2018 | 1242 |
| 2022 | 1948 |
| 2023 | 2171 |
| 2024 | 2215 |

➢ **අන්‍යෝන්‍යාධාර යෝජනා ක්‍රමය හා විශ්‍රාමාධාර යෝජනා ක්‍රමය**
1979 වර්ෂයේදී අන්‍යෝන්‍යාධාර අරමුදල හා 1998 වර්ෂයේදී විශ්‍රාමාධාර යෝජනා ක්‍රමයේ අරමුදල ආරම්භ කරන ලදී. සාමාජික අභිවෘද්ධිය වෙනුවෙන්ම නිර්මිත මෙම ආධාර යෝජනා ක්‍රම යටතේ වන අරමුදල් වල දියුණුව හා ව්‍යාප්තිය මඟින් ප්‍රකට කරනුයේ සාමාජිකත්වයේ ආර්ථික සුරක්ෂිතතාවය ඇති කරනු පිණිස සමිතිය පෙන්නුම් කරන මාහැඟි දායකත්වයයි.

අන්‍යෝන්‍යාධාර අරමුදල සඳහා දායක වීමේ සාමාජික කාලය හා දායකත්වයට අනුව මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානයන් ලබා ගැනීමේ හැකියාව පවති.

එසේම විශ්‍රාමාධාර යෝජනා ක්‍රමය යටතේ ස්ථාවර වූ කුඩා ඉතුරුම් මුදලින් දායකත්වය ලබා දෙමින් විශ්‍රාම යන අවස්ථාවේදී ප්‍රදානයක් සහිතව පිරිනැමේ. 2002 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය සංශෝධනය කරමින් එක් සාමාජිකයකු සඳහා විශ්‍රාමාධාර රු. 200,000/- ක උපරිමයක් දක්වා වැඩි කරන ලදී. එමෙන්ම

සාමාජිකත්වයේ විශේෂ ඉල්ලීම පරිදි 2019.09.01 දින සිට වයස අවුරුදු 50 ට නොඅඩු සියලු සාමාජිකත්වය සඳහා ද මෙම යෝජනා ක්‍රමයට දායක වීමේ හැකියාව හා ප්‍රතිලාභයන් පුළුල් කිරීමට කටයුතු කර ඇත.

**අන්‍යෝන්‍යාධාර යෝජනා ක්‍රමය හා විශ්‍රාමාධාර ප්‍රදානිත මුදල්**

(රුපියල් මිලියන වලිනි)

| වර්ෂය | අන්‍යෝන්‍යාධාර ප්‍රදාන පිරිනැමීම | විශ්‍රාමාධාර ප්‍රදාන පිරිනැමීම |
|---|---|---|
| **2005** | **1.5** | **10** |
| **2010** | **4.6** | **16.7** |
| **2015** | **9** | **21** |
| **2020** | **17** | **36** |
| **2025** | **35** | **46** |

- **"දිරියදරු ප්‍රණාම" ශිෂ්‍යත්ව ප්‍රදානය**

අප සාමාජිකත්වයේ දූවා දරුවන්, පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වන හා විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන අවස්ථාවල ඔවුන් තවදුරටත් ඉදිරි අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දිරිගැන්වීමට සහ ඔවුන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණ හා කුසලතා අගයනු වස් 2002 වර්ෂයේදී ආරම්භ කල මෙම සමාජ සංවර්ධන හා සුභ සාධන වැඩසටහන සමස්ථ සාමාජිකත්වය අතරත් බෙහෙවින්ම ජනප්‍රිය වී ඇත.

ආරම්භයේ සිට වසරක් පාසා පවත්වාගෙන එනු ලබන "දිරිය දරු ප්‍රණාම" ශිෂ්‍යත්ව උපහාර උත්සව මෙලෙස සාර්ථකව හා උත්කර්ෂවත් ලෙස පැවැත්වීම තුලින් අපද නිහතමානි වූ සතුටක් ලබන්නෙමු. අප සමිතියේ සාමාජික මහත්ම මහත්මීන් තම දූවාදරුවන් ද සමඟ මෙම වැඩසටහනට පැමිණෙන්නේ හුදෙක් ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා වෙන්ම නොව මෙහි ඇති ගුණාත්මක භාවයද සැලකිල්ලට ගනිමින් බව අත්දැකීමෙන්ම දනිමු එහි ප්‍රතිලාභයන්. දූවාදරුවන් කෙරෙහි බෙහෙවින්ම නිර්මාණශීලිව ලබා දෙන්නට හැකිවූ ආකාරයත්, එමඟින් අප ආයතනයට හිමි වන ගෞරවාන්විත වූ ප්‍රසාදයත් වචනයෙන් විස්තර කල නොහැකි තරම්ය.

පූර්ව පාලන කාල නායකත්වයේ අසාර්ථකත්වය තුල 2019, 2020, 2021 හා 2022 දක්වා වූ ශිෂ්‍යත්වලාභී දක්ෂතා ඇගයීමට විධිමත් වැඩපිළිවෙලක් නොමැති විය. එම ව්‍යාපෘතිය මාස දෙකක් වැනි කෙටි කාලයක් තුල ඌව, මධ්‍යම,සබරගමුව, දකුණ, වයඹ, උතුරු මැද, උතුර,නැගෙනහිර හා බස්නාහිර පළාත් වෙත ගොස් ඇගයීම් උපහාර වැඩසටහන් සිදු කිරීම මෙන්ම ඒ සඳහාද සහභාගිවීමට අපහසු දූදරුවන් වෙත නිවෙස් වෙතට ශිෂ්‍යත්ව ප්‍රදානයන් යොමු කිරීමට කටයුතු කිරීමට අප විසින් කටයුතු කරන ලදී. ඒ අනුව අධ්‍යයන වර්ෂ 04 කට අදාලව සාමාජිකත්වයේ ශිෂ්‍යත්වලාභී දූපුතුන් 4983 දෙනෙකුගේ හා දිරියදරු සිත්තම් ජයග්‍රාහී දු පුතුන් 160 දෙනෙකුගේ අධ්‍යාපන හා කලා දක්ෂතාවයන් ඇගයීමට අවශ්‍ය කටයුතු සාර්ථකව සිදු කිරීමද මෙම පාලන කාලය තුල සිදු කරන ලදී.

ඉන් අනතුරුව මෙම පාලන කාලයට අදාලව 2023 දිරියදරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදානයන් එම දු පුතුන් වෙතට යොමු කිරීමට ද කටයුතු කරන ලදී. සාමාජික ඔබගේ දියණියගේ, පුතණුවන්ගේ මෙම අධ්‍යාපනික දක්ෂතා ඇගයීම් උත්සව අවස්ථාව සඳහා දැඩි උද්යෝගයෙන් හා ආඩම්බරයෙන් ඔබ - ඔබේ පවුලේ සාමාජිකයින්ද එක් කර ගැනීමට කටයුතු කරන ආකාරය අප වසර කිහිපයක් පුරා අත්දැකීමෙන් දන්නා කරුණකි.

එහෙත් පවතින ආර්ථික තත්ත්වය තුල කොළඹට පැමිණීමට පවතින ආර්ථික හා අනිකුත් පහසුකම් සපයා ගැනීම සඳහා පවතින ප්‍රායෝගික අපහසුතාවයන් වලින් ඔබ යම් පීඩාවකට පත් වන්නේ නම් ඒ සඳහාද සහනයක් වෙමින් 2024 හා 2025 අධ්‍යයන වර්ෂයන්ට අදාළ ශිෂ්‍යත්වලාභී දූපුතුන්ගේ අධ්‍යාපනික හා කලා දක්ෂතා ඇගයීමේ දිරියදරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදානයන් පළාත් මට්ටමින් වූ ගෞරවාන්විත උත්සව සභාවන් තුලදී ඇගයීමට ලක් කිරීමටත් අප විසින් කටයුතු කරන ලදී. ඒ සඳහා වූ සාමාජික දෙමාපිය ප්‍රසාදය පිළිබඳ අප නිහතමානිව සතුටට පත් වෙමු.

2025 වර්ෂයේ සංවිධානය කරන ලද පළාත් දිරියදරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සව අවස්ථා සඳහා අපගේ ගෞරවනීය ආරාධනය පිළිගනිමින් තම වටිනා කාලය මෙම දූදරුවන් වෙනුවෙන් නිර්ලෝභීව වෙන් කරමින් හා එම ජයග්‍රාහී දූවා දරුවන් ධෛර්යමත් කල හා සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ඇගයීමට ලක් කරන ලද සපැමිණි සියළුම ගෞරවනීය ආරාධිත අමුත්තන්ද ස්තුති පූර්වකව සිහිපත් කරමු.

දිරියදරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන මඟින් ගත වූ වසර 23 ක කාලය තුල සාමාජිකත්වයේ දූවා දරුවන් 18,360 දෙනෙකුගේ අධ්‍යාපනික දක්ෂතාවයන් ඇගයීමට ලක් වූ අතර ඒ සඳහා පිරිනමන ලද සමරු තිළිණ, ප්‍රණාම පත්‍ර, සුවසෙනෙහස ළමා ඉතුරුම් ගිණුම් වලට අතිරේකව පිරිනමන ලද මූල්‍යමය ආධාර මුදල රු. මිලියන 187.4 කි.

ඒ අනුව වසර 03 ක් වූ මෙම පාලන කාලය තුල 2019 සිට 2022 දක්වා දූදරුවන් 4983 දෙනෙකු, 2023 වර්ෂයට අදාලව දූපුතුන් 1629 දෙනෙකු, 2024 වර්ෂයට අදාලව දූපුතුන් 1630 හා 2025 වර්ෂයට අදාලව දූපුතුන් 1673 දෙනෙකු ඇතුලත්ව අප විසින් ඇගයීමට ලක් කරන ලද සමස්ත සාමාජික ජයග්‍රාහික දූපුතුන් සංඛ්‍යාව 9915 කි. එම අය වෙත පිරිනමන ලද සමරු තිළිණ, ත්‍යාග, ප්‍රණාම පත්‍ර, සුවසෙනෙහස ළමා ඉතුරුම් ගිණුම් වලට අතිරේකව පිරිනමන ලද මූල්‍යමය ආධාර මුදල රු. මිලියන 106 කට අධිකවේ.

මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ මව/පියා දෙදෙනාම සාමාජිකත්වය දරන්නේ නම් එම දෙදෙනා වෙනුවෙන්ම වෙන් වෙන්ව ශිෂ්‍යත්වලාභී දරුවා සඳහා ප්‍රදානයන් පිරිනැමීමට අවශ්‍ය විධිවිධානයන්ද 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට මෙම පාලන කාලය තුල කටයුතු කර ඇත.

(රුපියල් මිලියන වලින්)

| වර්ෂය | ශිෂ්‍යත්වලාභී දූ දරුවන් සංඛ්‍යාව | ප්‍රදානිත මුළු මුදල (රු.මිලියන) |
|---|---|---|
| 2002 සිට 2006 දක්වා | 1075 | 2.3 |
| 2007 සිට 2011 දක්වා | 2439 | 10.8 |
| 2012 සිට 2016 දක්වා | 3325 | 25.7 |
| 2017 සිට 2020 දක්වා | 3665 | 42.6 |
| 2021 සිට 2025 දක්වා | 7851 | 106.0 |

- **දිරිය දරු සිත්තම් ව්‍යාපෘතිය**

සාමාජිකත්වයේ දූ දරුවන්ගේ කලා හැකියාවන් ඔප්නැන්වීමත්, දිරිගැන්වීමත් අරමුණු පෙරදැරිව විවිධ වයස් කාණ්ඩ යටතේ සංවිධානය කල දිරියදරු සිත්තම් චිත්‍ර තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන සිත්තම්, ප්‍රවීණ චිත්‍ර කලා ආචාර්ය මණ්ඩලයකින් සමන්විත විනිසුරු මඩුල්ලකගේ නිර්දේශ මත ජයග්‍රාහී දූ පුතුන්ව තෝරා ගැනීමට අපට හැකි වී ඇත.

මෙහිදී වයස් කාණ්ඩ 4 ක් යටතේ ප්‍රථම ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා තෝරා ගැනීමක් සිදු කිරීමටත් ඒ අනුව මේ වන විට සාමාජික දූ දරුවන් 400 දෙනෙකුගේ කලා හැකියාවන් ඇගයීමට ලක් කිරීමට අපට හැකි වී ඇත. මෙම කාර්යයේදී සාමාජික මාපියන් තුලත්, එම දූදරුවන් තුලත් පැවති උනන්දුව හා උද්යෝගයද මෙහිදී විශේෂයෙන් සිහිපත් කල යුතු වේ.

එමෙන්ම සෑම වයස් කාණ්ඩයකටම අදාල ප්‍රථම දෙවන හා තෙවන ස්ථාන දිනාගත් දූ පුතුන්ගේ සිත්තම් ඇතුලත් කරමින් 2017 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා සමිතිය විසින් නිකුත් කරනු ලබන දින දර්ශන දිවයිනේ බොහෝ සාමාජිකත්වයේ ඇගයීමට ලක්විය. එමෙන්ම ජයග්‍රාහී දූ පුතුන් සඳහා මුල්‍යමය ත්‍යාගයන්, සහතික පත්‍ර හා තිළිණ ප්‍රදානයන් සිදු කරමින් දිරියදරු ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සව අවස්ථාවන්හිදී සුවිශේෂී වූ එම කලා හැකියාවන් ඇගයීමට පාත්‍ර කිරීමට අප කටයුතු කර ඇත.

- **සාමාජිකත්වයට ජීවිතයේ අසීරුම මොහොතේ ශක්තිමත් අත්වැලක් වීම**

2004 වර්ෂයේදී ආරම්භ කරන ලද අවමංගල්‍යාධාර යෝජනා ක්‍රමය, සාමාජිකත්වයට සහ ඔවුන්ගේ පවුල් වලට අනපේක්ෂිත වියෝවකදී සහන සැලසීමේ උත්තරීතර අරමුණින් 2004.03.01 දින සිට ක්‍රියාත්මක විය. සංවේදීත්වය, මානුෂීයත්වය හා සමාජීය වගකීම මූලික කරගත් මෙම වැඩසටහන, කාලයත් සමඟ සාමාජිකත්වයේ විශ්වාසය දිනාගත් ශක්තිමත් ආරක්ෂණ පද්ධතියක් බවට පත්ව ඇත.

2004.03.01 සිට 2025.12.31 දක්වා වූ වසර 21කට අධික කාලය තුළ, මියගිය අප සාමාජික මහත්ම මහත්මීන් 900 කට අධික සංඛ්‍යාවක් සහ ඔවුන්ගේ යැපෙන්නන් 39,000 කට අධික පිරිසක් වෙනුවෙන් රුපියල් මිලියන 800 කට අධික මුදලක් අවමංගල්‍යාධාර ප්‍රදානයන් ලෙස පිරිනැමීම තුලින් මෙම යෝජනා ක්‍රමය මගින් සාමාජිකත්වයට හා එම යැපෙන්නන් සඳහා සිදු කර ඇති සේවය පැහැදිලි වේ.

සාමාජිකත්වයටත් ඔවුන්ගේ පවුල් වලටත් නොසිතූ මොහොතක සිදුවන විපතකදී වඩාත් ශක්තිමත්ව සහන ලබාදීමේ අරමුණින්, මෙම යෝජනා ක්‍රමය යටතේ පිරිනමනු ලබන ප්‍රදානයන් කැපී පෙනෙන ලෙස වැඩි කරමින්, 2018.08.01 දින සිට නව පුළුල් හිමිකම් ආවරණ ක්‍රම රැසක් හඳුන්වා දෙන ලදී.

අවමංගල්‍යාධාර යෝජනා ක්‍රමය යනු මුදල් ප්‍රදානයක් පමණක් නොව, සාමාජිකයා සහ ඔහුගේ පවුල අසරණ නොවන බවට දෙන විශ්වාසයේ සහ ආරක්ෂාවේ ප්‍රාග්ධනයකි. දශක දෙකකට අධික කාලයක් පුරා, දහස් ගණනක් වූ පවුල් වලට සැනසිල්ලක්, ශක්තියක් සහ අත්වැලක් වී ඇති මෙම යෝජනා ක්‍රමය, අපගේ සාමාජිකත්වයේ අගය තවත් ඉහළට ඔසවා තබා ඇත.

**හිමිකම් ආවරණයන්**

1. හදිසි අනතුරකින් සිදු වන සාමාජික අභාවයකදී ☞ රු. 500,000/-
2. හදිසි අනතුරකින් නොවන (ස්වභාවික) සාමාජික අභාවයකදී ☞ රු. 250,000/-
3. සාමාජිකයාගේ බිරිඳ හෝ ස්වාමිපුරුෂයාගේ අභාවයකදී ☞ රු. 50,000/-
4. සාමාජිකත්වයේ අවිවාහක දරුවෙකුගේ අභාවයකදී ☞ රු. 50,000/-
5. සාමාජිකයාගේ මව/පියා/මාමණ්ඩිය/නැන්දම්මා යන හතර දෙනාගේම අභාවයන් සඳහා ☞ රු.20,000/- බැගින්
6. හදිසි අනතුරක් හේතුවෙන් සාමාජික අකර්මන්‍යතාවයට පත්වූ අවස්ථාවලදී
   - ස්ථිර පූර්ණ අකර්මන්‍යතාවය සඳහා ☞ රු. 250,000/-
   - ස්ථිර අර්ධ අකර්මන්‍යතාවය සඳහා ☞ රු. 125,000/-

මෙම අවමංගල්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ මාසිකව අයකරනු ලබන රු.150/- ක් වූ කුඩා දායකත්වය යටතේ සාමාජික ඔබ වෙත ඉහත සඳහන් සහන සැලසීම සිදු කරනු ලබයි. එම මාසික වාරිකයේ කිසිදු වැඩි කිරීමකින් තොරව, හදිසි අනතුරකින් සිදු වන සාමාජික වියෝවීමිහිදී ඔහු විසින් නම් කර ඇති පසු

පැවරුම්කරුට හෝ එම යැපෙන්නන් වෙත පිරිනමන ලද රු. 500,000/- ක් වූ ආධාර මුදල රු. 750,000/- දක්වාත්, ස්වාභාවික හේතුවක් මත සිදු වන සාමාජික වියෝවීම් සඳහා පිරිනමන ලද රු. 250,000/- ක් වූ ආධාර මුදල රු. 400,000/- දක්වා පුළුල් කිරීමට ද කටයුතු සුදානම් කර ඇත. මෙම යෝජනාව 61 වන සංවත්සර මහ සභාව වෙත නිල යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමටද අප විසින් මේ වන විටත් කටයුතු කර ඇති බව සිහිපත් කරමු.

**පිරිනමන ලද අවමංගලයාධාර ප්‍රදානයන්**

| වර්ෂය | වියෝවූ සාමාජික හා යැපෙන්නන් සංඛ්‍යාව | මුළු ප්‍රදානිත මුදල (රු. මිලියන) |
|---|---|---|
| 2004 සිට 2011 දක්වා | 10578 | 145.3 |
| 2012 සිට 2018 දක්වා | 10310 | 191.0 |
| 2019 සිට 2025 දක්වා | 15185 | 468.8 |

### ➢ සිසුදිරිය පාසල් පොත් ණය ව්‍යාපෘතිය

2018 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් සාමාජිකත්වයේ දුවා දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා අවශ්‍ය පාසල් පොත් සහ උපකරණ සහනදායී මිල ගණන් යටතේ එකවර ගෙවීමකින් තොරව මිලදී ගැනීමේ පහසුකම් සලසා ඇත.

වර්ෂ අවසානයේ නව පාසල් වාරය ආරම්භ වීමත් සමග පොදුවේ සියලු දෙමාපියන් විසින් තම දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාසල් පොත්, උපකරණ, පාසල් බෑග්, පාවහන් ඇතුළු දෑ සපයා ගැනීම සඳහා විවිධ ආර්ථික අපහසුතාවයන්ට මුහුණපාන බව අප අත්දැකීමෙන් දනිමු. ඒ සඳහා යම් පිටුබලයක් වෙමින් සුවිශේෂී වූ වට්ටම් පහසුකම් මත සහනදායි වාරික වශයෙන් ගෙවීමේ පහසුකම් සහිතව මෙම සිසුදිරිය පාසල් පොත් ණය ව්‍යාපෘතිය මගින් අපගේ සාමාජිකත්වය වෙත සහන ලබා දීමට හැකිවී ඇත.

| වර්ෂය | ප්‍රතිලාභ ලබා ගත් සාමාජික සංඛ්‍යාව |
|---|---|
| 2018 | 3613 |
| 2019 | 8826 |
| 2020 | 11074 |
| 2021/2022 | 19213 |
| 2022/2023 | 16461 |
| 2023/2024 | 18397 |
| 2024/2025 | 15530 |
| 2025/2026 | 13148 |

## 06. සම්ප්‍රදායකත්වයෙන් නව්‍යකරණයට යොමු වීම
## දැවැන්ත හැරවුම් ලක්ෂයක් සමග මෙම සමිතියේ ස්වර්ණමය යුගයක ආරම්භය සඳහා මෙහෙයවීම

කාර්යාලීය කටයුතු සඳහා පරිගණක මෘදුකාංග යොදා ගැනීම සම්බන්ධයෙන් මින් පෙර අවස්ථා කිහිපයකදීම මහසභා තුලින් සාමාජිකත්වය දැනුවත් කිරීමට හා අනුමැතිය ලබා ගැනීම සඳහා පූර්ව පාලන කාලයන්හි කටයුතු කර තිබුනද ඒ සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් හා අනුගමනය කල යුතු නෛතිකමය පියවරයන් ක්‍රියාත්මක කිරීමක් සිදු නොවීය.

ඒ අනුව පසුගිය 59 වන විශේෂ මහසභාව වෙත නිල යෝජනා අංක 03 යටතේ ගරු මහසභාවේ යෝජනා ස්ථිරත්වයෙන් මෙම කාර්ය ඉටු කිරීම අප වෙත පවරන ලදී. ලබාදුන් එම අනුමැතිය පරිදි වසර 86 ක කාලයක් පුරා අත්හුරු ක්‍රමයට සිදු කරන ලද සාමාජික සේවා සැපයීම හා ගිණුම් කටයුතු නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් පරිගණක මෘදුකාංග භාවිතයෙන් සිදු කිරීමේ මෙම භාරදූර කාර්යය අප විසින් 2023 පෙබරවාරි මස ආරම්භ කර ඇත. ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව කටයුතු කරමින් විද්වත් දැනුම හා උපදේශකත්වයද සමගින් තාක්ෂණික නිර්දේශයන්ට අනුව කාර්යාලීය සේවා සැපයීම් කටයුතු ආවරණය වන ප්‍රධාන මොඩියුලයන් 14 කින් සමන්විත මෙම මෘදුකාංග පද්ධතිය සැකසීමේ කාර්යයන් මේ වන විට ආරම්භ කර එහි අවසන් අදියරයන්හි කටයුතු සිදු කරමින් පවතී. එහි ඇතැම් සාමාජික ගිණුම් තොරතුරු හා දත්ත මෙම පද්ධතිය හරහා ජනනය වීමේ සජීවී ක්‍රියාකාරිත්වය 2025.04.21 දින සිට ආරම්භ කර ඇති බව ද එහි කාර්යක්ෂම සේවා පහසුකම් සාමාජික ඔබ විසින් මේ වන විටත් භුක්ති විඳිමින් සිටින බවද සතුටින් සඳහන් කරමු. මෙම දැවැන්ත හැරවුම් ලක්ෂය මෙම සමිතියේ ස්වර්ණමය යුගයක ආරම්භය වන බවද සාමාජික ඔබ සැමට නිහතමානී වූ සතුටින් සනිටුහන් කරමු. ඒ අනුව,

- සාමාජික ඔබගේ තොරතුරු හා ගිණුම් දත්ත පරිගණක පද්ධතිය සඳහා ඇතුලත් කිරීම තුල ඔබගේ ගිණුම් තොරතුරු කඩිනමින් දැන ගැනීමේ හැකියාව
- වසර 86 ක් පුරා සාමාජිකත්වය වෙත තම මුදල් අයවීම් අත්හුරු ක්‍රමය මගින් සටහන් කරමින් නිකුත් කරන ලද සාමාජික පාස්පොත වෙනුවට වාණිජ බැංකු පද්ධතිය තුල ක්‍රියාත්මක වන්නා වූ පරිගණක මුද්‍රණ යන්ත්‍ර මගින් සිදු කරනු ලබන ගිණුම් සටහන් සහිත නව සාමාජික පාස් පොතක් (Smart pass book), ලබා ගැනීමේ හැකියාව

- ඔබගේ තැන්පතු අයවීම් හා ණය අයවීම් පිළිබඳ ගිණුම් වාර්තා ලබා ගැනීමේ හැකියාව
- විද්‍යුත් තැපැල මගින් යොමු කරනු ලබන ඔබගේ මාසික මුදල් අවකරණය වීම විනාඩි කිහිපයක් තුල සාමාජික ගිණුමට මුදල් ගිණුම් ගතවීම
- පද්ධතිය තුල ක්‍රියාත්මක ඔබගේ සාමාජික ගිණුම සඳහා ඡායාරූපය එක් කිරීමේ හැකියාව
- 75000 කට අධික සාමාජික සේවා සැපයීම සඳහා ඉතාම කෙටි කාලයක් ගත වීම හා ගිණුම්කරණ කාර්යන් යාවත්කාලින වීම

වැනි පහසුකම් රැසක් මේ තුලින් වර්තමාන සාමාජිකත්වයට මෙන්ම අනාගත සාමාජිකත්වය සඳහාද හිමි වනු ඇත. එසේම ප්‍රාථමික මුදුන් මට්ටමේ ආයතනික සමිති අතර ඇති සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් ආයතන අතරින් සාමාජික සේවා සැපයීම සඳහා නව තාක්ෂණය යොදා ගනිමින් පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කරන ලද ප්‍රථම ආයතනය අප වන බවද සාමාජික ඔබ සැමට සතුටින් සඳහන් කරමු. ඒ තුලින් එම සහෝදර ආයතනයන්ද තම සාමාජික සේවා සැපයීම සඳහා නව තාක්ෂණය එකතු කර ගැනීමේදී අපගේ මෙම සාර්ථකත්වය මහගු පිටුබලයක් වන බවට අප විශ්වාස කරමු.

එසේම අප පූර්ව පාලන කාලය තුල අත්විදි අදූරදර්ශී පාලන ක්‍රමවේදයන් හා පුද්ගල බලලෝභීත්වය තුල සමිතිය හා සාමාජික සංවර්ධනය පරිහානියට ගමන් කල ආකාරයත් විවිධ අවභාවිතා සඳහා ලක් වූ අකාරයත් මූල්‍ය පාලනයක් නොමැතිවීම තුල දශක ගණනක් පුරා පැවති පාලයන් විසින් සාමාජිකත්වයේ ඉදිරි අනාගතය වෙනුවෙන් කළමනාකරණය කරන ලද මුල්‍යමය ශක්තිමත්භාවයත්  දින කිහිපයක් තුල සුනුවිසුනු වී ගිය ආකාරයද සාමාජික ඔබ දන්නා කරුණකි.

එවන් තත්ත්වයක් නැවත කිසිඳු පාලනයක් තුලින් සිදු නොවිය යුතු වන බව හා එසේ සිදු වීම සඳහා අවස්ථාවන් නොතැබිය යුතු වන බවත් ඒ සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම අපගේ වගකීමක් වන බවත් අප තරයේ විශ්වාස කරමු. ඒ අනුව කාර්යාලීය සේවා සැපයීම් හා ගිණුම්කරණ කාර්යයන් ආවරණය වන සේ පරිගණක පද්ධති ක්‍රමවේදයන් හා තාක්ෂණික ආරක්ෂිත ක්‍රමවේදයන් ඇතුලත් මෘදුකාංග භාවිතය සඳහා වූ ඒ දැවැන්ත කාර්ය භාරයට වසර තුනකට ආසන්න කාලයක් ඉතාමත් කැපවීමෙන් අප මෙසේ උරදුන් බවද නිහතමානි වූ ආඩම්බරයෙන් යුතුව සනිටුහන් කරමු.

මෙම ආයතනයේ ස්වර්ණමය යුගයක් සඳහා වූ මෙය, දැවැන්ත හැරවුම් ලක්ෂයක් ලෙස අවිවාදයෙන් සඳහන් කල හැක. මෙම කාලය තුල සාමාජික සේවා ලබා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමේදී මුහුණ දෙන ආර්ථික ගැටළු හා කාලය සඳහාද සහනයක් ලබා දෙමින් බදුල්ල, රත්නපුර, මහනුවර, ගාල්ල හා වවුනියාව යන දිස්ත්‍රික්ක 05 මුලික පදනම් කර ගනිමින් පළමු පියවර ලෙස දිවයිනෙහි ශාඛා කාර්යාල 05 ක් ආරම්භ කිරීම සඳහා සාමාජික ඔබ මීට මාස කිහිපයකට පෙර අවශ්‍ය අනුමැතිය අප වෙත ලබා දෙන ලදී. මෙම පරිගණකගත කිරීමත් සමගම එම ශාඛා කාර්යාල සේවා සැපයීම හා ප්‍රධාන කාර්යාලිය ගිණුම් පද්ධතිය හා සම්බන්ධ වීමේ අවශ්‍යතාවයන් ක්‍රමවත් ලෙස පහසු වී තිබෙන බවද මෙහිලා සඳහන් කරමු. ඒ අනුව සුදුසු කාර්යාල ස්ථානයන් පිළිබඳ සොයා බලා ගිවිසුම්ගත වීම  සිදු කිරීමට අවශ්‍ය මුලික කටයුතුද ආරම්භ කර ඇති බව සතුටින් සඳහන් කරමු.

මෙම දැවැන්ත කාර්ය සඳහා දායකත්වය, දැනුම හා උපදේශකත්වය සපයනු ලබන ආරම්භක නියමුවා ලෙස වරලත් ඉංජිනේරු, මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ටී.එස්.එස්. ජයවර්ධන මහතාගේ සේවය අප ඉතා අගය කරමු. තම දැනුම හා කාලය වැය කරමින් සමුපකාර ව්‍යාපාර සඳහා තමා වෙතින් ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකමින් ලබා දෙන ලද එම දැනුම, උපදේශකත්වය හා මගපෙන්වීම පිළිබඳ අප හිසනමා ආචාර කරමු.

එසේම එතුමා විසින් අප වෙත හඳුන්වා දුන් තවත් මානව සම්පතක් ලෙස වරලත් ගණකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ඉසුරු මානවඩු මහතා විසින් ලබා දෙනු ලබන දැනුම, උපදේශකත්වය හා ධෛර්ය පිළිබඳවද අපගේ කෘතවේදී ස්තූතිය මෙහිලා සනිටුහන් කරමු. එමෙන්ම මොරටුව විශ්ව විද්‍යාලයේ පද්ධති විශ්ලේශක නඳුන් පෙරේරා මහතා ද මෙම ක්‍රියාවලිය තුල ලබා දෙනු ලබන දායකත්වය ඉතා අගය කොට සලකමු.

මෙම ව්‍යාපෘතිය සාර්ථකව හා ඵලදායි ලෙස සිදු කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල හිටපු සමුකාර සංවර්ධන කොමසාරිස් හා  සමිති රෙජිස්ට්‍රාර් ආශා හපුආරච්චි මැතිනියගේ උපදෙස් පරිදි අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් සිදු කරන ලද සහකාර කොමසාරිස් චන්දන ෆොන්සේකා මහතා, හිටපු ගණකාධිකාරී එරන්දි සරච්චන්ද්‍ර මහත්මිය හා හිටපු සමුපකාර සංවර්ධන නිලධාරි නුවන් විජේසිංහ මහතා විසින් දක්වන ලද දායකත්වයද මෙහිදී අප ඉතා අගය කොට සලකමු.

වසර 88 ක් වූ සමිති ඉතිහාසයේ ස්වර්ණමය යුගයකට හැරවුම් ලක්ෂයක් වන මෙම පරිගණකගත කිරීමේ දැවැන්ත ක්‍රියාවලිය ආරම්භ කිරීමේදී ඒ සඳහා අවශ්‍ය පසුබිම හා නායකත්වය ලබාදුන් සමිතියේ ගරු ලේකම් ඩබ්ලිව්.ඒ.ඩී. විමලරත්න මහතා හා හිටපු ගරු සභාපති බන්දුල ජයකොඩි මහතා ද මේ සඳහා දායක වූ ප්‍රධාන පුරෝගාමීන් ලෙස ගෞරවපූර්වකව සිහිපත් කරමු.

මෙම සියළු සම්පත් දායකත්වයන් සම්බන්ධීකරණය කර ගනිමින් හා කාර්යාලීය මෙහෙයුම් ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කර ගනිමින් ආයතනික සේවා මෙම පරිගණක මෘදුකාංග පද්ධතිය තුලට එක්කර ගැනීමේ ආයතනික මෙහෙයුම් නිලධාරියා ලෙස එම වගකීම් සඳහා උරදෙමින් සියලු කාර්ය මණ්ඩලය ඒකරාශී කර ගනිමින් හා එක් දිසාවක් සඳහා මෙහෙයවමින් දිවා රෑ නොබලා කටයුතු කරන ලද සාමාන්‍යාධිකාරි ඒ.පී.ඩී. අසිත මහතාගේ සේවය ඇගයීමට හා ස්තූතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමු. එසේම මෙම අරමුණ වෙනුවෙන් දිවා රෑ වෙහෙසී කැපවීමෙන් කටයුතු කරනු ලබන සියලුම කාර්ය මණ්ඩල මහත්ම මහත්මීන් වෙතද අපගේ ප්‍රසාදය හා ස්තූතිය මෙහිලා පිරිනමමු.

එසේම මෙම කාර්යය නෛතිකමය රාමුව තුළ සිදු කිරීමේදී ඒ සඳහා පූර්ණ සහයෝගය ලබා දෙමින් අභ්‍යන්තර ටෙන්ඩර් කමිටුව නියෝජනය කරන ලද ගරු භාණ්ඩාගාරික ප්‍රියංකා කුමුදිනි මිය, උපසභාපති ප්‍රියන්ත කිත්සිරි මහතා, අධ්‍යක්ෂක රෝහිත කුමාර මහතා හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි නිමාලි ප්‍රදීපා මිය විසින් ද තාක්ෂණික ඇගයීම් කමිටුව නියෝජනය කරමින් අධ්‍යක්ෂක සරත් සිසිර මහතා හා කළමණාකරන සහකාර නිලධාරි තරිඳු වික්‍රමසිංහ මහතා විසින් ලබා දුන් සහයෝගය ඉතා අගය කොට සලකමු.

මෙම සියලු දෙනාගේ දායකත්වය හා කැපවීම පරිගණකගත කිරීමේ ක්‍රියාවලියේ සාර්ථකත්වය තුල එක්වී ඇති බව සනිටුහන් කරන අතර ඒ සඳහා අපගේත්, සාමාජිකත්වයේත්, කාර්ය මණ්ඩලයේත් ගෞරවණීය ස්තූතිය මෙහිදී පිරිනමමු.

එසේම පරිගණකගත පද්ධතිය තුලින් සාමාජික මාසික අයවීම් ඉතාමත් කෙටි කාලයක් තුල අදාල සාමාජික ගිණුම සඳහා ගිණුම්ගත කිරීමට අපගේ ඉල්ලීම පරිදි මාසික මුදල් අවකරණය කිරීමේ ලේඛණයන් විද්‍යුත් තැපැල මගින් අප වෙත යොමු කරමින්, දිවයිනේ වැටුප් අවකරණය කිරීමේ රෝහල් හා සෞඛ්‍ය ආයතන ගණකාධිකාරී මහත්ම මහත්මීන් ඇතුළු අනිකුත් නිලධාරි මහත්ම මහත්මීන් විසින් ලබා දෙන ලද සහයෝගය පිළිබඳව ද මෙහිදී ස්තුතිපූර්වකව සිහිපත් කරමු.

## 07. වර්තමාන හා අනාගත සාමාජිකත්වය වෙනුවෙන් වූ ඵලදායි ආයෝජන අවස්ථාවන් සඳහා යොමු වීම

- **කොළඹ, පන්සල පාරේ අංක 47 දරණ දේපලය මිලදී ගැනීම**

සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් පුළුල් කරමින් සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීම පිළිබඳ වූ සමිතියේ අරමුණු සඵලකර ගනිමින් සමිති කාර්යාලයට වම්පසින් පන්සල පාර දක්වා දිවෙන කොළඹ 10, පන්සල පාරේ අංක 47 දරණ ස්ථානයේ වර්ග අඩි 4848 ක් වූ දෙමහල් ගොඩනැගිල්ලක් සහිත දේපලය මිලදී ගැනීම සඳහා ආයෝජනය කිරීමට අපට හැකිවූ බව සතුටින් සඳහන් කරමු.

සමිතියට යාබද මෙම දේපලය මිලදී ගැනීම තුලින් එහි ප්‍රතිලාභයන් අන් කිසිවකුටත් වඩා ඉහල ඵලදායිත්වයක් සමිතියට ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ විශේෂ අවධානයට යොමු කරමින් මෙම දේපලය මිලදී ගැනීම සඳහා පූර්ව අනුමැතිය ලබා දීම පිළිබඳව හිටපු සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් ආශා හපුආරච්චි මැතිනිය වෙත අප සාමාජිකත්වයේත්, අධ්‍යක්ෂක මණ්ඩලයේ හා කාර්යමණ්ඩලයේ ගෞරවණීය ස්තුතිය පිරිනැමීමටද මෙය අවස්ථාවක් කර ගනිමු.

සමිති කාර්යාලීය ඉඩකඩ පහසුකම් පුළුල් කරමින් සාමාජික සේවා සැපයීම් අංශයන් තවදුරටත් පුළුල් කිරීමේ අරමුණු වෙනුවෙන් හා ඔසුසලක්, විශේෂඥ වෛද්‍ය චැනලින් සේවාවක් සඳහා ඉඩකඩ භාවිතය, මධ්‍යම ප්‍රමාණයෙන් යුතු දේශනශාලා පහසුකම් සැපයීම, නේවාසික පහසුකම් සැපයීම වැනි වෙනත් ව්‍යාපාර සඳහා මෙම ඉඩකඩ භාවිතා කිරීමට සමිතිය අපේක්ෂා කෙරේ. එම ව්‍යාපාර අවස්ථා සඳහා ගැලපෙන ආකාරයට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් සැලසුම් නිර්මාණය හා උපදේශකත්වය යටතේ මහල් අටකින් යුත් ගොඩනැගිල්ලක් එම ස්ථානයේ ඉදිකිරීම සඳහා මේ වන විටද සැලසුම් සකස් කෙරෙමින් පවතින බවද සඳහන් කරමු.

වර්තමාන හා අනාගත සාමාජිකත්වය වෙනුවෙන් ඉදිරි දශක ගණනක් සඳහා වුවද ප්‍රතිලාභයන් සීමා නොවන්නා වූ කොළඹට තදාසන්න වූ මෙම දේපලය මිලදී ගැනීම සඳහා අප සාමාජිකත්වය නොපැකිලව තම අනුමැතිය හා ආශිර්වාදය ලබා දෙමින් ඵලදායී ආයෝජන අවස්ථා සඳහා තීරණ ගැනීම පිළිබඳවද මෙහිදී ගෞරවයෙන් සිහිපත් කල යුතු වේ.

## 08. නෛතිකමයභාවය තවදුරටත් ශක්තිමත් කිරීම.

මෙම සමිතියේ අතුරු ව්‍යවස්ථා වගන්ති වරින් වර විවිධ සංශෝධනයන්ට භාජනය වෙමින් ක්‍රියාත්මක වී ඇත. එසේම වර්තමානය වන විට සමුපකාර ව්‍යාපාරය ද ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ, දේශපාලන හා වෙනත් විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් සිටි. ඒ අනුව පවතින ලියාපදිංචි අතුරු ව්‍යවස්ථානුකූලව කටයුතු කරමින්, තවදුරටත් සමිතියේ අතුරු ව්‍යවස්ථා විධිවිධාන මඟින් සාමාජික අයිතිවාසිකම් රැකීමට හා ශක්තිමත් මූල්‍ය ආයතනයක් ගොඩනැගීමට කටයුතු කිරීම සඳහා නව අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව අප විසින් හඳුනා ගෙන ඇත. ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ ඉල්ලීම පරිදි සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උපදෙස් හා මඟපෙන්වීම් සිදු කරන ලද බවද මෙහිදී සිහිපත් කරමු.

එසේම එම මූලික කෙටුම්පත්කරණය පදනම් කර ගනිමින් සමුපකාර නීති සැකසීමේ හා පරිශීලනය කිරීමේ සමුපකාර ව්‍යාපාර තුල සක්‍රීයව කටයුතු කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් මගින් එහි ඉදිරි කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී.

එමඟින් සමිතියේ මූලික නීති මූලාශ්‍රය ලෙස අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්හි හා විධිවිධානයන්හි අර්ථකථනයන් නිශ්චිත වන ලෙස හා එහි සඳහන් විධිවිධානයන් එකිනෙකට නොගැටෙන ආකාරයටත් සාමාජිකත්වයේ යුතුකම් වගකීම් මෙන්ම සමිතියේ අරමුණු සාක්ෂාත් කර ගත හැකි වන ආකාරයටත්, එම අරමුණු ඉටු කිරීම වෙනුවෙන් පත්වන නිලධරයන්ගේ රාජකාරිමය වගකීම හා යුතුකම් පිළිබඳවත් සාමාජික ස්වාධීනත්වය ආරක්ෂා වන ආකාරයටත් කටයුතු කිරීමේ වගකීම මැනවින් අවබෝධ කර ගනිමින් අදාල විද්වත් දායකත්වය ලබා ගනිමින් නව අතුරු ව්‍යවස්ථාව කෙටුම්පත්කරණය සිදු කිරීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මේ වන විට අවසන් කර ඇත. එම නව සංශෝධිත අතුරු ව්‍යවස්ථාව පූර්ව අනුමැතිය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමු.

## 09. ආපදා තත්වය හමුවේ යලි නැගී සිටීමට අත්වැලක් වීම

2025 නොවැම්බර් මස 28 දින ආරම්භ වූ දිට්වා සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් රටක් ලෙස බහුතර ලක් වැසියන් අවතැන් වූ බව අපි දනිමු. ඒ දහස් ගානක් වූ ආපදාලාභින් අතර අප සමිතියේ සාමාජිකත්වයද 4200 කට අධික වන බව තොරතුරු තහවුරු කර ගැනීම් තුල අප වෙත තහවුරු වී තිබේ.

සාමාජිකත්වයේ දුක, සතුට, ජයග්‍රහණයන් සමඟ සැමදා එක්ව කටයුතු කල අපට සියලු පළාත් සඳහා බලපෑම් එල්ල කල මෙම දිට්වා සුළි කුණාටු ආපදා තත්ත්වය හමුවේ නිහඬව සිටිය නොහැක. ඒ සඳහා ක්‍රමවත් හා විධිමත් වැඩ පිළිවෙලක් සකසමින් ආපදාවේ ස්වභාවයන් අනුව හා තම හැකියාවට අනුව පහත සඳහන් පරිදි එම ආපදාවට පත් සාමාජිකත්වයට යලි නැගීසිටීමට අත්වැලක් වීමට අපට කටයුතු කිරීමට හැකි විය.

- ක්‍රමවත් අයදුම්පතක් මගින් තොරතුරු ලබා ගැනීම
- ඉල්ලුම්කරන ලද සියලු සාමාජිකත්වය සඳහා නැවත අයකර ගැනීමකින් තොරව රු. 10,000/- ක ආධාර මුදලක් පිරිනැමීම
- ඊට අතිරේකව එම ඉල්ලුම් කරන ලද ආපදාලාභින් සඳහා පොළී රහිත රු. 50,000/- ක ණය මුදලක් ලබා දීම හා
- තවදුරටත් අවශ්‍ය වන්නේ නම් 6% ක් වූ සහනදායී පොළී ප්‍රතිශතයක් මත රු. 50,000/- ක ණය මුදලක් ලබා දීම

ඒ අනුව මෙම හදිසි ආපදා තත්ත්වය මත අසරණ වූ අපගේම සාමාජික මහත්ම මහත්මීන් 4200 කට අධික පිරිසක් සඳහා රු. මිලියන 300 කට අධික මුදලක් ඉහත වැඩසටහන තුලින් ක්ෂණිකව වෙන් කිරීමට සමිතිය විසින් කටයුතු කර ඇති බවද මෙහිලා සනිටුහන් කල යුතු වේ.

## 10. සුවසෙවන නිවාඩු නිකේතනය - කතරගම

කතරගම, පුස්සදේව මාවතේ අංක 222/2 දරණ ස්ථානයේ පිහිටි සමිතියේ අරමුදලින්ම ඉදිකල තෙමහල් ගොඩනැගිල්ලක ස්ථාපිත වූ "සුවසෙවන" නිවාඩු නිකේතනය දිවයින තුල බෙහෙවින්ම ජනප්‍රිය වී පවතින සේවා ව්‍යාපෘතියකි. සාමාජිකත්වයේ සහ පොදු ජනතාවගේ ද සුභ සාධනය පිණිස මෙම ව්‍යාපෘතිය 2003.02.23 දින ආරම්භ විය.

වායුසමනය කල හා නොකල සුවපහසු කාමර වලින් සහ නේවාසික ශාලා වලින්ද සමන්විත සුවසෙවන නිවාඩු නිකේතනය වැඩ සිටි කන්ද හොඳින් දර්ශනය වන ඉතා සුන්දර පරිසරයක පිහිටා තිබේ. සහනදායී වූ මිල ගණන් මත සේවාවන් සපයන බැවින් පොදු ජනතාවගේ ආකර්ශනයට හා ප්‍රසාදයට පාත්‍ර වී ඇත.

සමිතියේ සාමාජිකත්වය සඳහා සහන මිල ගණන් මත කාමර පහසුකම් ලබා ගත හැකි වන අතර සේවයෙන් විශ්‍රාම ලැබූ හිටපු සාමාජිකත්වය සඳහාද සහන මිල ගණන් ක්‍රියාත්මක කිරීම විශේෂත්වයකි. සමිතියේ ලියාපදිංචි වීම තුලින් ඔවුන්ට එම පහසුකම් ලබා ගැනීමට විධිවිධාන සලසා ඇත.

සුවසෙවන නිවාඩු නිකේතනයේ නේවාසික පහසුකම් සඳහා දේශීය මෙන්ම විදේශීය සංචාරකයන්ගේද ආකර්ශනය ඉලක්ක කර ගනිමින් නිකේතන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන යෝජනා අප විසින් 60 වන මහසභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ සඳහා වන මූලික කාර්යයන් සැලසුම් කෙරෙමින් පවතී. එසේම නවීකරණය සඳහා යොමු වෙමින් නිකේතන වෙන් කිරීම් සිදු කර ගැනීම මාර්ගගත (online) ක්‍රමවේදය ඔස්සේ පහසුවෙන් සිදු කල හැකි ආකාරයට වෙබ් අඩවිය සැකසීමේ කාර්යන් මේ වන විට අවසන් කර ඇති බවද සතුටින් සඳහන් කරමු.

## 11. සසෙත් මුද්‍රණාලය

මෙම මුද්‍රණාලය සමිතිය විසින් ආරම්භ කල තවත් ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය සතුව තිබූ කොළඹ ග්‍රෑන්ඩ්පාස් හි නැකොසිල් නමින් පැවති මුද්‍රණාලය අප සමිතිය විසින් මිලදී ගන්නා ලදී. සියලුම ආකාරයේ මුද්‍රණ කාර්යයන් සපුරාලිය හැකි ආකාරයට සසෙත් මුද්‍රණාලය නමින් එය ප්‍රතිසංවිධානය කොට පවත්වාගෙන යනු ලැබේ.

දැනටද අප මුද්‍රණ අංශය ගණුදෙනුකාර භවතුන් කෙරෙහි බෙහෙවින්ම කාර්යක්ෂම වූත්, ගුණාත්මක වූත් සේවාවන් සපයනු පිණිස කැපවී ක්‍රියාත්මක වේ. එසේම නවීන පහසුකම් සහිතව මෙම මුද්‍රණාලය නවීකරණය කරමින් මුද්‍රණ වෙළඳපොල තුල කටයුතු කිරීමටද වැඩිදුරටත් අපේක්ෂා කරමු.

## 12. අනෙකුත් ව්‍යාපෘති හා ව්‍යාපාර

සමිතියේ ක්‍රියාත්මක සුවසෙනෙහස ළමා ඉතුරුම් ගිණුම්, සාමාජික ණය ආරක්ෂණ ක්‍රමය, සමුපකාර රක්ෂණ නියෝජිත සේවා, පහසුකම් මෙම පාලන කාලය තුල ක්‍රියාත්මක කරමින් සාමාජික සේවා පහසුකම් සැපයීම සාර්ථකව මෙහෙයවීමට මෙම පාලන කාලය තුල කටයුතු කර ඇත.

## 13. සමිතියේ වත්කම් සහ ලාභය 2023 - 2025 අතර විශිෂ්ට වර්ධනයක්

සමිතියේ ස්ථාවර මූල්‍ය කළමනාකරණය සහ වර්ධන ප්‍රවණතාවයන් හේතුවෙන් ඉතිරි ලාභය සහ වත්කම් දක්නට ලැබේ. ඒ අනුව, 2019 වර්ෂය වන විට, සමිතියේ සමස්ත වත්කම් රු. මිලියන 4,956.19 දක්වා වර්ධනය වී තිබූ අතර එය 2018 වර්ෂයට සාපේක්ෂව 10.97 % ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මෙය සමිතියේ මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සහ වර්ධන ප්‍රවණතාවයන් දැක්වීමේ සාක්ෂියක් ලෙස සැලකිය හැක.

2019 දෙසැම්බර් 31 වන දිනට, සමිතියේ සංචිත හා අරමුදල් රු. මිලියන 2,424.43 ලෙස පැවති අතර, ඉතිරි ලාභය

රු. මිලියන 247 ක් පමණ විය. 2022 වර්ෂයේ ඉතිරි ලාභය රු. මිලියන 359 ක් පමණ වූ අතර මුළු වත්කම් රුපියල් මිලියන 7000 ක් පමණ විය.

අඛණ්ඩ හා යෝජිත මූල්‍ය ක්‍රියාමාර්ග, නිසි කළමනාකරණ හේතුවෙන් 2023 වර්ෂය වන විට ඉතිරි ලාභය රු. මිලියන 360 දක්වා වර්ධනය වී ඇති අතර මුළු වත්කම් රු. මිලියන 8000 දක්වාත් 2025 වර්ෂ අවසාන වන විට සමිතියේ මුළු වත්කම් රු. මිලියන 9000 කට ආසන්න විශිෂ්ට වර්ධනයක් ඇති කර ගැනීමට සමත් වීමෙන් සමිතියේ ආර්ථික ශක්තිය සහ ස්ථාවරත්වය පැහැදිලිව පෙන්නුම් කරයි.

## 14. විගණන කටයුතු

2023.01.29 දින නව පාලන කාලය ආරම්භ වන අවස්ථාව වන විටත් 2022.12.31 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ හා 2023.03.31 දින වන විට අදාල අවසන් ගිණුම් කට්ටලය විගණනය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේ ඉලක්කයන්ට අනුව කාර්යාලීය වැඩ සැලසුම් කිරීමට පූර්ව පාලන කාලය අසමත් විය.

එසේ වුවත් 2023.01.29 දින නව පාලන කාලය ආරම්භ වීමත් සමඟ ප්‍රමුඛතාවය ලබා දෙමින් 2022.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂයට අදාල අවසන් ගිණුම් වාර්තා සැකසීමේ කාර්යයන් කඩිනම් කිරීමේ මෙහෙයවීම සිදු කරන ලදී. ඒ අනුව අද දින 60 වන මහසභා රැස්වීම සඳහා එම විගණන ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇත.

එමෙන්ම 2023.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාල 2023.03.31 දින වන විට විගණනය කටයුතු මේ වන විට අවසන් කර ඇත. වැඩිදුරටත් 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ගිණුම් වාර්තාද පරිගණක පද්ධතිය මඟින් ජනනය කරමින් අවසන් කෙරෙමින් පවතී.

සමිතියේ ගිණුම් කටයුතු විගණනය සඳහාත් සමිතියේ අධීක්ෂණ කටයුතු සඳහාත් නිරන්තර අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබාදුන් සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමිය ඇතුළු සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල සියළු නිලධාරී මහත්ම මහත්මීන් වෙත හා සමිති අධීක්ෂණ නිලධාරී මහත්ම මහත්මීන් වෙත අපගේ ස්තුතිය පිරිනමමු.

## 15. ඉදිරියේදී සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන්

බෝට්හවුස් ඉතිහාසය තුල ඔබගේ පුද්ගලික සාමාජික සේවා පහසුකම් සඳහාත් නව පෙරලියක් ඇති කරමින් නව්‍යකරණය සමඟ ඩිජිටල් යුගයක් වෙත අප ආයතනය ඔසවා තැබීම අපගේ ඉදිරි ඉලක්කය බවට පත්ව ඇත. ඒ තුලින් සමිතියේ කටයුතු තවදුරටත් පුළුල් කරමින් හා සංවර්ධනය කරමින් සමස්ථ සාමාජිකත්වය සඳහා විවිධ සේවාවන් හා සුභ සාධන කාර්යයන් රැසක ප්‍රතිලාභයන් හිමිකර දීමට අප අපේක්ෂා කරමු. මෙම සේවාවන්හි මූලික හා ඍජු හිමිකරුවන් වනුයේ සමස්ථ සාමාජිකත්වය වුවද ඒ තුලින් මෙම පහසුකම්හි ප්‍රතිලාභයන් සාමාජිකත්වයේ යැපෙන්නන් හටද හිමි වනු ඇත.

**ඒ අනුව අපගේ ඉදිරි ඉලක්කයන්,**

- සාමාජික පුද්ගල ණය සීමා වැඩි කිරීම
- නව ණය කාරක නියෝග මාලා හඳුන්වා දීම
- සාමාජික සේවා පරිගණකගත කිරීමත් සමඟම ඔබගේ සාමාජික සේවාවන් පළාත් මට්ටමින් ලබා ගත හැකි ලෙස ශාඛා කාර්යාල ස්ථාපිත කිරීම
- මහ බැංකු නිර්ණායකයන්ට අනුව ඔබගේ ඉතුරුම් තැන්පතු සඳහා හා ණය සඳහා පොලී ප්‍රතිශතයන් ක්‍රියාත්මක කිරීම හා ඒ තුලින් වන වාර්ෂික පොලී ප්‍රතිශත සහනයන් සාමාජික ඔබට ලබා දීම
- ඔබගේ කාර්යබහුලත්වය සඳහා සහනයක් වෙමින් ගිණුම් තොරතුරු දැනුම්දීම හා සිහිකැඳවීම් ඔබගේ ජංගම දුරකථනය වෙත කෙටි පණිවිඩ ඔස්සේ තහවුරු කිරීමේ ක්‍රමවේදය ආරම්භ කිරීම
- ඔබගේ සමිති කාර්යාල පරිශ්‍ර ඉඩකඩ පහසුකම් පුළුල් කිරීම සහිත අභ්‍යන්තර කාර්යාල පරිසරයක සාමාජික සේවා පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සාමාජික ඔබට ලබාදීම
- සුවසෙවන නිකේතන වෙන් කිරීම් වෙබ් පිටුව හරහා සිදු කර ගැනීමේ අවස්ථාව සැකසීම හා ඒ තුලින් ව්‍යාපාර වර්ධනය කිරීම
- අනිකුත් ඵලදායී ආයෝජන අවස්ථා හඳුනා ගැනීම හා එහි ප්‍රතිලාභයන් සාමාජිකත්වය වෙත හඳුන්වා දීම

## 16. ආවර්ජනය

පුද්ගල ප්‍රචාරය, ප්‍රසාදය, පුද්ගල කීර්තිනාමය, ඉදිරි නිලවරණයන් ඉලක්ක කර ගනිමින් කටයුතු කිරීම 2023.01.28 දින සාමාජිකත්වය විසින් වගකීම් පවරන ලද අපගේ අරමුණ හෝ ප්‍රතිපත්තිය නොවන බව පැහැදිලිවම සාමාජික ඔබ වෙත ප්‍රකාශ කරමු. එය ගත වූ මෙම කාලය තුල අප ක්‍රියාවෙන් ඔබ වෙත සපථ කර ඇත.

2019.09.01 සිට 2023.01.28 දක්වා ඔබ - අප හොඳින් අත්දැකී ඒ අම්හිරි ක්‍රියාකලාපයන් ඔබට පෙර සඳහන් කල ආකාරයට නිවැරදි කිරීමට මෙම පාලන කාලය ආරම්භ වූ 2023.01.29 දින සිට අප ගන්නා ලද තීන්දු තීරණයන් හුදෙක් සාමාජික ඔබගේ ආකර්ශනය උදෙසාම ක්‍රියාත්මක කර නොමැති බව සමිතියේ කළමනාකරණ තීරණයන් පිළිබඳ හොඳින් නිරීක්ෂණය කිරීමේදී ඔබට පැහැදිලි වනු ඇත. ඒ අනුව,

- පළමු පියවර ලෙස 2023.01.28 වන විට අස්ථාවර හා අවිධිමත් සමිති කාර්යයන් ස්ථාවර කිරීමට හා විධිමත් කිරීම සඳහා නිවැරදි කළමනාකරණ හා පරිපාලන තීරණයන් ගනිමින් ඒ සඳහා අප ගත යුතු ක්‍රියාමාර්ගයන් ගැනීම.

- දෙවන පියවර ලෙස සමිතියේ මුල්‍ය පාලනය හා මුල්‍ය විනය ඇති කිරීමටත්, ඒ තුලින් සාමාජික ණය හා සුභ සාධන සේවා පහසුකම් අඛණ්ඩව ලබා දීමටත් කටයුතු කිරීම.
- තෙවන පියවර ලෙස කිසිඳු බාහිර ණය වගකීමක් නොමැතිව වර්තමාන හා අනාගත සාමජිකත්වය සඳහා සමිතියේ ස්ථාවර වත්කම් වර්ධනය කරමින් ඵලදායී අනාගත ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කිරීම.
- සිව්වැනි පියවර ලෙස පූර්ව පාලන කාලය තුල ලත් අත්දැකීම් ඉදිරි අනාගතයේ කිසිඳු පාලනයක් මඟින් සාමාජිකත්වය සඳහා අත්නොවිදීමටත්, පුද්ගල නායකත්වයන් තුල ගනු ලබන අදූරදර්ශී කළමනාකරණ තීරණයන් හා අවිධිමත් ක්‍රියාකලාපයන් තම පුද්ගල සිතැගි පරිදි භාවිතා කරමින් කටයුතු කිරීම වලකාලමින් සමිතිය හා සාමාජිකත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ඵලදායි ආයෝජනයක් ලෙස නව තාක්ෂණික පරිගණක පද්ධතියක්  ස්ථාපිත කිරීම තුලින්,

සියලු සාමාජික සේවාවන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරමින් හා ඉහත සඳහන් පලමු පියවරේ සිට සිව්වන පියවර දක්වා  සාර්ථකව ක්‍රියාත්මක වෙමින් 2023.01.28 දින මෙම සමිතියේ පාලනය භාර ගන්නා අවස්ථාවේදී සමිතියට අත්විඳි තිබු දුර්භාග්‍ය සමයෙන් සමිතියත්, සාමාජිකත්වයත් ගලවා ගන්නටත්,

පියවරින් පියවර සපැමිණි මෙම සමිතිය සාමාජිකත්වයේ සමාජ, ආර්ථික හා සංස්කෘතික අභිවෘද්ධිය සඳහාම යොමුවිය යුතුය යන අධිෂ්ඨානය පෙරදැරිව 2023.01.28 දින සාමාජික බහුතර කැමැත්ත මත සාමාජික ඔබ සැම නිවැරදි තීරණ ගනිමින් පත්කරන ලද පාලනය විසින් නැවත මුල්‍යමය ශක්තින්, මුල්‍යමය විනය, ආයතනික ක්‍රමවේදයන් ඇතුළු පරිපාලන ක්‍රමවේදයන්  නැවත නගා සිටුවීමට කටයුතු කර ඇති බව තහවුරු කරමු.

යම් කාල පරිච්ජේදයක සමිතියට එක් පියවරක් පසුපසට තැබීමට සිදු වුවද ක්‍රමානුකූලව දැඩි කැපවීමෙන් හා මනා කළමනාකාරීත්වය තුල නැවත නගාසිටුවීම සඳහා වූ මෙහෙයවීම තුල පසු දැවැන්ත පියවර සියයක් ඉදිරියට තබමින් සමිතිය නව තාක්ෂණය සහිත ඉදිරි අනාගතය සඳහා ගමන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග තහවුරු කර ඇති බව සාමාජික ඔබට ප්‍රත්‍යක්ෂ වනු ඇත. ඒ පිළිබඳ අප නිහතමානිව සතුටට පත් වෙමු.

## 17. මෙතෙක් ආ ගමන්මග

1996 ට පෙර  පැවති බෙහෙවින් ඒකාකාරී වූ ගතානුගතික පිලිවෙත් හා රටාවන් වෙනස් කරමින් සමිතිය මෙම සංවර්ධන ප්‍රවේශය කරා යොමු කරවන්නට 1996 අගෝස්තු මස පැවති මහසභාවේදී අප නායකත්වයන් සමඟ එක්ව ක්‍රියා කල සියලුම සාමාජික ක්‍රියාධරයන්ගේ එම සක්‍රීය වූ මැදිහත්වීම හා කැපවීම තුල අප සමිතිය ඔසවා තබන්නට හේතු විය. ඒ සඳහා දායක වූ සියළුම ක්‍රියාධරයින්ට අපගේ ප්‍රථම ගෞරවාචාර්ය හිසනමා පිරිනමමු.

එමෙන්ම මෙම ගමන් මගෙහි ප්‍රධානතම නියමුවා වන සමිතියේ හිටපු ගරු සභාපති, වර්තමාන ගරු ලේකම් ඩබ්ලිව්.ඒ.ඩී. විමලරත්න මහතා විසින් සමිතියේ ඉදිරි සංවර්ධනය සඳහාත්, සමාජ සුභසාධනය සඳහාත් කරන ලද මෙහෙවර හා තවදුරටත් කරනු ලබන සේවාවන්ට සමස්ත සාමාජිකත්වය වෙනුවෙන් ගෞරවපූර්වක ස්තුතිය කෘතවේදීව සිහිපත් කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමු.

2020-2022 පූර්ව පාලන කාලය තුල පැවති නායකත්වයේ අදූරදර්ශීභාවය හේතුවෙන් දශක කිහිපයක් පුරා සමිතිය ශක්තිමත් ලෙස ගොඩනැගීම දෙදරා යාම හා බිඳවැටීම වලකා ගැනීම සඳහා එතුමා විසින් උත්සහ දරන ලද ආකාරයත්, සමිතිය හා සාමාජිකත්වය බේරා ගැනීම සඳහා අභියෝග සඳහා මුහුණ දෙමින් නැවතත් පෙරමුණු නායකත්වය ගෙන ක්‍රියා කිරීමද මෙහිලා සනිටුහන් කල යුතු වේ.

ඒ අනුව ඩබ්ලිව්.ඒ.ඩී. විමලරත්න මහතා ලබාදුන් නායකත්වය යටතේ 2023.01.28 දින පැවති 58 වන සංවත්සර මහසභා රැස්වීම් දින මහනුවර නගරය කරා ජාති, ආගම් බේදයකින් තොරව දිවයිනපුරා විසිරි සිටින සාමාජිකත්වය ජන ගඟක් ලෙස සමිතිය වෙනුවෙන් ඉදිරියට පැමිණීම හා කෙතරම් බාධා හිරිහැර විදීමට සිදු වුවත් සමිතියේ ඉදිරි ආරක්ෂාව වෙනුවෙන් තම ස්වාධින ඡන්දය භාවිතා කිරීමට කටයුතු කල ආකාරයද මෙම සමිති ඉතිහාසයේ නොමැකෙන දීප්තිමත් සටහන් තබනු ඇත.

ඒ වන  විට ගතවී තිබු සමිතියේ පූර්ව පාලන කාලයේ වසර තුනක් තුල දෙදරා ගොස් තිබු මුල්‍යමය ශක්තින්, ආයතනික විනය, ආයතනික ක්‍රමවේදයන් ඇතුළු පරිපාලන ක්‍රමවේදයන් නැවත නගා සිටුවීම සඳහා එතුමාගේ අත්දැකීම්, උපදේශකත්වය හා නායකත්වයන් 2023.01.29 දින ආරම්භ වූ මෙම පාලන කාලයේ ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රධාන නිලධාරීන් ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස අපට ආශිර්වාදයක් හා ශක්තියක් විය. ඒ අනුව අප අධ්‍යක්ෂක මණ්ඩලයේ ගෞරවනීය ප්‍රණාමය හා ස්තුතිය එතුමා වෙත පිරිනමමු.

එසේම  සෞඛ්‍ය සේවයෙන් විශ්‍රාම ගියද එදා මෙන් අදත් සමිතියේ හා සාමාජිකත්වයේ උන්නතිය උදෙසා සමිතිය වටා යෝධ පවුරක් ලෙස අප හා රැඳී සිටින හිටපු ප්‍රධාන නිලධාරි මහත්වරුන් හා අධ්‍යක්ෂක මණ්ඩල සභික මහත්ම මහත්මීන් මෙන්ම විශ්‍රාමික ක්‍රියාකාරී සංවිධායක මහත්ම මහත්මීන් ඇතුළු එම ජ්‍යේෂ්ඨ පුරවැසියන් වෙතද අපගේ කෘතවේදී ස්තුතිය පිරිනමමු.

පියවරින් පියවර සපැමිණි අප නව මංපෙත් කරා තවදුරටත් ගමන් කල යුතුය. නව තාක්ෂණයේ සාධනීය ලක්ෂණ අත්නොහැර ලබා ගන්නටද නවීකරණය වූ පරිසරයක් කටයුතු කරන්නටද එපමනක් නොව අපගේ සියලුම අභිප්‍රායන් හා අරමුණු සමස්ථ සාමාජිකත්වයේ අභිවෘර්ධිය සඳහාම යොමු කර ගන්නටද පියවර ගත යුතුය. මේ සඳහා දායක වූ සියලු දෙනා වෙත අප අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රමාණය හා ස්තුතිය පිරිනමමු.

**ස්තුතිය පිරිනැමීම.**

- සමුපකාර ව්‍යාපාර නව මාවතක් ඔස්සේ සංවර්ධනය කරා ගෙන යාමට කටයුතු කරනු ලබන වර්තමාන සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් තරණි කුමාරදාස මැතිනියට

- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලයට
- සමිතියේ ඉදිරි දියුණුව කරා ගෙනයාම සඳහා පසුගිය කාලය තුල වාර්ෂික විගණන කටයුතු සිදු කර දෙමින් හා අවශ්‍ය මගපෙන්වීම්, උපදෙස් හා අනුමැතියන් ලබා දෙමින් කටයුතු කල හිටපු සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් මහත්ම මහත්මීන්ටද,
- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය කොමසාරිස් ජී.ජී. දයාසුමන මහතාට
- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර කොමසාරිස් (විගණන/ඇවර) බී.එම්. බන්දුල මහතාට
- සමිතියේ ප්‍රදානිත ණය මුදල් අවකරණය කොට අයකර ගැනීම සඳහාත් සාමාජිකත්වය හා සමිතිය අතර ගණුදෙනු සාර්ථක කර ගැනීම සඳහාත්, නිරතුරුව අනුග්‍රහය හා සහයෝගය ලබා දෙන මධ්‍යම රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය ආයතන, සියළුම රෝහල්වල හා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ආයතන හා සියළුම රෝහල් වල ප්‍රධාන නිලධාරීන් මහත්ම මහත්මීන්, ගණකාධිකාරී මහත්ම මහත්මීන් පරිපාලන නිලධාරී මහත්ම මහත්මීන් ඇතුළු සෞඛ්‍ය කළමණාකරන සහකාර නිලධාරී මහත්ම මහත්මීන්ට
- සමිතියේ සාමාජික සේවා පරිගණකගත කිරීමේ කාර්යයෙහි මෙන්ම තාක්ෂණික අවශ්‍යතා සඳහා තම දැනුම හා අත්දැකීම් නිබඳව ලබා දෙමින් අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දෙනු ලබන වරලත් ඉංජිනේරු මහාචාර්ය මොරටුව විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ටී.එස්.එස්. ජයවර්ධන මහතාට, වරලත් ගණකාධිකාරී අචාර්ය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ඉසුරු මානවඩු මහතාට හා මොරටුව විශ්ව විද්‍යාලයේ පද්ධති විශ්ලේෂක නඳුන් පෙරේරා මහතාට
- එසේම මෙම කාර්යය සඳහා නිරතුරු සහයෝගය ලබාදුන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු ගණකාධිකාරී එරන්දි සරත්චන්ද්‍ර මහත්මියට, නියෝජ්‍ය කොමසාරිස් චන්දන ෆොන්සේකා මහතාට හා හිටපු සමුපකාර සංවර්ධන නිලධාරී නුවන් විජේසිංහ මහතාට
- සමුපකාර ව්‍යාපාර පිළිබඳ දැනුම හා නෛතිකමය ක්‍රියාවලියන් පිළිබඳ උපදේශකත්වය ලබාදෙමින් නිරන්තර සහයෝගය ලබා දෙනු ලබන ජාතික සමුපකාර මණ්ඩලයේ හිටපු අධ්‍යාපන හා පුහුණු අධ්‍යක්ෂක ඒ.බී. බුලත්ගම මහතාට
- මෙම පාලන කාලය තුල සමිති අධීක්ෂණ නිලධාරිනිය ලෙස කටයුතු කල සමුපකාර සංවර්ධන නිලධාරී කේ.ඩබ්.එස්. රශ්මිනි මහත්මියට, බී.ඒ.එස්. සේනාධීර මහතාට හා වර්තමාන සමිති අධීක්ෂණ නිලධාරී පසිඳු කහඳවල මහතාට
- සමිතිය හා බැඳී නීතිමය කාර්යයන් සඳහා නිරන්තර සහයෝගය ලබා දෙනු ලබන නීතිඥ සී.එච්. ගමගේ මහතාට
- සෞඛ්‍ය සේවයෙන් විශ්‍රාම ගියද සමිතියේ ඉදිරි සංවර්ධනය වෙනුවෙන් මාහැඟි දායකත්වයක් නිරන්තරවම ලබා දෙමින් එදාමෙන් අදත් නොවෙනස්ව අප හා රැඳී සිටින විශ්‍රාමික ප්‍රධාන නිලධාරී මහතුන් ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩල සභික මහත්ම මහත්මීන්ද සංවිධායක හා සාමාජික මහත්ම මහත්මීන්ට
- අප සමිතිය වර්තමාන තත්ත්වයට නගා සිටුවීමට උරදුන් දැනට ජීවිතයෙන් සමුගෙන ඇති සංවිධායක හා සාමාජික මහත්ම මහත්මීන් ඇතුළු සියලුම ක්‍රියාධරයින්ට
- එමෙන්ම අප සමිතියේ සීඝ්‍ර දියුණුව සඳහා සමස්ථ සාමාජිකත්වය හා ආයතනික සංවිධායක මහත්ම මහත්මීන්ට
- DMS Softwear Ingeniyaring pvt ltd ආයතනයේ කළමණාකරු සුසිත් අනුරංග මහතාට හා මෘදුකාංග ඉංජිනේරු ධමිත ලක්මාල් මහතාට
- Sumathi ඉන්ෆොර්මේෂන් ආයතනයේ නිලධාරී මහත්ම මහත්මීන්ට
- චිත්‍ර කලා ආචාර්ය එන්.එස්.එස්.බී. රත්නායක, ආර්.අයි. උපසේන, ඊ.එම්.යූ.කේ. සෝමරතන යන ගුරු භවතුන්ට
- සමිතියේ ඉදිරි සංවර්ධන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා නිබඳවම ශක්තියක් වෙමින් මා හා සහෝදරත්වයෙන් බැඳී සිටින ප්‍රධාන නිලධාරී මහත්ම මහත්මීන් ඇතුළු සමස්ථ අධ්‍යක්ෂක මණ්ඩලයේ සියළුම මහත්ම මහත්මීන්ට
- මහජන බැංකුව මරදාන ශාඛාවේ කළමණාකාරතුමිය ඇතුළු එම කාර්ය මණ්ඩලයට
- ලංකා බැංකුව මරදාන ශාඛාවේ කළමනාකාරතුමිය ඇතුළු එම කාර්ය මණ්ඩලයට
- සමිතියේ සියලු කටයුතු සඳහා සහයෝගය ලබාදුන් සියළුම සාමාජිකත්වයට
- ඉදිරි සංවර්ධන කටයුතු වෙනුවෙන් ගන්නා වූ ක්‍රියාමාර්ගයන් මනා කළමනාකාරිත්වයක් ඔස්සේ ක්‍රියාත්මක කරමින් ඉලක්කගත අරමුණු කරා ගමන් කිරීම සඳහා වන දැවැන්ත කාර්යභාරයක් වෙනුවෙන් නිරතුරුවම උරදුන් සාමාන්‍යාධිකාරී මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළුම දෙනාට
- එසේම මෙම සංවර්ධනාත්මක ගමන් මග තුල දායකත්වය ලබාදුන් හිටපු කාර්ය මණ්ඩල ප්‍රධානින් ඇතුළු හිටපු කාර්ය මණ්ඩලයට
- සුහදශීලි සේවාවක් සපයනු ලබන කතරගම සුවසෙවන නිවාඩු නිකේතනයේ කළමනාකාර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට
- 61 වන සංවත්සර මහසභා වාර්තා පොත් මුද්‍රණය ඇතුළු අනෙකුත් මුද්‍රණ කටයුතු නිසි වේලාවට නිමකර දෙනු ලබන සසෙත් මුද්‍රණාලයේ කළමනාකාර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට.

ස්තුතියි ......

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි,
ඩබ්ලිව්.ඒ.ඩී. විමලරත්න
ලේකම්
සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය
37/36, පන්සල පාර, කොළඹ 10.
2026.03.04 දිනදීය

සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමිතිය

2023/01/01සිට 2023/12/31 දක්වා
මූල්‍ය ප්‍රකාශන මත විගණකවරයාගේ වාර්තාව

**1. යොමු කිරීම**

සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් මඟින් සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමිතියේ සාමාජිකයන් වෙත.

**2. අධිකාරිය**

සමුපකාර සංවර්ධන කොමසාරිස් එච්.ජී. ආශා හපුආරච්චි විසින් ඇයගේ අංක ස.සං.දෙ /වි/01/07 (i) හා 2024/08/21 දිනැති ලිපියෙන් සමුපකාර පනතේ 44(1) වගන්තිය යටතේ මා වෙත බලය පවරා කරන ලද විධිවිධානයට අනුව මා විසින් වාර්තාවේ පිටු අංක 25 සිට පිටු අංක 48 දක්වා ඇති සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමිතියේ 2023/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය හා එම දිනෙන් අවසන් වසර සඳහා වූ ඊට සම්බන්ධිත විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට කරන ලද සටහන් හා ගිණුම් ප්‍රතිපත්ති සමග විගණනය කරන ලදී.

**3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව හා සමුපකාර නීතියේ සඳහන් නියමයන්ට යටත්ව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. ඒ යටතේ,

- යෝග්‍ය වූත් ප්‍රමාණවත් වූත් ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා නඩත්තු කිරීම.
- වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
- සත්‍ය වූත් සාධාරණ වූත් ආකාරයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලනයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.
- යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම හා යොදා ගැනීම.
- අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීම.
- සමුපකාර සමිතිය අඛණ්ඩ පැවැත්මකින් යුතුව පවත්වාගෙන යාම.
- මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති සියළු වත්කම් සමිතිය සතුව තිබිය යුතු අතර ඒවා පාවිච්චි කළ හැකි අය කර ගත හැකි ගුණාත්මක භාවයකින් යුතු වත්කම් වීම.

යන සමස්ත ක්‍රියාවලියේ වගකීම කළමනාකරණ මණ්ඩලය සතු වේ.

**4. විගණකගේ වගකීම**

විගණක ලෙස මා වෙත පැවරී ඇති වගකීම වනුයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව හා සමුපකාර නීතියේ සඳහන් නියමයන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට වාර්තා කිරීමත්, සමිතියේ කටයුතු හා පරිපාලනය සමුපකාර නීතියට අනුව සිදු කර ඇති බව වාර්තා කිරීමත්, මූල්‍ය ප්‍රකාශන මඟින් සත්‍ය හා සාධාරණ තත්වයක් ප්‍රකාශ වේදැයි යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමත් වේ.

**5. විෂයපථය**

මෙම විගණනය සිදු කරනු ලැබුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ට අනුකූලව හා සමුපකාර නීතියේ විගණනය සම්බන්ධයෙන් කර ඇති නියමයන්ට අනුකූලව අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටි පිළිබඳ තහවුරුවක් සඳහා අදාල සාක්ෂි පරීක්ෂා කර බැලීම මාගේ විෂය පථයට ඇතුළත් වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් හා කරුණු සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සෝදිසි කිරීමේ පදනම මත (නියැදි තහවුරු පරීක්ෂා කිරීම මත) ඉතා සාධාරණව සිදු කර ඇත. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් සිදු කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීමද, සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමද, ඇගයීමද මෙම විගණනයට ඇතුළත් වේ.මාගේ වෘත්තීය පරිචය හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී.

**6. විගණන මතය**

විගණන පරීක්ෂණ වලට අනුව සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමිතිය විසින් නියමිත ගිණුම් පොත්පත් පවත්වාගෙන යාමේදී මා වෙත ඉදිරිපත් වූ තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් පොත්පත් අතර එකඟතාවයක් ඇති බවද 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ නියමිතව ඇති තොරතුරු ප්‍රතිපාදනය වී ඇති බවද 2023/12/31 දිනට සමිති තත්වය පිළිබඳව හා එදිනෙන් අවසන් මෙහෙයුම් වසර සඳහා මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය පිළිබඳ මාගේ මතය අනුව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බවත් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මාගේ මතය වේ.

.........................................................................

ජී.එච්.ජී. විජේසිංහ මිය - විගණක
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.
2025/09/08

ව්‍යාපාර විශ්ලේෂණය

ආදායම් ප්‍රකාශය විශ්ලේෂණය(රු මිලියන)

| විස්තරය | 2023 | 2022 | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පොළී ආදායම | 893 | 757 | 136 | 17.96% |
| පොළී වියදම | 498 | 400 | 98 | 24.5% |
| ශුද්ධ පොළී ආදායම | 395 | 357 | 38 | 10.6% |
| වෙනත් ආදායම් | 29 | 10 | 19 | 190% |
| පිරිස් පිරිවැය | 101 | 101 | - | - |
| පරිපාලන පිරිවැය | 136 | 88 | 48 | 54.54% |
| අධ්‍යක්ෂක මණ්ඩල වියදම් | 4 | 3 | 1 | 33.33% |
| මූල්‍ය පිරිවැය | 33 | 3 | 30 | 1000% |
| ක්ෂය | 7 | 6 | 1 | 33.33% |
| බොල් හා අඩමාන ණය | 47 | 39 | 8 | 20.51% |
| ශුද්ධ ලාභය | 94 | 127 | (33) | (25.98%) |

සමිතියේ  පොළී ආදායම 17.96% න් වර්ධනය වී ඇති අතර පොළී වියදම 24.5% න් ඉහළ ගොස් ඇත. පොළී ආදායම වර්ධනය සඳහා සාමාජික අතුරු ව්‍යවස්ථා ණය පොළී ආදායමෙහි 53.33% වර්ධනය,සිසු දිරිය පොත් ණය පොළී ආදායමෙහි 77.77% වර්ධනය හේතු වී ඇත.සමිතිය විසින් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබූ මුදල්වලින් යම් කොටසක් ඉන් ඉවත් කර සාමාජික ණය ලෙස ලබා දීමට ගත් ප්‍රතිපත්තිමය තීරණය මත ස්ථාවර තැන්පත් ඉවත් කර ගැනීම හේතුවෙන් එම පොළී ආදායම 55.89%න් අඩු වී ඇති අතර මූල්‍ය වෙළඳපළ පොළී ආදායමද 77.77%න් අඩු වී ඇත.

පොළී වියදම ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් අන්‍යෝන්‍යාධාර අරමුදලට අදාල පොළී වියදම 14.01% වර්ධනය, විශ්‍රාමාධාර අරමුදලට අදාල පොළී වියදම 11.76% න් වර්ධනය,අවමංගල්‍යාධාර අරමුදලට අදාල පොළී වියදම් 14.65% න් වර්ධනය හේතු වී ඇත. ආයෝජන  ආදායම තුළ  පවතින සෙසෙත් මුද්‍රණාල ලාභයද  75%න් අවප්‍රමාණ වී ඇත.සුවසෙවණ නිවාඩු නිකේතනයේ අලාභය 33.33% න් ඉහළ යාම  සඳහා ප්‍රධාන වශයෙන් එහි කාමර ගාස්තු ආදායම 33.33% න් හා ආහාර විකුණුම් ආදායම 33.33%න් ඉහළ යාම හරහා මෙහෙයුම් ආදායම  28.57% න් වර්ධනය වීම හේතු වී ඇත.ස්ථිර සේවක වැටුප්  හා  ස්ථිර සේවක දිමනා 16.66% න් ඉහළ ගොස් ඇත.කාර්යාල වියදම් හා නඩත්තු අළුත්වැඩියා වියදම් 128.57% න් වැඩි වී ඇත.ග්‍රොසරි අලාභය ද 45.94%  න් වැඩි වී ඇත.

පරිපාලන පිරිවැය 57.47%න් ඉහළ යාම තුළ විදුලි ගාස්තු 100% න් දුරකථන ගාස්තු හා අන්තර්ජාල පහසුකම් 566.%න් කාර්යාල වියදම් 110% න් ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ වියදම් 150% න්  සාමාජික ප්‍රවර්ධන හා දැනුවත් කිරීම් 333.33% න් සංවත්සර මහ සභා වියදම් 400% න් ආරක්ෂක සේවා වැටුප් 100%න් වර්ධනය වීම මෙන්ම හේතු වී ඇත.2024 සිට සමිතියේ ගිණුම් කටයුතු සියල්ල පරිගණකගත කිරීමට අවශ්‍ය තාක්ෂණික හා නඩත්තු කටයුතු වෙනුවෙන් කටයුතු කිරීමත් මහ සභා රැස්වීම් 2ක් පැවැත්වීමත් මෙසේ පිරිවැය ඉහළ යාමට මූලික වී ඇත.

මූලික පිරිවැය තුළ සමුපකාර රක්ෂණ සමාගමේ කොටස් අලාභය ගළපා තිබීම හේතුවෙන් එහි අගය 1126%න් වර්ධනය වී ඇත.

ආදායම් තත්වයට වඩා  වියදම් තත්වය මෙසේ වර්ධනය වීම හේතුවෙන් ශුද්ධ ලාභය 25.98% න් අඩු වීමක් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය වේ.

මූල්‍ය තත්ව විශ්ලේෂණය (රු මිලියන)

| විස්තරය | 2023 | 2022 | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ | 68 | 1032 | (964) | (93.41%) |
| ආයෝජන | 331 | 332 | (1) | (33.33%) |
| ශුද්ධ ණය ආයෝජන | 7171 | 5574 | 1597 | 28.65% |
| ඉතිරි තොගය | 75 | 13 | 62 | 476% |
| වෙනත් වත්කම් | 259 | 234 | 25 | 10.68% |
| දේපළ පිරියත හා උපකරණ | 114 | 114 | - | - |
| මුළු වත්කම් | 8018 | 7301 | 717 | 9.8% |
| සාමාජික තැන්පත් | 2294 | 2061 | 233 | 11.30% |
| වෙනත් වගකීම් | 149 | 242 | 93 | 38.42% |
| සාමාජික අරමුදල් | 3742 | 3367 | 375 | 11.13% |
| මුළු වගකීම් | 6233 | 5717 | 516 | 9.02% |
| කොටස් ප්‍රාග්ධනය | 1150 | 979 | 171 | 17.46% |
| අරමුදල් | 37 | 30 | 7 | 23.33% |
| ඉතිරි ලාභය | 359 | 359 | - | - |
| මුළු හිමිකම් | 1785 | 1584 | 201 | 12.68% |

මුදල් හා මුදල් සමාන දෑ තුළ පෙර වර්ෂයට සාපේක්ෂව 93.41% ක පහළ යෑමට හේතු වී ඇත්තේ මූල්‍ය වෙළඳපළ ගිණුම 84% පමණ ප්‍රමාණයකින් අවප්‍රමාණ වීම හා මහජන බැංකුව මරදාන ස්ථාවර තැන්පත් ශේෂය පෙර වසරට සාපේක්ෂව 94% න් අඩු වීම මත වේ.ආයෝජන අගය අඩු වීම සඳහා මහජන බැංකුව හා ලංකා බැංකුව ස්ථාවර තැන්පත් අගය අඩු වීමත් සමුපකාර රක්ෂණ සමාගමේ කොටස් ආයෝජන අගය අඩු වීමත් හේතු වී ඇත.

ශුද්ධ ණය ආයෝජන කළඹ විශ්ලේෂණය කිරීමේදී සාමාජික අතුරු ව්‍යවස්ථා 20 ණය 25% න් පමණ ඉහළ යාම, සාමාජික භාණ්ඩ ණය 30%න් ඉහළ යාම,කාර්ය මණ්ඩල ණය 18.75% න් පහළ යාම,කාර්ය මණ්ඩල විශේෂිත ණය 9%න් අඩු වීම වැනි විචලතාවයන් තුළ සමස්ත ණය ශේෂයේ වර්ධනය 28.65% වී ඇත.

පාසැල් පොත් ඉතිරි තොගය 3,200% න් පමණ පෙර වසරට සාපේක්ෂව වර්ෂය අවසානයේ ඉතිරි වී ඇත.පාසල් පොත් වල මිල ඉහළ යාමෙන් සාමාජික ඉල්ලුම අඩු වීම මත මෙම තත්වය උද්ගත වී ඇත.

වෙනත් වත්කම් තුළ සාමාජික ලැබිය යුතු අවකරණ 21.48% න් ඉහළ යෑම මත 10.68% වර්ධනයක් පෙන්වයි.

සාමාජික තැන්පත් අයිතම සියල්ලේම සාපේක්ෂ වශයෙන් සුළු වර්ධනයන් මත සාමාජික තැන්පත් වල සමස්ත වශයෙන් 11.30% න් වර්ධනයක් ඇත.

වෙනත් වගකීම් තුළ අවිනිශ්චිත අවකරණවල 25% වර්ධනයක් පෙන්වන අතර හඳුනා නොගත් ඍජු තැන්පත් වල 11.66% වර්ධනයක් පැවතියද සමස්ත වශයෙන් වෙනත් වගකීම් වල 38.42% ක අඩු වීමක් පවතී. 2022 වර්ෂයේ පැවති මිලියන 121 බැංකු අයිරාව මේ වන විට අවසන් වීම මීට බලපා ඇත.

කොටස් ප්‍රාග්ධනයේ වර්ධනය 17.3% කි.

සමස්තයක් ලෙස ගත් විටමෙම වර්ෂය තුළ මුළු වත්කම් 9.8% වර්ධනයක්ද මුළු හිමිකම් වල 12.68% වර්ධනයක්ද මුළු වගකීම් වල 9.02% වර්ධනයක්ද ඇත.

**අභ්‍යන්තර පාලනය**

**1. ගිණුම්කරණ පද්ධතිය**

සමිතියේ පුද්ගලික ලෙජර් යාවත්කාලින කිරීම හා අවසන් ගිණුම් සකස් කිරීම අත්හුරු ක්‍රමයට සිදු වේ. අභ්‍යන්තර විගණන අංශය විසින් මාසිකව අධ්‍යක්ෂක මණ්ඩලයට අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කරයි. ජර්නල් සටහන් පැනවීම හා අත්තිකාරම් සම්බන්ධව පවතින අභ්‍යන්තර පාලන පටිපාටි ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. ජර්නල් සටහන් සම්බන්ධව පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම නිවැරදි ව සිදු ව ඇත්දැයි අනුමැතිය ලබා දීමේදී විශේෂයෙන් අවධානය යොමු විය යුතු වේ. විගණනය සිදු කරන කාලසීමාව වන විට ගිණුම් පිළියෙල කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් භාවිතා කිරීම සිදු වෙමින් පවතී.

**2. මුදල් හා ජංගම ගිණුම්**

සියළු ගනුදෙනු චෙක්පත් මඟින් සිදු වේ.සමිතියේ දෛනික කටයුතු සඳහා සුළු මුදල් හරහා ද වියදම් සිදු කරයි.ප්‍රධාන කාර්යාලය,මුද්‍රණාලය හා නිවාඩු නිකේතනය වෙනුවෙන් වෙන වෙනම සුළු මුදල් හා සුළු මුදල් වවුචර් භාවිතා වේ. මාසිකව මුදල් සාරාංශ හා බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කරයි. ලැබීම් හා ගෙවීම් මුදල් පොත් ද ප්‍රධාන කාර්යාලය, මුද්‍රණාලය හා නිවාඩු නිකේතනය සඳහා වෙන් වශයෙන් පවත්වාගෙන යනු ලබයි. කතරගම නිවාඩු නිකේතනය, මුද්‍රණාලය හා ප්‍රධාන කාර්යාලය සඳහා වෙන වෙනමම ජංගම ගිණුම් පවත්වාගෙන යනු ලැබේ.

**3. ආයෝජන**

සමිතියේ ස්ථාවර තැන්පත් මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලැබේ සමුපකාර රක්ෂණ සමාගමේ සිදු කර ඇති ආයෝජනයන් සම්බන්ධව ශේෂ සනාථන ලබාගැනීමට කටයුතු කළ යුතු අතර ආයෝජනයන් සම්බන්ධව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කිරිමට අධ්‍යක්ෂක මණ්ඩල අවධානය යොමු විය යුතුය.

**4. සාමාජික ණය**

සාමාජික ලෙජර් යාවත්කාලීන කිරිම අත්හුරු ක්‍රමයට සිදු වේ.එහෙත් පුද්ගලික ලෙජර් හා උපලේඛන අතර විශාල වශයෙන් සංඛ්‍යාත්මක වෙනස්වීම් පවති. හඳුනා නොගත් ඍජු තැන්පත් ශේෂයද රු මිලියන 67 ට ආසන්න වේ. සාමාජික ණය නිකුත් කිරීම හා ණය ගෙවීම් නිවැරදිව හඳුනා ගැනීම පුද්ගලික ලෙජර්වලට ඇතුළත් කිරිම සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක විය යුතු වේ.

**5. කල්පසු ණය**

සමිතියේ කල්පසු ණය ලේඛණය සකස් කිරීමේදී සාමාජික ණය පිලිබඳ මෙන්ම සේවක ණය සම්බන්ධවද අවධානය යොමු කළ යුතුය.සමිතියේ පරිගණක පද්ධතිය හරහා මෙම ලේඛණය ලබා ගැනීමට හැකි වන පරිදි කටයුතු කළ යුතුය.

**6. තැන්පත්**

සමිතියේ තැන්පත් ප්‍රධාන වශයෙන් ස්ථාවර, ඉතුරුම්, විශේෂ හා ළමා ඉතුරුම් ලෙස වර්ග කර ඇත.මෙම තැන්පත් සඳහා පොළී ගණනය අධ්‍යක්ෂක මණ්ඩල තීරණ හරහා සිදු වේ.

**7. ස්ථාවර වත්කම්**

ස්ථාවර වත්කම් සම්බන්ධව ප්‍රධාන කාර්යාලය,මුද්‍රණාලය හා නිවාඩු නිකේතනය වෙනුවෙන් වෙන වෙනමම ස්ථාවර වත්කම් ලේඛණ පවත්වාගෙන යා යුතු වේ. ඒ සඳහා භාරකාරිත්වය දරන්නන් පත් කර අවශ්‍යතාවය පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතු වේ.

**8. ආදායම් වියදම්**

අයවැය ඇස්තමේන්තුවට අනුකූලව සමිතියේ වියදම් දැරීමටත්, පූර්ව ඇස්තමේන්තු සකස් කරමින් අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි අත්තිකාරම් ලබාගෙන කටයුතු කිරීමටත් ඒ ඒ වියදම් සම්බන්ධව පරීක්ෂා කිරීම් හා අනුමත කිරීම් සඳහා නිසි අධිකාරිය හා වගකීම පැවරීමටත් එම කටයුතු අධීක්ෂණයත් සිදු කළ යුතු වේ.

**9. සේවක පාලනය**

සේවක පරිපාලන කටයුතු සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන විධිවිධාන හා උපදෙස් අනුගමනය කළ යුතු වේ.

**10. නිවාඩු නිකේතනය**

කතරගම නිවාඩු නිකේතනයේ සියළුම කටයුතු ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රධාන කාර්යාලයේ සිට අධීක්ෂණය කිරීමට හැකි වන ලෙස සුදුසු පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතු වේ.

**විගණක විශේෂයෙන් සඳහන් කරන කරුණු**

(1) සිසු දිරිය පාසල් පොත් ව්‍යාපෘතිය සම්බන්ධ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීම.

විගණන වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇති පාසල් පොත් ඉතිරි තොග වටිනාකම තුළ පාසල් පොත්, උපකරණ හා පාසල් බෑග් යන සියල්ලෙහිම ඉතිරි තොග වටිනාකම් අන්තර්ගත වී ඇත.පෙර වසරවල මෙම අයිතම තොග වටිනාකම වෙන වෙනමම දක්වා තිබුනද මෙම වර්ෂයේ එසේ සිදු කිරීම හේතුවෙන් පාසල් පොත්, උපකරණ හා පාසල් බෑග් යන අයිතම වල ඉතිරි තොග වටිනාකම් වෙන වෙනම හඳුනාගත නොහැකි විය. වසරක් පාසා සිදු කරන මෙවැනි ව්‍යාපෘතියක වර්ෂ අවසාන ඉතිරි තොගය අයිතම වශයෙන් වෙන් වෙන්ව දැක්වීම තුළ එකී අයිතම නැවත ඇණවුම් කිරීම පහසු වන අතර අනවශ්‍ය ලෙස තොග ගබඩා කිරීම, අනවශ්‍ය ලෙස ප්‍රවාහන හා සේවක වියදම් දැරීම වැළකේ. එහෙයින් ඉදිරියේදී මෙම අයිතම තොග වටිනාකම වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීම සුදුසු බව පෙන්වා දෙමි.

සිසුදිරිය පොත් ව්‍යාපෘතිය සඳහා සහභාගී වූ ප්‍රධාන කාර්යාලීය සේවකයන්ට දීමනා ගෙවීමට සුදුසු නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව පෙන්වා දෙමි.එහිදී ලබා දෙන අත්තිකාරම් සීමාව ආදිය පිළිබඳවද සැළකිලිමත් විය යුතු වේ.

සමස්ත වශයෙන් ගත්කල මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වන හෙයින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව අභ්‍යන්තර පාලන විධිවිධාන, කොන්දේසි හා උපදෙස් කාරක නියෝග මාලාවට ඇතුළත් කිරීම වඩාත් සුදුසු බව පෙන්වා දෙමි.

(2) සමුපකාර රක්ෂණ සමාගමේ ආයෝජන

විගණන වර්ෂය තුළදී සමුපකාර රක්ෂණ සමාගමේ ආයෝජනය කර තිබූ කොටස්වල ඒකක මිල පහළ යාම නිසා ඇතිවූ අලාභය සමිතියේ මූල්‍ය පිරිවැය තුළ දක්වා ඇත. මීට අමතරව එම සමාගමේ ආයෝජනය කර ඇති වරණීය කොටස් සම්බන්ධව ශේෂ සනාථන ලේඛණ ඉදිරිපත් කරන ලෙස පෙර විගණන වාර්තා වල දිගින් දිගටම පෙන්වා දී තිබුනද ඒ සම්බන්ධව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව පෙනේ. වරණීය කොටස් සම්බන්ධව නිශ්චිත සනාථ කිරීමකින් තොරව සමිති මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු වරණීය කොටස් ලාභාංශ ලෙසද වටිනාකමක් නිරූපණය කරයි.

මේවන විට කොටස් වෙළඳපළ ලියාපදිංචි සමාගම් හරහා අදාල ශේෂ සනාථන ලේඛණ ලබා ගැනීමට හැකියාවක් ඇති බැවින් ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවද පෙන්වා දෙමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව ආයතනයක් තුළ සිදු වන ගනුදෙනු හා සිද්ධීන් සම්බන්ධයෙන් අදාලවන නිශ්චිත ගිණුම්කරණ ප්‍රමිත එම ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය විසින් නිශ්චිතව හඳුනාගනිමින් එම ප්‍රමිත අනුගමනය කරමින් ගිණුම් ප්‍රතිපත්තීන් තීරණය කළ යුතු වේ.තවද ආයතනයේ ගනුදෙනු හා සිද්ධීන් සම්බන්ධයෙන් අදාල කර ගත හැකි නිශ්චිත ගිණුම්කරණ ප්‍රමිතීන් හඳුනා ගත නොහැකි අවස්ථාවකදී ඉහළ කළමනාකාරිත්වය විසින් ආයතනයට උචිත ප්‍රතිපත්ති මාලාවක් සකස් කරගත යුතු වේ. ඒ අනුව සමිතිය විසින් මිලදී ගෙන ඇති විකුණුම් සඳහා ඇති මූල්‍ය වත්කම් වල සාධාරණ අගය නැවත මැනීමේදී ඇති වන ලාභ අලාභ තත්වයන් ගිණුම් තැබීම සම්බන්ධයෙන් සමිතියට උචිත ගිණුම්කරණ ප්‍රතිපත්ති මාලාවක් නිශ්චය කර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල අවධානය යොමු කරවන්නෙමි.

ආයෝජන ගිණුම් තැබීම සම්බන්ධව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විගණන වාර්තා ආකෘතිය තුළද මග පෙන්වීම් සිදු කර ඇත.ඊට අමතරව දෙපාර්තමේන්තුවේ බැංකු නියාමන ඒකකය විසින් වරින් වර නිකුත් කරන උපදෙස් හා චක්‍රලේඛ අනුවද කටයුතු කළ යුතු බව පෙන්වා දෙමි.

(3) භෞතිකව ස්ථාවර වත්කම් සත්‍යාපනය නොකිරීම.

සමිති ප්‍රධාන කාර්යාලයේ, නිවාඩු නිකේතනයේ හා මුද්‍රණාලයේ ස්ථාවර වත්කම් හා වර්ෂ අවසාන තොගය භෞතිකව සත්‍යාපනය කිරීම සිදු කළ යුතු බව පෙන්වා දෙමි. ඒ අනුව වෙන වෙනම ස්ථාවර වත්කම් ලේඛණද පවත්වාගෙන යා යුතු බව පෙන්වා දෙමි. වත්කම මිල දී ගත් දිනය, වටිනාකම, කේත අංකය, ක්ෂය ප්‍රතිශතය, වත්කම් භාරකාරිත්වය දරන්නාගේ නම ආදිය ඇතුළත් කරමින් මෙම ලේඛණය සකස් කළ යුතුය.

(4) ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයට ස්ථිර සේවකයන් ඇතුළත් කර ගැනීම.

සමිතියේ සාමාජිකයන්ට අමතරව සමිතියේ ස්ථිර කාර්ය මණ්ඩල සේවකයන්ගේ දරුවන් සඳහා ද ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදු වේ. ශිෂ්‍යත්ව අරමුදල සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම පිළිබඳව කරුණු හා කොන්දේසි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සම්බන්ධ කාරක නියෝග මාලාවට ඇතුළත් කළ යුතුය.

(5) පවතින සම්පත් ඌන උපයෝජනය

සමිතිය විසින් 2012 වර්ෂයේදී 64 ගොඩනැගිල්ල මිල දී ගෙන ඇත්තේ සසෙත් මුද්‍රණාලය එහි ස්ථාපිත කිරීමට වුවද මේ වනතෙක් එකී අපේක්ෂිත අරමුණ ඉටු කරගෙන නොමැති අතර සසෙත් මුද්‍රණාලය වෙනුවෙන් මාසික කුලියක් සී/ස ශ්‍රී ලංකා පොල් සංගමයට ද ගෙවනු ලැබේ.

2023/10/20 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී 37/6 ලිපිනයේ පැවති ගොඩනැගිල්ලද ගබඩා කටයුතු සඳහා මසකට රු 110,000/- බැගින් මාස 6 කාල සීමාවක් සඳහා ලබාගෙන ඇත.

ඊට අමතරව 64 ගොඩනැගිල්ල වෙනුවෙන්ද විදුලිය හා ජල වියදම් දරමින් නඩත්තු කිරීම තුළින් කාරක සභාව තම කාර්යය හා යුතුකම් බුද්ධිමත්ව ඉටු කර නොමැති බව පෙන්වා දෙමි.

(6) සේවක ඇප තැන්පත් ස්ථාවර තැන්පතු වල යෙදවීම.

සේවක ඇප තැන්පත් ස්ථාවර තැන්පතු වල යෙදවිය යුතු බව සමුපකාර ආයතන සංග්‍රහයේ 1.11.1 හි දක්වා ඇත. සමිතිය 2024 වර්ෂයේ සිට ඒ අනුව කටයුතු කිරීම යහපත් ප්‍රවණතාවයක් බව පෙන්වා දෙමි.

(7) භාණ්ඩ ණය සඳහා ගිවිසුම් සුදුසු ලෙස යාවත්කාලීන කිරීම.

